# වාර්ෂික වාර්තාව

# 2017

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව

| පටුන | පිටු අංකය |
|---|---|


| | |
|---|---|
| සභාපතිතුමාගේ පණිවුඩය | 01-03 |
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | 04-07 |
| දැක්ම හා මෙහෙවර | 08 |
| හැඳින්වීම | 09-10 |
| කළමනාකරණ මණ්ඩලය | 10-11 |
| විධායක සාරාංශය | 12-14 |
| ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව පිහිටුවීම | 15 |
| විගණන හා කළමනාකරණ කමිටු සමාලෝචනය 2017 | 15-17 |
| ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ කාර්යයන් | 17-19 |
| ජාත්‍යන්තර සම්මුතින් හා ප්‍රඥප්ති ක්‍රියාත්මක කිරීම | 19-20 |
| බලය දීම ( බලපත්‍ර හා අනුමැතීන් ) | 20-28 |
| න්‍යෂ්ටික හා වෙනත් විකිරණශීලී ද්‍රව්‍ය පිළිබඳ සුරක්ෂිතතාව | 28-31 |
| විකිරණශීලී අපද්‍රව්‍ය කළමනාකරණය හා විකිරණශීලී ද්‍රව්‍ය ප්‍රවාහනය | 31-33 |
| හදිසි ප්‍රතිචාර | 33-36 |
| මානව සම්පත් සංවර්ධනය | 37-44 |
| ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ මූල්‍ය ප්‍රකාශන - 2017 | 45-74 |
| විගණකාධිපති වාර්තාව | 75-83 |
| විගණකාධිපති වාර්තාව පිළිබඳ අදහස් දැක්වීම | 84-107 |

## සභාපතිතුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ (සභාව) තෙවන වසරට එළඹී මෙම අවස්ථාවේ මෙම පණිවුඩය නිකුත් කිරීමට ලැබීම මහත් භාග්‍යයකි. විකිරණ ආරක්ෂාව හා න්‍යෂ්ටික සුරක්ෂිතතාව පිළිබඳ නියාමන යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය රෙගුලාසි හා රීති කෙටුම්පත් කිරීම ආරම්භ කරන ලද වර්ෂය ලෙස 2017 වර්ෂය සභාවට ඉතා වැදගත් වසරක් විය.

සභාව සමාලෝචිත වර්ෂය තුළදී "අයනීකරණ විකිරණ ආරක්ෂාව හා විකිරණ ප්‍රභවයන් පිළිබඳ ප්‍රවේසම පිළිබඳ රෙගුලාසි " හා "නිෂ්පාදනයේදී, භාවිතයේදී, ගබඩා කිරීමේදී හා ප්‍රවාහනයේදී විකිරණශීලී ප්‍රභවයන් පිළිබඳ සුරක්ෂිතතාව සඳහා  රෙගුලාසි" යනුවෙන් රෙගුලාසි 2 ක් කෙටුම්පත් කරන ලදි. අදාළ පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව විකිරණ සේවකයන් පිළිබඳ සුදුසුකම් සඳහා නිර්නායක පිළිබඳ රීතියක් ද සභාව විසින් කෙටුම්පත් කරන ලදි.

2014 අංක 40 දරන පරමාණුක බලශක්ති පනත යටතේ මහාධිකරණයක ඇසිය යුතු ශ්‍රී ලංකාවේ ඕනෑම අධිකරණ කලාපයක සිදුකරන ලද වැරදි සම්බන්ධයෙන් සියලු නඩු පැවරීම්, ඉදිරියට ගෙනයාම හෝ යන කරුණු සඳහා මහාධිකරණය ලෙස කොළඹ අධිකරණ කලාපයේ ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය නම් කිරීමට අධිකරණ අමාත්‍යාංශයේ හා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව නියෝගයක් පිළියෙල කිරීමට හා රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට සභාවට හැකි විය.

විද්‍යාත්මක හා පරිපාලනමය කාර්යයන් සඳහා පුහුණු හා ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් නොමැතිව නව නියාමන අධිකාරියට කාර්යක්ෂමව කටයුතු කළ නොහැකි බව වැටහී යාම නිසා සභාවේ කළමනාකරණ මණ්ඩලය විසින් බඳවා ගැනීම් හා මානව සම්පත් සංවර්ධනය සඳහා මෙම වසරේදී ප්‍රමුඛත්වයක් ලබාදෙන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස 2016 වර්ෂයේදී බඳවා ගන්නා ලද නව විද්‍යාත්මක නිලධාරීන් 6 දෙනෙකුට පුහුණු විද්‍යාත්මක නිලධාරින්ගේ මඟපෙන්වීම යටතේ විශේෂයෙන් බලපත්‍රදීම හා පරීක්ෂා කිරීම් පිළිබඳ කාර්ය පුහුණුව ලබාදීමට සභාවට හැකි විය. 2017 වර්ෂයේදී කළමනාකරණ සහකාරවරුන් 8 දෙනෙකු බඳවා ගැනීම සඳහා සියලු ක්‍රියාමාර්ග ගන්නා ලද අතර 2018 මාර්තු මාසයේදී බඳවා ගනු ඇත. බලපත්‍රදීම, පරීක්ෂා කිරීම්, විකිරණ ආරක්ෂාව, ආනයන / අපනයන පාලනය , ප්‍රවාහන ප්‍රවේසම හා අප ද්‍රව්‍ය ප්‍රවේසම පිළිබඳ පුහුණුව ලබාදීම සඳහා විද්‍යාත්මක කාර්ය මණ්ඩලයට විදේශ පුහුණු අවස්ථා රාශියක්ද ලබාදෙන ලදි. ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය (IAEA) විසින් මැලේසියාවේ පවත්වන ලද විකිරණ ආරක්ෂාව පිළිබඳ මාස 6 ක පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා විද්‍යාත්මක නිලධාරියෙකුට අවස්ථාවක් ලබාදෙන ලදි. මෙම පාඨමාලාවට සහභාගීවීමෙන් ඔහු ලබාගත් දැනුම හා පළපුරුද්ද සභාවේ නියාමන කාර්යයන් සංවර්ධනය සඳහා අතිශයින්ම වාසිදායක වනු ඇත.

ශ්‍රී ලංකාව 1957 වර්ෂයේ සිට ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ (IAEA) සාමාජික රටක් වන අතර එම ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ සාමාජික රටක් වීමෙන් පසු න්‍යෂ්ටික ප්‍රවේසම හා සුරක්ෂිතතාව පිළිබඳ ජාත්‍යන්තර සම්මුතීන්, ප්‍රඥප්ති හා ගිවිසුම් සඳහා පාර්ශ්වකරුවකු බවට පත් විය. පනතේ 12(ඉ) වගන්තිය අනුව සභාව ඉහත සම්මුතීන් හා ප්‍රඥප්ති පිළිබඳ ශ්‍රී ලංකාවේ වගකීම් සම්පූර්ණ කිරීම සඳහා වගකිව යුතු වේ.

න්‍යෂ්ටික ආයුධ පැතිරීම වැලැක්වීම පිළිබඳ සම්මුතිය හා ඉහත සම්මුතිය යටතේ අත්සන් කරන ලද ආරක්ෂණය සැලසීමේ ගිවිසුම සඳහා ශ්‍රී ලංකාව පාර්ශ්වයක් වන බැවින් ලෝක සාමය වැඩි දියුණු කිරීම සඳහා ආරක්ෂණය සැලසීම තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ආරක්ෂණ සැලසීමේ ගිවිසුමට අතිරේක වර්යා සම්මුතීන් අත්සන් කිරීම සඳහා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය විසින් ශ්‍රී ලංකාවෙන් ඉල්ලීම් කරන ලදී.

අතිරේක වර්යා සම්මුතීන් අත්සන් කිරීමේ වැදගත්කම සලකා බැලීමට ජාත්‍යන්තර කටයුතු හා නෛතික උපදෙස් සඳහා වගකීම් දරන රාජ්‍ය ආයතන 2 ක වන විදේශ කටයුතු අමාත්‍යාංශය හා නීතිපති දෙපාර්තමේන්තුවේ අදහස් ලබා ගැනීම සඳහා එම ආයතන වල නිලධාරීන් සමඟ සභාවේ නිලධාරීන් රැස්වීම් කිහිපයක් පවත්වන ලදී. මෙම සාකච්ඡා වලදී, අතිරේක වර්යා සම්මුතීන් අනුගමනය කිරීම සඳහා දැනට පවත්නා ආධාරක නීති ඇගයීමේදී විදේශ කටයුතු අමාත්‍යාංශයට සභාවේ සහාය ලබාදී තිබූ අතර ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතට අදාළව හා න්‍යෂ්ටික ආයුධ පැතිරීම වැළැක්වීම පිළිබඳ සම්මුතිය හා ආරක්ෂණය සැලසීමේ ගිවිසුම පිළිබඳ නෛතික විධිවිධාන කෙරෙහි එහිදී අවධානය යොමු කරන ලදී.
විදේශ කටයුතු අමාත්‍යාංශයේ අදහස් ලබා ගැනීමෙන් පසු, නීතිපතිවරයාගේ නිරීක්ෂණ හා අනුමැතිය සඳහා අතිරේක වර්යා සම්මුතීන් ඉදිරිපත් කරන ලද අතර නීතිපතිවරයාගේ නිරීක්ෂණ හා යෝජනා ලැබී තිබුණි. අතිරේක වර්යා සම්මුතීන් අනුගමනය කිරීම සඳහා නීතිපතිවරයා විසින් ලබාදී තිබූ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි ආපදාවකදී සහාය දැක්වීම පිළිබඳ විධිවිධාන හා න්‍යෂ්ටික අනතුරකදී දැනුවත් කිරීම පිළිබඳ සම්මුතිය යටතේ ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ ජාත්‍යන්තර හදිසි ආපදා මධ්‍යස්ථානය විසින් පවත්වන ලද IAEA Convex-3 ජාත්‍යන්තර හදිසි ආපදා ප්‍රතිචාර අභ්‍යාසය සඳහා සභාව සහභාගී විය.

Convex-3 අභ්‍යාසයන් පිළිබඳ අරමුණු වනුයේ, විශාල න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි ආපදාවකදී ප්‍රතිචාර පිළිබඳ ඇගයීම සඳහා හා විශේෂයෙන් හදිසි ආපදා ප්‍රතිචාර සැලසුම් හා හැකියාවන් පිළිබඳ ශක්තිමත් හා දුර්වල ක්ෂේත්‍රයන් හඳුනාගැනීමයි. න්‍යෂ්ටික ප්‍රවේසම හා නෂ්ටික සුරක්ෂිතතා පිළිබඳ බලධාරීන් අතර සමීප සහයෝගීතාවයක් අවශ්‍ය අවස්ථාවලදී ජාතික හා / හෝ ජාත්‍යන්තර හදිසි ප්‍රතිචාර පද්ධති වර්ධනය කිරීම් අවශ්‍ය වන ක්ෂේත්‍ර හඳුනාගැනීම සඳහා අවස්ථාවක් Convex-3 මඟින් ලබාදෙන ලදී. මෙම අභ්‍යාසය ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ ජාත්‍යන්තර හදිසි ආපදා මධ්‍යස්ථානයේ (IAEA – IEC) වෙබ් අඩවිය මඟින් 2017 ජුනි 21 හා 22 දින පවත්වන ලදී. අනතුර අනුකරණය කිරීම සඳහා හන්ගේරියා න්‍යෂ්ටික විදුලිබල පිරියත යොදා ගන්නා ලදී.

න්‍යෂ්ටික හෝ විකිරණශීලි හදිසි ආපදාවකදී ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ ජාත්‍යන්තර හදිසි ආපදා මධ්‍යස්ථානයේ ස්ථාපිත වෙබ් අඩවිය පදනම් වූ සන්නිවේදන පද්ධතිය මඟින් ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය හා අනෙක් රටවල් සමඟ සන්නිවේදනය කිරීමේ ක්‍රමය අවබෝධ කර ගැනීම සඳහා මෙම අභ්‍යාසය සභාවට ඉතා ප්‍රයෝජනවත් විය.

ශ්‍රී ලංකාවේ න්‍යෂ්ටික සුරක්ෂිතතාව සංවර්ධනය කිරීම සඳහා ගෝලීය ද්‍රව්‍ය සුරක්ෂිතතා වැඩ සටහන යටතේ 2017 වර්ෂයේදී ඇමෙරිකා එක්සත් ජනපද රජයේ බලශක්ති දෙපාර්තමේන්තුව සමඟ ක්‍රියාකාරකම් ගණනාවක් සභාව විසින් ක්‍රියාත්මක කරන ලද අතර විශේෂයෙන් , ඉහළ ක්‍රියාකාරී විකිරණ ප්‍රභවයන් යොදා ගන්නා ප්‍රවිකිරණ පහසුකම් 14 කදී සවිකරන ලද භෞතික සුරක්ෂිතතා පද්ධති නඩත්තු කිරීම හා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ අලුතින් ස්ථාපිත කරන ලද පාවිච්චි කරන ලද විකිරණ ප්‍රභව ගබඩා කිරීමේ පහසුකම (Spent Radiation Source Storage Facility) හා උද්‍යාන වගා පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ අලුතින් ස්ථාපිත කරන ලද ස්වයං ආරක්ෂිත ගැමා ප්‍රවිකිරණ (Self Shielded Gamma Irradiator) සඳහා භෞතික සුරක්ෂිතතාව හඳුන්වාදීම සඳහා ඇමරිකා එක්සත් ජනපද බලශක්ති දෙපාර්තමේන්තුවේ තාක්ෂණික විශේෂඥවරුන්ගේ සහයෝගයෙන් පරික්ෂණයක් පවත්වන ලදී.

2017 වර්ෂයේදී සභාවේ න්‍යෂ්ටික නියාමන කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ විශිෂ්ඨ ප්‍රගතියක් ඉටුකර ගැනීමේදී කළමනාකරණ මණ්ඩලය, අධ්‍යක්ෂ ජනරාල් සහ සභාවේ කාර්ය මණ්ඩලය ඉතා උපයෝගී වූ අතර සභාවේ කාර්ය මණ්ඩලයේ කැපවීම නොවූවා නම් 2017 වර්ෂයේ සභාවේ මෙම ප්‍රගතිය ඉටුකර ගැනීමට නොහැකි වනු ඇත.

අවසාන වශයෙන් උපදෙස් හා සහාය ලබාදීම වෙනුවෙන් විදුලි බල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයාට හා අපගේ සභාවේ සියලු ප්‍රයත්නයන්හිදී ඉතා වටිනා ප්‍රතිපත්තිමය තීරණ ගැනීම වෙනුවෙන් කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ට මම ස්තුතිවන්ත වෙමි. සභාවේ නියාමන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේදී අපට සහාය වූ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ සභාපතිතුමාට හා විශේෂඥවරුන්ට ස්තුති කිරීමටද මම මේ අවස්ථාවේදී කැමැත්තෙමි.

සභාවේ මෙහෙයුම් කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී වර්ෂය පුරාම කැපවීමෙන්, වගකීමෙන් හා නොසැලෙන සහායෙන් කටයුතු කළ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට හා අප වෙත සහාය දැක්වූ ගරු අමාත්‍යතුමාට , ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට හා අමාත්‍ය කාර්ය මණ්ඩලයට මාගේ අවංක කෘතවේදීත්වය පළකිරීමට කැමැත්තෙමි.
සියලු දෙනාටම ස්තුති කරමින් සියල්ල සාර්ථක වේවායි පතමි.

වෛද්‍ය සමන් හේවාමාන

සභාපති

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය



2017 වර්ෂය සඳහා ඉටුකරන ලද කාර්යයන් ඉදිරිපත් කරන සභාවේ තෙවන වාර්ෂික වාර්තාව සඳහා මෙම පණිවුඩය වාර්තා කිරීමට ලැබීම ඉමහත් සතුටකි. සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්, සභාවේ නියාමන යටිතල පහසුකම් ඉහළ නැංවීම සඳහා ජාතික හා ජාත්‍යන්තර අදාළ පාර්ශවකරුවන්ගේ සහයෝගීතාවය ලබාගැනීමට මම සමත් විමි.

සභාවේ කාර්ය මණ්ඩලය හා සභාවේ වෙනත් පාර්ශ්වකරුවන් පුහුණු කිරීම සඳහා තාක්ෂණික සහයෝගීතාවය සපයන හා දිවයිනේ විකිරණ ආරක්ෂාව හා න්‍යෂ්ටික සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීම සඳහා උපකරණ හා විශේෂඥතාව ලබාදෙන ප්‍රධාන ජාත්‍යන්තර සංවිධානයන් වනුයේ ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය හා ඇමෙරිකා එක්සත් ජනපදයේ බලශක්ති දෙපාර්තමේන්තුවයි. 2017 වර්ෂයේදී ඇතැම් කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය (SLAEB), පොලිස් විශේෂ කාර්ය බලකාය , විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය, නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය සහ විදේශ කටයුතු අමාත්‍යාංශය දක්වන ලද සහයෝගීතාවය ඉතා ප්‍රශංසනීයය.

2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත (පනත) මඟින් දිවයිනේ භාවිත කරන සියලු විකිරණ ප්‍රභවයන් පිළිබඳ පාලනය තබා ගැනීම සඳහා බලපත්‍ර ලබාදීම හා පරීක්ෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සභාවට නියම කර ඇත. මෙම අවශ්‍යතාවය සපුරාලීම සඳහා, සභාව විසින් පරිචයන්ගේ අවදානම පදනම් කර ගෙන පරිචයන් පිළිබඳ බලපත්‍ර කාලය තීරණය කිරීමට හා පරිචයන් පිළිබඳ පූර්ව දැනුම්දීම සඳහා අවශ්‍යතාවයන් තීරණය කිරීමට රීති දෙකක් ප්‍රකාශයට පත් කරන ලදි.

වර්ෂ 1 ක හෝ වර්ෂ 2 ක කාල පරිච්ඡේදයක් සඳහා දැනට පවත්නා බලපත්‍ර අලුත් කිරීම සඳහා අවශ්‍ය සියලු අලුත් කිරීමේ ඉල්ලුම්පත්‍ර සභාව විසින් පිළියෙල කර විකිරණ ප්‍රභවයන් භාවිතා කරන්නන්ගේ පහසුව හා ක්ෂණික භාවිතා කිරීම සඳහා ඒවා සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත. සභාව විසින් බලපත්‍ර 460 ක්, ආනයන හා අපනයන අනුමැතින් 564 ක්, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ රසායනික වාර්තා පදනම් කර ගෙන කිරි ආහාර පිළිබඳ නිෂ්කාෂණ සහතික 967 ක් හා නව ප්‍රවිකිරණ කාමර සඳහා අනුමැතින් 118 ක් නිකුත් කරන ලදි. පනෙත් ඇති ප්‍රභවයන් හා පහසුකම් වල ප්‍රවේසම පිළිබඳව අවශ්‍යතා හා විකිරණ ආරක්ෂාව පිළිබඳ රෙගුලාසි වල නියමයන් සමඟ අනුකූලවීම තහවුරු කර ගැනීමට නව පහසුකම් සඳහා බලපත්‍ර ලබාදීමට පෙර හා පවත්නා බලපත්‍ර පහසුකම් සඳහා බලපත්‍ර කාල පරිච්ජේදය තුළ භෞතික පරීක්ෂාවන් සිදුකරන ලදි. එසේම විකිරණ ප්‍රභවයන් අනවසරයෙන් යොදා ගන්නන් පිළිබඳවද සභාව විසින් සැලසුම් නොකළ පරීක්ෂාවන්ද සිදුකරන ලද අතර මෙම සියලු පරීක්ෂා කිරීම්වල එකතුව 241 ක් විය.

විකිරණශීලී ප්‍රභවයන්හි සුරක්ෂිතතාව පිළිබඳ රෙගුලාසි කෙටුම්පත් කිරීම සඳහා සභාව කටයුතු කරන ලද අතර රෙගුලාසි පිළිබඳ පළමු කෙටුම්පත නිම කර ඇත. විශේෂ කාර්ය බලකා පුහුණු විද්‍යාලය විසින් පවත්වන ලද පුහුණු වැඩ සටහන්වල විෂය නිර්දේශයට න්‍යෂ්ටික සුරක්ෂිතතාව ඇතුළත් කිරීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කර ඇත. ස්ථාපිත කර ඇති සුරක්ෂිතතා පද්ධති හා සකස් කරන ලද සුරක්ෂිතතා වැඩසටහන් ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ 1 -වර්ගයේ විකිරණ පහසුකම් සඳහා ලබාදී ඇති ජාත්‍යන්තර ප්‍රමිතින්වල අවශ්‍යතාවයන්ට අනුකූල වන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂා කිරීම් වලදී භාවිතා කිරීමට පරීක්ෂා ලැයිස්තුවක් (Check List) පිළියෙල කරන ලදි. ඉහත පරීක්ෂා කිරීමේ ලැයිස්තුව පදනම් කර ගෙන ලබාදී ඇති සුරක්‍ෂිතතාව ප්‍රමාණවත්ද යන්න පරීක්ෂා කිරීම සඳහා සුරක්‍ෂිතතා පරීක්ෂණ සිදුකිරීමට හා වැඩිදියුණු කිරීම් සඳහා නිර්දේශයන් ලබාදීමට සභාවේ විකිරණ ආරක්ෂාව පිළිබඳ පරීක්ෂකවරුන් පුහුණු කරන ලදි. සභාව විසින් ඇමෙරිකා එක්සත් ජනපදයේ බලශක්ති දෙපාර්තමේන්තුව (US DOE) සමඟ ඒකාබද්ධව ජාතික විකිරණශීලී තර්ජන ප්‍රතිචාර පරිපාටි සංග්‍රහය (National Radiological Theft Response Code) කෙටුම්පත් කරන ලද අතර කෙටුම්පත සමාලෝචනය කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ රැස්වීම් 2 ක් පවත්වන ලදි. අවසාන කෙටුම්පත 2018 වර්ෂයේ පළමු කාර්තු 2 තුළදී සම්පූර්ණ කරනු ඇත. මෙම ජාතික විකිරණශීලී තර්ජන ප්‍රතිචාර පරිපාටි සංග්‍රහය (NRTRC) විකිරණශීලී සුරක්ෂිතතා සිද්ධියකදී කාර්යක්ෂම හා කාලීන ප්‍රතිචාර සම්බන්ධීකරණය සඳහා පහසුකම් සපයනු ඇත.

දිවයිනේ විකිරණශීලී අප ද්‍රව්‍ය ප්‍රවේසම හා සුරක්ෂිතතාව තහවුරු කර ගැනීම සඳහා වන නිල පැවරුම සභාව සතුය. විධිමත් සුරක්ෂිතතාවයක් නොමැතිව විවිධ ස්ථානවල ගබඩා කර තිබූ විකිරණශීලි තෙතමාන (Moisture Gauges) 10 ක් සභාව විසින් එකතුකර ගෙන සභාවට අයත් මධ්‍යම අප ද්‍රව්‍ය ගබඩා කිරීමේ පහසුකම (Central Waste Storage Facility) ස්ථානයෙහි ගබඩා කරන ලදි. සභාව විසින් සිදුකරන ලද නියාමන පරීක්ෂා කිරීම් වලදී මෙම ප්‍රභවයන් සොයා ගෙන තිබුණි.

සභාවට අයත් මධ්‍යම අපද්‍රව්‍ය ගබඩා කිරීමේ පහසුකමහිදී සියලු විකිරණශීලී ප්‍රභවයන් වෙන් කරන ලද අතර එහිදී විකිරණ නියුක්ලයිඩ හා දූෂ්‍ය වූ ප්‍රභවයන් හඳුනාගන්නා ලදි. මෙම දූෂ්‍ය ප්‍රභවයන් තවදුරටත් දූෂ්‍ය බව පැතිරීම වැළැක්වීම සඳහා පොලිතින් මළුවල අසුරා මුද්‍රා තබන ලදි.

නව කැළණි පාලම ඉදිකිරීම පහසු කරලීම සඳහා සභාවට අයත් පැරණි මධ්‍යම අප ද්‍රව්‍ය ගබඩා කිරීමේ පහසුකම කඩා දැමීමට සිදුවන හෙයින් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට අයත් අලුතින් ඉදිකළ “පාවිච්චි කරන ලද ප්‍රභව ගබඩා කිරීමේ පහසුකම (Spent Source Storgae Facility )” ට දැනට ඇති ප්‍රභව මාරු කර යැවීමට සිදුවන හෙයින් එම ප්‍රභවයන් ගබඩා කිරීම සඳහා සුදුසු බහාලුම් සකස් කිරීමට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදි.

මධ්‍යම අප ද්‍රව්‍ය ගබඩා කිරීමේ පහසුකම්හි (CWSF) ගබඩා කර තිබූ සියලුම විකිරණශීලී ප්‍රභවයන් එම ප්‍රභවයන් පිළිබඳ ප්‍රවේශම තහවුරු කර ගැනීමෙන් පසුව එම පාවිච්චි කරන ලද ප්‍රභව ගබඩා කිරීමේ පහසුකම (SSSF) වෙත සභාවේ අධීක්ෂණය යටතේ මාරු කරන ලදි. ප්‍රභවයන් පිළිබඳ ඉන්වෙන්ට්‍රිය සකස් කරන ලද අතර සභාව යටතේ වූ සියලුම ප්‍රභවයන් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට

අයත් පාවිච්චි කරන ලද ප්‍රභව ගබඩා කිරීමේ පහසුකමෙහි දැනට ගබඩා කර ඇති බැවින් ඒවා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට භාරදිය යුතු වේ.

පනතේ 58 වගන්තිය ප්‍රකාරව, ජාතික මට්ටමින් විය හැකි න්‍යෂ්ටික හෝ විකිරණශීලි හදිසි ආපදාවකදී ප්‍රතිචාර දැක්වීම සඳහා හදිසි ආපදා කළමනාකරණ සැලැස්මක් (Emergency Management Plan) සංවර්ධනය කිරීමට සභාව වගකිව යුතු වන අතර හදිසි ආපදා කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට සහාය හා උපදෙස් ලබාදීම සඳහාද වගකිව යුතු වේ. න්‍යෂ්ටික අනතුරකදී කල් තියා දැනුම්දීම පිළිබඳ ප්‍රඥප්තිය (Convention on Early Notitication of a Nuclear Accident ) හා න්‍යෂ්ටික අනතුරකදී හෝ විකිරණශීලී ආපදාවකදී සහාය දැක්වීම පිළිබඳ ප්‍රඥප්තිය ( Convention on Assistance for a Nuclear Accident or Radiological Emergency ) සඳහා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය සමඟ ක්‍රියාකිරීමට නිසි බලධාරී අධිකාරිය ලෙස හා සන්නිවේදනය කිරීම සඳහා ජාතික උපදේශාත්මක ආයතනය (National Warning Point) ලෙස සභාව නම් කර ඇත. හදිසි අපදා අවම කිරීම සඳහා පනතින් ලබාදී ඇති නියෝගය සම්පූර්ණ කිරීම සඳහා හා එසේම හදිසි ආපදා කළමනාකරණ පරිණත වැඩසටහන සංවර්ධනය කිරීම සඳහා සභාව විසින් හදිසි ආපදා කළමනාකරණ සැලැස්ම කෙටුම්පත් කිරීමට සහ න්‍යෂ්ටික හෝ විකිරණශීලී අවදානමකදී කළමනාකරණයේ යෙදිය හැකි පාර්ශවකරුවන්ගෙන් තාක්ෂණික පුද්ගලයන් හා ප්‍රතිචාර බලකා නිලධාරින් පුහුණු කිරීමට සභාව විසින් කටයුතු කර ඇත.

පනතේ විධිවිධාන ප්‍රකාරව විකිරණශීලි ප්‍රභවයන් පිළිබඳ සුරක්ෂිතතාව නියාමනය කිරීම සඳහා සභාව සතුව වගකීමක් ඇත. ඉහළ ක්‍රියාකාරී විකිරණශිලි ප්‍රභවයන් (Category 1 sources) ප්‍රවාහනයේදී විශේෂ කාර්ය බලකාය (STF) හා ශ්‍රී ලංකා පොලිසිය සමඟ ඒකාබද්ධව සභාව විසින් සුරක්ෂිතතා සැපයීම සම්බන්ධීකරණය කරන ලදි. කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සිට මහරගම අපේක්ෂා රෝහල , දක්වා හා මහනුවර ශික්ෂණ රෝහල දක්වා පිළිකා ප්‍රතිකාර සඳහා භාවිතා කරන කොබෝල්ට් - 60 විකිරණ ප්‍රතිකාර ප්‍රභවයන් 2 ක් ප්‍රවාහනය සඳහා විශේෂ කාර්ය බලකාය හා පොලිසිය සමඟ වැඩ පිළිවෙලක් සකස් කරන ලදි. යන්ත්‍ර වලින් ඉවත් කරන ලද දිරාපත් ප්‍රභවයන් ඉහත රෝහල් දෙක සිට කැළණිය ගබඩා පහසුකම් වෙත ප්‍රවාහනය කරන ලද අතර ඉන් පසු නැවත අපනයනය කිරීම සඳහා කැළණිය ගබඩා පහසුකම සිට කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ වෙත ඒවා ප්‍රවාහනය කරන ලදි.

එසේම කොබල්ට් - 60 ප්‍රභවයන් සහිත නැව් තොග දෙකක් සභාවේ අධීක්ෂණය යටතේ විශේෂ කාර්ය බලකායේ හා පොලිසියේ සහාය ඇතිව කොළඹ වරාය සිට බියගම අපනයන සැකසුම් කලාපයේ පිහිටි ඇන්සල් ලංකා ලිමිටඩ් ආයතනයට හා ශ්‍රී ලංකා ගැමා සෙන්ටර් ආයතනයට ප්‍රවාහනය කරන ලදි

මෙම සම්පූර්ණ ප්‍රවාහන කාර්යයේදී අමෙරිකා එක්සත් ජනපදයේ ගෝලීය ද්‍රව්‍ය සුරක්ෂිතතා වැඩ සටහන (Global Material Security program) යටතේ ඇමෙරිකා එක්සත් ජනපදයේ "ඕක් රිජ් නැෂනල් ලැබොරටරි" ( Oak Ridge National Laboratory ) විසින් සපයන ලද ට්‍රැකින් උපකරණයක් (Tracking Device – T Star ) යොදා ගන්නා ලදි. නැව් බඩු ප්‍රවාහනයේදී ප්‍රවාහන බහාලුමේ නියමිත ස්ථානය පිළිබඳ තොරතුරු මෙම උපකරණය මඟින් ලබාගත හැක.

මෙම ප්‍රවාහනයන් සඳහා බලපත්‍ර ලබාදීමට පෙර මෙම ප්‍රවාහනයන් සඳහා යෙදෙන පුද්ගලයන්ගේ අවශ්‍ය සියලු තොරතුරු, ඔවුන්ගේ අවංකභාවය තක්සේරු කර ගැනීම සඳහා ලබාගන්නා අතර ප්‍රවේසම්ව හා සුරක්ෂිතව ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා වාහනවල තත්ත්වය තහවුරු කර ගැනීමට වාහනවල තොරතුරු ලබාගනු ලැබිය.

සභාවේ කාර්ය මණ්ඩලයේ කැපවීම හා මහත් පරිශ්‍රමය මත බඳවා ගැනීම් පරිපාටියේ අදාළ සියලු අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් පසුව 8139 ක් වූ ඉල්ලුම්කරුවන්ගෙන් කළමනාකරණ සහකාරවරුන් 8 දෙනෙකු තෝරා ගැනීමට හැකි විය. මෙම කළමනාකරණ සහකාරවරුන් 2018 මාර්තු මාසයේදී බඳවා ගැනීමට සූදානම් කර ඇත.

සමස්තයක් වශයෙන් 2017 වර්ෂයේදී සභාව සිදුකරන ලද කාර්යයන් හා ලබාගත් ප්‍රගතිය ගැන සලකා බැලීමේදී 2017 වර්ෂය පනතේ දී ඇති නියෝගයන්ට අනුව සභාව නියාමන කාර්යයන් ක්‍රියාත්මක කර ඇති සාර්ථක වර්ෂයක් ලෙස හැඳින්විය හැක.

විදුලි බල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයට, සභාවේ සභාපතිතුමාට හා කළමනාකරණ මණ්ඩලයට සහ 2017 වර්ෂයේ ඉහත ප්‍රගතිය අත්කර ගැනීමට සහාය දැක්වූ මාගේ කාර්ය මණ්ඩලයට මාගේ කෘතඥතාවය පළ කර සිටිමි.



එච්.එල්.අනිල් රංජිත්
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව

## දැක්ම

අයනීකරණ විකිරණයෙන් සිදුවිය හැකි
අනර්ථකාරී බලපෑම් වලින් ආරක්ෂා වන රටක්

කාර්යක්ෂම හා ඵලදායී නියාමන පාලන
ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම මඟින්
අයනීකරණ විකිරණයෙන් සිදුවිය හැකි
අනර්ථකාරී බලපෑම් වලින් සාමාන්‍ය
මහජනතාව, රෝගීන්, විකිරණ ශ්‍රමිකයින් හා
පරිසරය ආරක්ෂා කර ගැනීම.



# හැඳින්වීම

අයනීකරණ විකිරණයෙන් වියහැකි අහිතකර බලපෑම් වලින් පොදු ජනතාව, රෝගීන්, විකිරණ ශ්‍රමිකයන් හා පරිසරය ආරක්ෂා කර ගැනීම හා විකිරණශීලී ප්‍රභවයන්ගේ සුරක්ෂිතතාව තහවුරු කර ගැනීම සඳහා නියාමන පාලන ක්‍රමයක් ස්ථාපිත කිරීමේ නිල නියෝගය සහිතව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව ( සභාව) 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත මඟින් 2015 ජනවාරි 01 දින ස්ථාපිත කරන ලදි. පනතේ නියෝග සම්පූර්ණ කිරීම සඳහා බලපත්‍ර දීමේ පද්ධති ස්ථාපනය කිරීම, විකිරණශීලී ද්‍රව්‍ය හා විකිරණශීලී සමස්ථානික භාවිතා කරන්නන් සඳහා පරීක්ෂණ, විකිරණශීලී ද්‍රව්‍ය ආනයනය හා අපනයනය පාලනය කිරීම, විකිරණශීලී අප ද්‍රව්‍ය කළමනාකරණය, විකිරණශීලී ද්‍රව්‍ය පිළිබඳ භෞතික ආරක්ෂාව තහවුරු කර ගැනීම, අධි ශක්ති විකිරණ අනතුරු පිළිබඳ ප්‍රතිචාර සඳහා හැකියාව වර්ධනය කිරීම, ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය සමඟ ආරක්ෂණ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ වගකීම් වලට මුහුණදීම සහ ඉහත සඳහන් කරුණු සඳහා අත්‍යවශ්‍ය නීති සම්පාදනය හා නියාමන රාමුව ස්ථාපිත කිරීම සභාව විසින් සිදුකිරීම අවශ්‍ය වේ. විකිරණ ප්‍රවේසම හා සුරක්ෂිතභාවය පිළිබඳව ශ්‍රී ලංකාව විසින් අත්සන් කරන ලද සම්මුතීන් හා ප්‍රඥප්ති සඳහා කේන්ද්‍රීය ස්ථානයක් ලෙස ක්‍රියාකිරීම සඳහා ද සභාවට නියෝගයන් ලැබී ඇත.

පනතේ 14 වගන්තිය යටතේ සභාපතිවරයකු හා සභාවේ සාමාජිකයන් පත් කිරීමට අමාත්‍යවරයාට බලය පනතින් ලැබී ඇත. පහත පරිදි සභාපති ඇතුළු සාමාජිකයන් 5 දෙනෙකුගෙන් සභාව සමන්විත වේ.

(අ) න්‍යෂ්ටික විද්‍යාව (Nuclear Sicence) හා තාක්ෂණය හෝ විකිරණ ආරක්ෂාව සම්බන්ධව විශේෂඥයන් වූ පුද්ගලයන් තිදෙනෙක්

(ආ) නීති අංශයට සම්බන්ධ හෝ සභාවේ අරමුණු වලට සම්බන්ධ පළපුරුද්දත් ඇති එක් පුද්ගලයකුගෙන්

(ඇ) පරිසර විෂයට සම්බන්ධ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ එම අමාත්‍යවරයා විසින් පත් කරන ලද අතිරේක ලේකම්වරයකුගේ හෝ අධ්‍යක්ෂවරයකුගේ තනතුරකට පහළ නොවූ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු

2015 වර්ෂයේ පළමු කාර්තුවේ දී විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ විෂය පථය යටතට සභාව අයත් වූ අතර ඉන් පසු විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය යටතට අයත් විය.

පනතේ සඳහන් පරිදි සභාවේ අරමුණු පහත පරිදි වේ.

(අ) අයනීකරණ විකිරණය සඳහා අනාවරණය වූ ආශ්‍රිත අවදානම් වලට එරෙහිව පුද්ගලයන් හා පරිසරය ආරක්ෂා කිරීම හා ප්‍රභවයන් පිළිබඳ ප්‍රවේසම හා සුරක්ෂිතාව සහ පහසුකම් සඳහා අවශ්‍යතා අදාළ පරිදි ස්ථාපිත කිරීම,

(ආ) ඕනෑම ප්‍රභවයන්, විකිරණ ද්‍රව්‍යයක් සහ වෙනත් විකිරණශීලී ද්‍රව්‍යයන් හේතුවෙන් වන අහිතකර බලපෑම් වලින් පුද්ගලයන් හා පරිසරය ආරක්ෂා කර ගැනීම තහවුරු කර ගැනීම සඳහා සියලු අදාල පියවරයන් ගැනීම හා එවැනි ද්‍රව්‍ය හා පහසුකම් පිළිබඳ ආරක්ෂාව තහවුරු කර ගැනීම,

(ඇ) ශ්‍රී ලංකාව විසින් අනුකූලවීම සඳහා අවශ්‍ය වන විකිරණ බලශක්ති ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර ප්‍රමිතීන් හා වගකීම් සමඟ අනුකූලතාවය නිශ්චය කර ගැනීම.

පනතේ විධිවිධාන යටතේ සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයන්වීම සඳහා තෝරා ගන්නා ලද සේවකයන් 19 ක් සහිතව සභාව එහි මෙහෙයුම් ආරම්භ කරන ලදි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සභාව සඳහා වූ බඳවා ගැනීම් පරිපාටිය (SOR) අනුව කාර්ය මණ්ඩල තනතුරු 41 ක් වූ අතර බඳවා ගැනීම් පරිපාටියේ අවශ්‍යතා වලට සරිලන පරිදි නිලධාරීන් බඳවා ගැනීමට සභාව කටයුතු කරමින් සිටී.

## කළමනාකරණ මණ්ඩලය

2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ 14(1)(අ) වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් 5 දෙනෙකු පත් කිරීම සඳහා පනතින් විධිවිධාන සලසා ඇති අතර එයින් එක් සාමාජිකයකු පරිසර විෂය අයත් වන අමාත්‍යවරයා විසින් නම් කරන ලද නිල බලයෙන් පත්වන සාමාජිකයකු විය යුතුය. 2017 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දක්වා කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් පහත පරිදි විය.

### සභාපති

වෛද්‍ය සමන් හේවමාන

සායන රුධිර පිළිකා විශේෂඥ වෛද්‍ය

### සාමාජික

**මහාචාර්ය, කේ.ආර්.රංජිත් මහානාම**

පීඨාධිපති, විද්‍යා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය

### සාමාජික

ජේ.එම්.සී.මාලිනි ජයවර්ධන මිය

නීතිඥ හා නොතාරිස්

### නිරීක්ෂක

කේ.වී.අයි. මල්ලිකා මිය

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

### නිරීක්ෂක

ජී.අයි.ගංගානාත් පෙරේරා මයා

ගණකාධිකාරී, මුදල් අමාත්‍යාංශය

සමාලෝචිත කාල පරිච්ඡේදය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වන ලදි. මෙහෙයුම් කාර්යයන්, කාර්ය මණ්ඩල කරුණු, ජාත්‍යන්තර සහයෝගීතාවය, මුදල් හා පරිපාලන කටයුතු වලට අදාළ කරුණු ප්‍රතිපත්තිමය තීරණයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලදි. එසේම සභාවේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරන ලදි.

## අධ්‍යක්ෂ ජනරාල්

නියාමන කරුණු හා විකිරණ ආරක්ෂාව පිළිබඳ වර්ෂ 30 ක පළපුරුද්දක් ඇති එච්.එල්. අනිල් රංජිත් මහතා 2015 නොවැම්බර් 03 දින සිට සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් කටයුතු කරමින් සිටී. ගරු විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා විසින් පනතේ 71(1)(ආ) වගන්තියෙන් ඔහුට පැවරී ඇති බලතල අනුව, රංජිත් මහතා අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් පත්කර ඇත. මෙම පත්වීමට පෙර පරමාණුක බලශක්ති අධිකාරියේ විකිරණ ආරක්ෂාව හා රීති පිළිබඳ අංශයේ අධ්‍යක්ෂ වශයෙන් රංජිත් මහතා කටයුතු කරන ලදි.

## ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්

| නම | තනතුර | අධ්‍යාපනික සුදුසුකම් |
|---|---|---|
| එච්.එල්.අනිල් රංජිත් මයා | අධ්‍යක්ෂ ජනරාල් | විද්‍යාවේදී (දෙවන පන්තිය පහළ සාමාර්ථය) න්‍යෂ්ටික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය |
| ටී.එච්.එස්.ශාන්ත මයා | අධ්‍යක්ෂ (අනුමැතිය දීම) | විද්‍යාවේදී - (දෙවන පන්තිය ඉහළ සාමාර්ථය) න්‍යෂ්ටික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය |
| යූ. ඩබ්ලිව්. කේ. එච්. ද සිල්වා මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ | විද්‍යාවේදී - රසායන විද්‍යාව (විශේෂ) න්‍යෂ්ටික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය, විකිරණ ආරක්ෂාව පිළිබඳ පශ්චාත් උපාධිය ඩිප්ලෝමාව (මැලේසියාව) |
| කේ.එන්.ආර්.ප්‍රනාන්දු මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ | විද්‍යාවේදී - (දෙවන පන්තිය පහළ සාමාර්ථය) න්‍යෂ්ටික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය, විකිරණ ආරක්ෂාව පිළිබඳ පශ්චාත් උපාධිය ඩිප්ලෝමාව (මැලේසියාව) |
| කේ.කේ.පී. අයි. කේ. කඩදුන්න මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ | විද්‍යාවේදී - (දෙවන පන්තිය පහළ සාමාර්ථය) න්‍යෂ්ටික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය, විකිරණ ආරක්ෂාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (මැලේසියාව) |
| කේ. එස්.එස්.කුමාර මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ | විද්‍යාවේදී භෞතික විද්‍යාව (විශේෂ) දෙවන පන්තිය ඉහළ සාමාර්ථය, න්‍යෂ්ටික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය, විකිරණ ආරක්ෂාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ( මැලේසියාව) |

## විධායක සාරාංශය

2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බල ශක්ති පනත යටතේ 2015 ජනවාරි 01 දින ආරම්භ වූ සභාව 2017 වසර එහි තෙවන වසර ලෙස සනිටුහන් කරයි. විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය යටතේ සභාව ක්‍රියාත්මක වන අතර ගරු අමාත්‍යවරයා විසින් පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි පාලනය සිදුකෙරේ.

නියාමන පාලන පද්ධතියක් ස්ථාපිත කිරීමෙන් හා පවත්වා ගැනීම මඟින් අයනීකරණ විකිරණයෙන් විය හැකි හානිකර බලපෑම් වලින් පොදු ජනතාව, රෝගීන්, විකිරණ ශ්‍රමිකයන් හා පරිසරය ආරක්ෂා කර ගැනීමේ වගකීම තහවුරු කර ගැනීම සඳහා සභාවට 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත මඟින් බලතල පවරා ඇත. තවද විකිරණ ප්‍රභවයන් පිළිබඳ සුරක්ෂිතතාවය හා ප්‍රවේසම තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය බලතල ද සභාවට පවරා ඇත. ආරක්ෂාවීම, සුරක්ෂිතතාවය හා ප්‍රවේසම සඳහා ප්‍රමිතීන් සම්මත කර ගැනීම සඳහා ද සභාව වගකිව යුතු වේ.

පනතේ අරමුණු ඉටුකර ගැනීම් වස්, සභාව විසින් අයනීකරණ විකිරණ හා ප්‍රවිකිරණ උපකරණ භාවිතා කරන්නන් සඳහා බලපත්‍ර ලබාදීම, ප්‍රවිකිරණ පහසුකම් පරීක්ෂා කිරීම, විකිරණ ප්‍රභවයන් ආනයන හා අපනයන පාලනය, අපද්‍රව්‍ය ප්‍රවේසම සම්බන්ධ වැඩ සටහන්, විකිරණශීලී ද්‍රව්‍ය ප්‍රවේසම් සහිතව ප්‍රවාහනය කිරීම සඳහා අනුමැතියදීම, ආරක්ෂණය හා බලාත්මක පද්ධතීන් ක්‍රියාත්මක කිරීම යනාදී කාර්යයන් සිදුකරනු ලැබේ.

2017 වර්ෂයේ දී සභාවේ ප්‍රධාන අරමුණු වූයේ පනතේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි බලපත්‍ර ලබාදීම හා පරීක්ෂණ පද්ධතිය ස්ථාපිත කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය නෛතික යටිතල පහසුකම් සම්පූර්ණ කර ගැනීම, සියලු විකිරණ භාවිතා කරන්නන් නියාමන පාලනයක් යටතට ගැනීම සහ සභාවට අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමයි.

ප්‍රභවයන් සඳහා බලපත්‍රදීමට අවශ්‍ය නියාමන යටිතල පහසුකම් ශක්තිමත් කිරීමේ අරමුණින්, දැනට කමිටු මඟින් සමාලෝචනයේ පවතින පහත සඳහන් ලියවිලිවල පළමු කෙටුම්පත් සභාව විසින් පිළියෙල කරන ලදි.

- විකිරණ සේවකයන් පිළිබඳ සුදුසුකම් සඳහා නිර්නායකය පිළිබඳ රීතිය
- අයනීකරණ විකිරණ ආරක්ෂාව හා විකිරණ ප්‍රභවයන් සම්බන්ධයෙන් ප්‍රවේසම පිළිබඳ නියෝග
- විකිරණශීලී ප්‍රභවයන් නිෂ්පාදනයේ දී භාවිතයේ දී ගබඩා කිරීමේ දී හා ප්‍රවාහනයේ දී ඒ පිළිබඳ සුරක්ෂිතතාව සඳහා නියෝග

ජාතික විකිරණශීලී සුරක්ෂිතතා තර්ජනයකට ඵලදායී හා කාලීන ප්‍රතිචාර සඳහා ඇමෙරිකා එක්සත් ජනපදයේ බලශක්ති දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව ජාතික විකිරණශීලී තර්ජන ප්‍රතිචාර පරිපාටි සංග්‍රහය සහ න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි අනතුරක දී ඇතිවන ප්‍රතිඵල අවම කර ගැනීම සඳහා අදාළ පාර්ශවයන් අතර මනා සංවිධානයකින් යුත් වැඩ පිළිවෙලක් ස්ථාපිත කිරීම සඳහා ජාතික න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි ආපදා කළමනාකරණ සැලැස්ම පිළිබඳ පළමු කෙටුම්පත ද සභාව විසින් සකස් කරන ලදි.

සභාව විසින් රියැදුරන් දෙදෙනකු හා කාර්යාල සහායකයකු බඳවා ගන්නා ලදි. කළමනාකරණ සහකාරවරුන් 8 දෙනෙකු බඳවා ගැනීමට ඉල්ලුම්පත් කැඳවා ඇත. කළමනාකරණ සහකාර තනතුරු සඳහා ඉල්ලුම්පත්‍ර 8139 ක් ලැබී තිබු අතර බඳවා ගැනීම් පරිපාටියේ (SOR) දක්වා ඇති සුදුසුකම් අනුව යතුරු ලියන හැකියාව හා මයික්‍රොසොෆ්ට් කාර්යාල පැකේජ් භාවිතා කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා සුදුසුකම්ලත් ඉල්ලුම්කරුවන් 3223 ක් තෝරා ගන්නා ලදි. යතුරු ලියන පරීක්ෂාවට කැඳවන ලද 3223 ක් වූ ඉල්ලුම්කරුවන්ගෙන් ඉල්ලුම්කරුවන් 1138 ක් යතුරු ලියන පරීක්ෂාවට සහභාගී වී තිබුණි. උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන උසස් තාක්ෂණික ආයතනය විසින් පවත්වන ලද ලිඛිත පරීක්ෂණය සඳහා පෙනී සිටීම සඳහා යතුරු ලියන පරීක්ෂණයට පෙනී සිටි 273 දෙනෙකු තෝරා ගන්නා ලද අතර ලිඛිත පරීක්ෂණය සඳහා ඉල්ලුම්කරුවන් 225 දෙනෙකු පෙනී සිට තිබුණි. ඉල්ලුම්කරුවන් 225 දෙනෙකුගෙන් ඉල්ලුම්කරුවන් 147 දෙනෙකු වාචික පරීක්ෂණයට තෝරා ගන්නා ලද අතර ඉල්ලුම්කරුවන් 118 දෙනෙකු ඒ සඳහා සහභාගී වී තිබුණි. ඒ අනුව ඉහත ඉල්ලුම්කරුවන් සඳහා වූ ලිඛිත පරීක්ෂණය හා සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු වල කුසලතාවය මත පදනම්ව 2018 මාර්තු මාසයේදී කළමනාකරණ සහකාරවරුන් 8 දෙනෙකු බඳවා ගැනීමට සැලසුම් කර ඇත.

තවද 2017 වර්ෂයේ දී විකිරණ ප්‍රභවයන් හා විකිරණශීලී සමස්ථානිකයන් භාවිතා කරන පරිශ්‍රයන් පිළිබඳ ක්‍රමවත් පරීක්ෂණ පැවැත්වීම මඟින් ප්‍රවේසම් නියමයන් ඉටුකර ගැනීම සඳහා රාජ්‍ය හා පුද්ගලික අංශයේ ආයතනයන්ට විකිරණ ආරක්ෂා සේවා සැපයීම් කිහිපයක් සිදුකරන ලදි. විකිරණශීලී සමස්ථානිකයන් හෝ ප්‍රවිකිරණ උපකරණ ( වෛද්‍ය x - කිරණ ඇතුළත්ව) අත්කර ගැනීම හා භාවිතය සඳහා බලපත්‍ර ලබාගැනීමට ඉල්ලුම් කරන ලද සියලු ආයතනයන් සඳහා පනතේ හා නියෝග වල අවශ්‍යතා සමඟ අනුකූලතාවය පිළිබඳ විධිමත් තක්සේරුවකින් පසු බලපත්‍ර ලබාදෙන ලදි.

විකිරණශීලී ද්‍රව්‍ය ආනයනය / අපනයනය සඳහා අනුමැතිය ලබාදීම් සමාලෝචිත වර්ෂයේ සිදුකරන ලද අතර සභාවේ අවශ්‍යතා සම්පූර්ණ කරන ලද බවට නිර්දේශ සහිත ප්‍රවිකිරණ කාමර සැලසුම් සඳහා ද අනුමැතිය ලබාදෙන ලදි.

2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ 12(ඉ) වගන්තියේ දක්වා ඇති විධි විධාන අනුගමනය කරමින් ශ්‍රී ලංකාව විසින් අත්සන් කරන ලද ජාත්‍යන්තර සම්මුතීන් යටතේ වගකීම් සම්පූර්ණ කර ගැනීම සඳහා සභාව විසින් අවධානය යොමු කර තිබේ. ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සියේ (IAEA) ඉල්ලීම පරිදි ආරක්ෂණ ගිවිසුම් සඳහා අතිරේක චර්යා අත්සන් කිරීම සලකා බැලීමට අවශ්‍ය ලියකියවිලි හා සභාවේ නිර්දේශ විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදි. අත්සන් කරන ලද අතිරේක චර්යා සඳහා පාර්ශවයක් වශයෙන් සම්පූර්ණ කළ යුතු අතිරේක චර්යා සම්මුති හා වගකීම් ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කළ යුතු තාක්ෂණික හා පරිපාලන සැලසුම් පිළිබඳ තොරතුරු සැපයීමට නීතිපති දෙපාර්තමේන්තුව හා විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කිහිපයකට සභාව විසින් සහභාගී වී ඇත.

සභාව විසින් දෙනු ලබන නියාමන සේවා වැඩිදියුණු කිරීම සඳහා මිනිස් බල සංවර්ධනය ඉතා අවශ්‍ය සංරචකයක් වන හෙයින් දේශීය හා විදේශීය පුහුණු අවස්ථා සභාවේ නිලධාරින්ට ලබාදෙන ලද අතර, කාර්ය මණ්ඩලයේ කාර්යයන් වලට අදාළ කටයුතු සංවර්ධනය කිරීම සඳහා විශේෂඥ සේවා, ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ සහ එක්සත් ජනපදයේ බලශක්ති දෙපාර්තමේන්තුවේ ගෝලීය ද්‍රව්‍ය සුරක්ෂිතතා වැඩ සටහනේ (Global Material Security Programme ) සහාය ඇතිව ලබාදෙන ලදි.

රජයේ හා පුද්ගලික අංශයේ ආයතනවල අයනීකරණ විකිරණය භාවිතා කරන කාර්ය මණ්ඩලයේ විකිරණ ආරක්ෂාව පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සඳහා සභාව විසින් පුහුණු වැඩ සටහන් කිහිපයක් පවත්වන ලදි. සියලු බලපත්‍ර පහසුකම් සඳහා විකිරණ ආරක්ෂක නිලධාරීන් පත් කරනු ලැබ ඇත. 2017 වර්ෂය තුළ දී සභාව විසින් සිදුකරන ලද කාර්යයන් පිළිබඳ විස්තර පහත ක්ෂේත්‍රයන් යටතේ දැක්විය හැක.

- නීති සම්පාදනය හා රෙගුලාසි
- ජාත්‍යන්තර සම්මුතීන් හා ප්‍රඥප්ති
- බලයදීම ( බලපත්‍ර හා අනුමැතීන් )
- ආනයන හා අපනයන පාලනය
- ප්‍රවේසම පිළිබඳ පරීක්ෂණ
- පරමාණුක හා අනෙකුත් විකිරණශීලී ද්‍රව්‍ය පිළිබඳ සුරක්ෂිතාව
- අප ද්‍රව්‍ය කළමනාකරණය හා විකිරණශීලී ද්‍රව්‍ය ප්‍රවාහනය
- හදිසි ආපදා ප්‍රතිචාර හා සැලසුම්
- මානව සම්පත් කළමනාකරණය
- විවිධ කාර්යයන්

සභාව සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ දී අයදුම්පත්‍ර විශාල සංඛ්‍යාවක් ලැබීම හේතුවෙන් හා නියාමන කාර්යයන් සිදුකිරීමේ දී ප්‍රමාණවත් කළමනාකරණ සහකාරවරුන් නොමැතිවීම හේතුවෙන් සභාවට විශාල අභියෝග වලට මුහුණදීමට සිදුවිය. අනුමත කළමනාකරණ සහකාරවරුන් සංඛ්‍යාව 8 දෙනෙකු වුවත් විවිධ සීමාවන් මත 2017 දෙසැම්බර් 31 දිනට කළමනාකරණ සහකාරවරු නොසිටියහ.

සභාවේ හා දිවයින ඇතුළත පුහුණු තාක්ෂණික විශේෂඥයින් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොසිටීම හේතුවෙන් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට මුහුණදීමට නියාමන පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික ලියකියවිලි කෙටුම්පත් කිරීම සභාව මුහුණදුන් තවත් අභියෝගයක් විය.

සභාවේ මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී කාර්ය මණ්ඩලයේ කැපවීම, වගකීම හා නොසැලෙන සහාය හේතුවෙන් ඉහත සීමාවන් මධ්‍යයේ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සරිලන පරිදි සභාවේ නියාමන හා පරිපාලන කටයුතු වැඩිදියුණු කිරීමට සභාවට හැකි වී ඇත.

# ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව පිහිටුවීම

## සභාවේ මෙහෙයුම් කාර්යයන් ආරම්භ කිරීම

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ විෂය පථය යටතේ දැනට ක්‍රියාත්මක වන සභාව අමාත්‍යවරයා විසින් බල ගන්වන ලද ගැසට් නිවේදනයට අනුකූලව 2015 ජනවාරි 01 දින සිට මෙහෙයුම් පවත්වා ගෙන යනු ලැබේ.

සභාවේ පැවැත්මේ 3 වන වසර 2017 වර්ෂයේ දී සනිටුහන් කරන අතර වෛද්‍ය සමන් හේවාමාන මහතා, මහාචාර්ය රංජිත් මහානාම මහතා හා මාලිනී ජයවර්ධන මහත්මිය සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ලෙස කටයුතු කරනු ලැබේ.

## ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ පිහිටීම

සභාව විසින් එහි මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා අංක 977/18, නුවර පාර, බුළුගහ හන්දිය, කැළණිය ස්ථානගතව ඇති නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය (National Center For Non- Destructive Testing ) පිහිටි ගොඩනැඟිල්ලේ එක් මහලක් ( දළ වශයෙන් තෙවැනි මහලේ වර්ග අඩි 6500 ක ඉඩ ප්‍රමාණයක් ) සභාව විසින් කුලියට ගෙන ඇත.

## සම්පත්

2017 දෙසැම්බර් 31 දිනට සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු විද්‍යාත්මක නිලධාරීන් 16 දෙනෙකු හා එක් නීතිඥවරයකු ඇතුළත් පරිපාලන නිලධාරීන් 13 දෙනෙකු සිටී. පනත මඟින් සභාවට පවරන ලද නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා තවමත් විද්‍යාත්මක හා පරිපාලන කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවන නමුත්, සභාවේ කාර්යයන් සාර්ථකව ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් විද්‍යාත්මක උපකරණ හා කාර්යාල උපකරණ සංඛ්‍යාවක් සභාව සතුව පවතී.

# විගණන හා කළමනාකරණ කමිටු සමාලෝචනය 2017

## විගණන කමිටුවේ සාමාජිකයන්

මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද යහ පාලනය සඳහා මාර්ගෝපදේශ චක්‍රලේඛයට අනුකූලව විගණන කමිටුව ස්ථාපනය කරන ලදි.

2017 වර්ෂය සඳහා විගණන කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වූ අතර රැස්වීම් 4 ක් පවත්වන ලදි.

| | | |
|---|---|---|
| මහාචාර්ය කේ.ආර්.රංජිත් මහානාම මයා | - | විගණන කමිටුවේ සභාපති |
| ජේ.එම්.ඩී.මාලනී ජයවර්ධන මිය | - | සාමාජික |
| එස්.කේ.මලවිසූරිය මයා | - | විගණක කමිටුවේ නිරීක්ෂක, ප්‍රධාන අභ්‍යන්තර විගණක, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය |

| | | |
|---|---|---|
| ආර්.කරුණාරත්න මයා | - | කමිටුවේ නිරික්ෂක, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ , නියෝජිත |
| ජී.අයි.ගංගනාත් පෙරේරා මයා | - | ගණකාධිකාරී, මුදල් අමාත්‍යාංශය |
| ඊ.ඩී.ආර්.ප්‍රභාණි මෙනවිය | - | අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් / නීති නිලධාරි භාණ්ඩාගාර චක්‍රලේඛ අංක පීඊඩී/55 ප්‍රකාරව විගණන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි. |

## කමිටුවේ අරමුණු

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ "යහ පාලනය සඳහා මාර්ගෝපදේශ " වල නිර්වචනය කරන ලද අරමුණු සැලකිල්ලට ගනිමින් පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා විගණන කමිටුව විසින් උපරිම පරිශ්‍රමයන් සිදුකරන ලදි.

- අභ්‍යන්තර විගණන ඒකකයේ විෂය පථය තීරණය කිරීම සහ වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය කිරීම.
- අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා නිර්දේශ සහිතව අධ්‍යක්ෂ මණ්ඩලයට නිරික්ෂණ ඉදිරිපත් කරමින් භාරකාරත්ව වගකීම් පවත්වා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහායදීම.
- කමිටුවේ නිර්දේශ මත පසු විපරම් කාර්යය නියාමනය කිරීම.
- අභ්‍යන්තර විගණන / බාහිර විගණන වාර්තා සමාලෝචනය සහ ප්‍රතිකර්ම කාර්යය සඳහා කළමනාකරණයට නිර්දේශ ලබාදීම.
- සභාව ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් අනුගමනය කරන්නේ ද යන්න හා නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව එහි කටයුතු සිදුකරන්නේ ද යන්න තහවුරු කර ගැනීම.
- සභාවේ සියලු කාර්යයන් සඳහා අභ්‍යන්තර පාලන පරිපාටි ඇගයීම් කිරීම සහ එම පරිපාටිවල සරල ක්‍රියාකාරීත්වය තහවුරු කර ගැනීම.
- පිරිවැය සඵලතාවය සඳහා අයවැය වාර්තා ඇතුළත් කාර්තුමය කාර්යසාධනය සමාලෝචනය සහ නිශ්ඵල වියදම් ආදිය ඉවත් කිරීම.

## 2017 වර්ෂය තුළදී විගණන කමිටුවේ කාර්යයන්

- 2017 වර්ෂය සඳහා කෙටුම්පත් කරන ලද වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම් සමාලෝචනය කිරීම හා සංශෝධන සහිතව වාර්ෂික විගණන සැලැස්ම පිළියෙල කිරීම.
- අභ්‍යන්තර හා රජයේ විගණන වාර්තා පදනම් කර ගෙන පෙර කමිටු රැස්වීම්වල නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සමාලෝචනය සහ අවශ්‍ය අවස්ථාවල දී වැඩිදියුණු කිරීම් සඳහා තවදුරටත් නිර්දේශයන් ලබාදීම.
- වර්ෂය සඳහා අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා 2017 විගණන කමිටුව විසින් සාකච්ඡා කරන ලද අතර පහත ලැයිස්තුගත කරන ලද පරිදි අදාළ කටයුතු සිදුකිරීම සඳහා නිර්දේශ කරන ලදි.

- වර්ෂය සඳහා සභාවේ ණයගැතියන් හා ණයහිමියන් සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන්ට 2017 සිහි කැඳවීම් ලිපි යැවීම හා පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම.
- 41/90 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ඉන්ධන පරිභෝජනය පවත්වා ගැනීම හා වාහන ධාවන වාර්තා තුලනය කිරීම.
- 2017 වර්ෂය සඳහා සමීක්ෂණ මණ්ඩල පැවැත්වීම සඳහා කමිටුවක් පත්කිරීම.
- චක්‍රලේඛය ප්‍රකාරව විධිමත් ඉන්වෙන්ට්‍රි පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහ එක් එක් ශාඛාව සඳහා වෙනම ශාඛා ඉන්වෙන්ට්‍රි සංවර්ධනය කිරීමට යෝජනා කිරීම.
- කමිටු නිර්දේශ හා මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව, 2016 වර්ෂයේ දී අපහරණය කළ යුතු භාණ්ඩ අපහරණය කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා 2016 වර්ෂයේ අවසාන ගිණුම් සමාලෝචනය කිරීම.
- නව තනතුරු පිළිබඳ තොරතුරු යාවත්කාලීන කිරීම හා බැංකු ගනුදෙනු හා අනුරූපී ලිපි සඳහා යොදා ගන්නා රබර් මුද්‍රා මාරු කිරීම.
- යහ පාලනය ප්‍රකාරව විදේශ හා දේශීය පුහුණු වැඩ සටහන් සඳහා නම් කරන තැනැත්තන් තේරීම සඳහා මණ්ඩලය විසින් පුහුණු කමිටුවක් පත් කිරීම.
- සභාවට ලැබෙන සියලුම සැපයීම් හා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ පරිත්‍යාග සඳහා භාණ්ඩ ලැබීම් පත් නිකුත් කිරීම.
- 30/2016 චක්‍රලේඛය ප්‍රකාරව වාහන උපයෝජනය හා ඉන්ධන පරිභෝජනය පිළිබඳ වාර්තාවක් විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.
- විකිරණ ප්‍රවේශම් අංශ ඇතුළත්ව රෝහල් වලට බලපත්‍රදීම හා පරීක්ෂා කිරීම් කාර්යයන් අභ්‍යන්තර විගණක විසින් සිදුකරවීමට කටයුතු කිරීම.
- බස් ගාස්තු හා වෙනත් සුළු වියදම් සඳහා වියදම් දැරීමට ප්‍රතිපූර්ණ පදනම මත සතියක කාලයක් සඳහා පරිපාලන නිලධාරියාට රු.500/- ක අත්තිකාරමක් ගෙවීම.

# ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ කාර්යයන්

## රෙගුලාසි හා රීති කෙටුම්පත් කිරීම

සභාව සඳහා නෛතික අධිකාරිය ලබාගැනීම සඳහා නියෝග, රීති, හා නියමයන් රාශියක් කෙටුම්පත් කිරීම හා අනුගමනය කිරීම පනත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වේ. ව්‍යවස්ථා හා නියෝග වලට අදාළව 2017 වර්ෂයේ දී පහත සඳහන් කාර්යයන් සිදුකරන ලදි.

### අයනීකරණ විකිරණ ආරක්ෂාව පිළිබඳ නියෝග

අයනීකරණ විකිරණයෙන් ආරක්ෂාවීම පිළිබඳ කෙටුම්පත් නියෝග ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ (IAEA) අදාළ ප්‍රකාශන සමඟ සමාලෝචනය කර වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ක්ෂේත්‍රයන් හඳුනාගන්නා ලද අතර අදාළ තොරතුරු සමඟ කෙටුම්පත යාවත්කාලීන කරන ලදි.

නියෝග සැදීම සඳහා පනතේ දක්වා ඇති පහත සඳහන් ක්ෂේත්‍ර කෙටුම්පත් කරන ලද නියෝග වලින් ආවරණය වේ.

(අ) විකිරණශීලී ද්‍රව්‍ය හෝ විකිරණශීලී ප්‍රභව අපනයනය කිරීම, ආනයනය කිරීම, නැවත අපනයනය කිරීම, ගබඩා කිරීම, කැණීම, සකස් කිරීම, සැලසුම් කිරීම, නිෂ්පාදනය කිරීම, ඉදිකිරීම, කොටස් එක් රැස් කිරීම, අත්පත් කර ගැනීම, බෙදාහැරීම, විකිණීම, බදුදීම, කුලියට ගැනීම, ලැබීම, ස්ථානගත කිරීම, ස්ථාන ගතව තැබීම, සවි කිරීම, අත්කර ගැනීම, වසා දැමීම, කොටස් ගැලවීම, පාවිච්චිය හෝ අපහරණය කිරීම හා ප්‍රවිකිරණ උපකරණ සැලසුම් කිරීම, නිෂ්පාදනය කිරීම, විකිණීම, ස්ථානගත කිරීම, අත්කර ගැනීම, භාවිතා කිරීම අපනයනය හෝ ආනයනය පිළිබඳ නියෝග

(ආ) ප්‍රවිකිරණ ස්ථාන වසා දැමීම.

(ඇ) වෛද්‍ය ආවේක්ෂණය හා අයනීකරණ විකිරණ වෘත්තීමය අනාවරණය ඇතුළත්ව අයනීකරණ විකිරණයෙන් වන හානිකර බලපෑම් වලින් විකිරණ ශ්‍රමිකයන් ආරක්ෂා කර ගැනීම,

(ඈ) අයනීකරණ විකිරණවල හානිකර බලපෑම් වලින් සාමාන්‍ය මහජනතාව හා පරිසරය ආරක්ෂා කර ගැනීම.

(ඉ) රෝගීන් ආරක්ෂා කිරීම ඇතුළත්ව අයනීකරණ විකිරණය ඇතුළත්වන වෛද්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ නියෝග

(ඊ) පරිසරයට විකිරණශීලී අපද්‍රව්‍ය මුදා හැරීම හා මහජන සෞඛ්‍ය හා ප්‍රවේසම සඳහා බලපාන ඕනෑම පරිචයක් ඇතුළත්ව විකිරණශීලී අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ රෙගුලාසි

## විකිරණශීලී ප්‍රභවයන්ගේ සුරක්ෂිතතාව පිළිබඳ නියෝග

මිනිසුන් හා පරිසරය සඳහා ඉතා අනර්ථකර හානියකට හේතුවන අනුමත නොවූ කාර්යයකට විකිරණශීලී ප්‍රභවයන් යොදා ගැනීමෙන් ආරක්ෂා කිරීම සඳහා සුරක්ෂිතතාව සැපයීම ඉතා වැදගත් වේ. එබැවින් විකිරණශීලී ප්‍රභවයන් පිළිබඳ සුරක්ෂිතතාවය තහවුරු කර ගැනීමට නියෝග ක්‍රියාත්මක කිරීම ඉතාම අවශ්‍ය වේ. 86(උ) වගන්තිය යටතේ විකිරණශීලී ප්‍රභවයන් හා පාලනය කළ යුතු අයිතමයන් සම්බන්ධයෙන් සුරක්ෂිතතාව පිළිබඳ රෙගුලාසි සෑදීමට අමාත්‍යවරයාට බලය ලබාදෙයි. ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ අදාළ ප්‍රකාශන වලට අනුව සභාව විසින් කෙටුම්පත් නියෝග සමාලෝචනය කරන ලදි.

## විකිරණ සේවකයින්ගේ සුදුසුකම් සඳහා නිර්ණායකය පිළිබඳ රීති

සේවකයින්, රෝගීන් හා මහජනතාවගේ විකිරණ ආරක්ෂාව සඳහා ඉතා අවශ්‍ය වන සමහර කරුණු පිළිබඳ රීති සෑදීමට සභාවට බලයදීම පනතේ 87 වගන්තියෙන් සලසනු ලැබේ.
සභාව විසින් පත් කරන ලද කමිටුවක් විසින් 87(1)(ඇ) වගන්තිය යටතේ ඉහත රීති කෙටුම්පත් කරන ලදි. ඉහත රීතිවල පළමු කෙටුම්පත පිළියෙල කර සමාලෝචනය කරන ලදි. මෙම රීතියෙන් අයනීකරණ විකිරණ භාවිතා කරමින් අදාළ කාර්යයන් කිරීම සඳහා එක් එක් වර්ගයේ සේවකයාගේ අවම සුදුසුකම් හා සුදුසුකම් තක්සේරු කිරීම සඳහා පරිපාටි ස්ථාපිත කර ඇත.

### 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ වැරදි සම්බන්ධයෙන් නඩු ඇසීමට ඉහළ අධිකරණයක් නියම කිරීම

2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත ප්‍රකාරව, ඉහළ අධිකරණයක ඇසිය යුතු පනත යටතේ කරන ලද වැරදි ඇසීම සඳහා ඉහළ අධිකරණයක් නම් කිරීම අවශ්‍ය වේ. ඉහළ අධිකරණයක ඇසිය යුතු පනත යටතේ දී ඇති වැරදි පිළිබඳ නඩු ඇසීම සඳහා ඉහළ අධිකරණය ලෙස කොළඹ අධිකරණ කලාපයේ ශ්‍රී ලංකා මහාධිකරණය (High Court of Sri lanka Holden in the Judicial Zone of Colombo) නම් කිරීමට නියෝගයක් සභාව සමඟ ඒකාබද්ධව අධිකරණ අමාත්‍යාංශය හා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් කෙටුම්පත් කරන ලදි. සභාවෙන් හා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයෙන් අදහස් ලබා ගැනීමෙන් පසු අධිකරණ අමාත්‍යාංශය විසින් නියෝගයේ අවසාන කෙටුම්පත් සකස් කරන ලදි. එම නියෝග ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.

## ජාත්‍යන්තර, සම්මුතීන් හා ප්‍රඥප්ති ක්‍රියාත්මක කිරීම

2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ 12(ඉ), 58(2) හා 60 වගන්තිය ප්‍රකාරව න්‍යෂ්ටික ප්‍රවේසම සුරක්ෂිතතාව හා ආරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර සම්මුතීන්, චර්යා හා ප්‍රඥප්ති වලට එළඹීමට සභාවට බලය ලැබී ඇති අතර ඒ සඳහා වගකිව යුතු ද වේ. දැනටමත් බලගන්වා ඇති ජාත්‍යන්තර සම්මුතීන්, විදේශ සේවා සම්බන්ධතා හා ප්‍රඥප්ති සඳහා ශ්‍රී ලංකාවේ වගකීම් සම්පූර්ණ කිරීමට සභාව බැඳී සිටී. 2017 වර්ෂයේ දී පහත පරිශ්‍රමයන් සාර්ථකව ඉටුකරන ලදි.

### ශ්‍රී ලංකාවේ ආරක්ෂණ ගිවිසුම සඳහා වන අතිරේක චර්යා සම්බන්ධතා

දැනටමත් ශ්‍රී ලංකාව එළඹ ඇති න්‍යෂ්ටික ආයුධ පැතිරීම වැලක්වීම පිළිබඳ සම්මුතිය යටතේ අතිරේක චර්යා සම්බන්ධතාවයකට ( Additional Protocol) එළඹීම ශ්‍රී ලංකාවේ වගකීමක් වන අතර එබැවින් එම විශේෂිත කාර්යය සඵල කර ගැනීම සඳහා සභාව විසින් 2015 හා 2016 වර්ෂයන්හි දී මූලික පියවරයන් ගන්නා ලදි.

ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය සමඟ ශ්‍රී ලංකාවේ ආරක්ෂණ ගිවිසුම සඳහා අතිරේක චර්යා සම්බන්ධතාවයක් අත්සන් කිරීමේ වැදගත්කම පිළිබඳව විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරින් හා සභාවේ නිලධාරින් අතර පසුවිපරම් කාර්යයන් හා සාකච්ඡා වාර කිහිපයක් පවත්වන ලදි. අතිරේක චර්යාවන් අනුගමනය කිරීම සඳහා සහායවන පවත්නා නීති ඇගයීමේ දී සභාව විසින් විදේශ කටයුතු අමාත්‍යාංශයට සිය සහාය ලබාදෙන ලදි. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ හා න්‍යෂ්ටික ආයුධ පැතිරීම වැලැක්වීම පිළිබඳ ප්‍රඥප්තියේ අදාළ නෛතික විධිවිධාන හා මේ සම්බන්ධයෙන් වූ ආරක්ෂණ ගිවිසුම පිළිබඳව අවධානය ද යොමු කරන ලදි.

සාකච්ඡා වල ප්‍රතිඵලයක් ලෙස අතිරේක චර්යා විධි ක්‍රියාත්මක කිරීමේ දී එයට ඇතුළත් වන පාර්ශවයන් මුණ ගැසීමට හා ඔවුන්ගේ අදහස් හා නිර්දේශ ලබා ගැනීමට එකඟ වන ලදි. අදාළ පාර්ශවයන්ගේ හා නීතිපති දෙපාර්තමේන්තුවේ නිර්දේශ හා අදහස් ලබාගැනීමෙන් පසු ආරක්ෂණ ගිවිසුම් සඳහා අතිරේක චර්යා වලට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය හා විදේශ කටයුතු අමාත්‍යාංශය ඒකාබද්ධව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට තවදුරටත් එකඟ වී තිබුණි. අදාළ පාර්ශවයන්ගේ අදහස් ලබා ගැනීමෙන් පසු අතිරේක චර්යා නීතිපතිවරයාගේ නිරීක්ෂණ හා අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අතර නීතිපතිවරයාගේ නිරීක්ෂණ හා යෝජනා ලැබී තිබුණි. අතිරේක චර්යා අනුගමනය කිරීම සඳහා නීතිපතිවරයා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සිදුකරන ලදි.

### න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි ආපදාවක දී සහාය සැපයීම සඳහා සම්මුතිය හා න්‍යෂ්ටික අනතුරක දී දැනුම්දීම සඳහා සම්මුතිය

ඉහත සම්මුතින් සඳහා ශ්‍රී ලංකාව පාර්ශවයක් වන අතර පනතේ 58(2) වගන්තිය ප්‍රකාරව ඉහත සම්මුතීන් සඳහා සන්නිවේදන ඒකකය ලෙස සභාව කටයුතු කරයි. ඒ අනුව ජාත්‍යන්තර අනතුරු ඇඟවීම් ඒකකය ලෙස හා බලයලත් අධිකාරිය (විදේශ) හා බලයලත් අධිකාරිය (දේශීය) ලෙස කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකාව සියලු සන්නිවේදන තොරතුරු සපයමින් සභාවෙන් වගකිව යුතු පුද්ගලයන් නම් කර ඇත. ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ සිද්ධි හා හදිසි ආපදා මධ්‍යස්ථානය (IEC) විසින් පවත්වන ලද ක්‍රියාකාරකම් අභ්‍යාස කිහිපයක දී (Convex Exercises) සභාව සන්නිවේදන ඒකකය ලෙස සහභාගී වී ඇත.

## බලය දීම (බලපත්‍ර හා අනුමැතිය)

### බලපත්‍ර නිකුත් කිරීම

2015 අංක 1 දරන පරමාණුක බලශක්ති ( බලපත්‍ර) රීති හා 2015 අංක 1 දරන පරමාණුක බලශක්ති (පරිචයක් පැවැත්වීම සඳහා අදහස පිළිබඳ දැන්වීම) රීති අවශ්‍යතාවයන් ඉටුකිරීමට 2016 ජනවාරි 01 දින සිට බලපත්‍ර නිකුත් කිරීම ආරම්භ කරන ලදි. පරිචයන් සමඟ සම්බන්ධිත අවදානම හා සම්බන්ධිතව වර්ෂ 01, 02 හා 03 වශයෙන් බලපත්‍ර කාල පරිච්ඡේදය එකී රීති වලින් නිශ්චය කරයි. පහත සඳහන් පරිචයන් සඳහා නව බලපත්‍ර හා පවත්නා බලපත්‍ර අලුත් කිරීම් නිකුත් කරන ලදි.

- විකිරණ චිකිත්සාව ( ටෙලි තෙරපි, බ්‍රැචි තෙරපි හා රේඛීය ත්වරක)
- න්‍යෂ්ටික වෛද්‍ය ( චිකිත්සාව, ශරීරය අභ්‍යන්තරයේ හා බාහිර රෝග විනිශ්චය )
- වෛද්‍ය විකිරණ ලේඛය ( සාමාන්‍ය, දන්ත හා මැදිහත්වීම්)
- කර්මාන්ත ප්‍රවිකිරණ පිරියත ( වෛද්‍ය නිෂ්පාදන ජීවානුහරණය හා ආහාර ප්‍රවිකිරණය )
- ගැමා ප්‍රවිකිරණ කුටීර ( පර්යේෂණ, රුධිර ප්‍රවිකිරණය)

- කර්මාන්ත විකිරණ ලේඛය (ගැමා හා x- කිරණ)
- නිව්ට්‍රෝන ජනකය, න්‍යෂ්ටික ආමාන, තෙල් ළිං ගවේෂණ ප්‍රභව හා රේඛීය ත්වරකය
- විශ්ලේෂණාත්මක X-කිරණ උපකරණ, විකිරණශීලී ප්‍රභවයන් සහිත විශ්ලේෂණාත්මක උපකරණ හා කැබිනට් x-කිරණ ඒකක.
- මුද්‍රා සහිත හා මුද්‍රා රහිත විකිරණශීලී ප්‍රභවයන්
- ප්‍රවිකිරණ උපකරණ හා විකිරණශීලී ද්‍රව්‍ය ආනයනය හා අපනයනය
- විකිරණශීලී ද්‍රව්‍ය ප්‍රවාහනය
- ප්‍රවිකිරණ උපකරණ සහ විකිරණශීලී ප්‍රභවයන් සහිත උපකරණ සේවා කිරීම හා නඩත්තු කිරීම
- විකිරණශීලී අපද්‍රව්‍ය කළමනාකරණය හා ගබඩා කිරීම.
- විකිරණශීලී ප්‍රභවයන් අපහරණය කිරීම හා බෙදා හැරීම.
- විකිරණශීලී ප්‍රභවයන් හා ප්‍රවිකිරණ උපකරණ විකිණීම

## බලපත්‍ර සඳහා අලුත් කිරීමේ ඉල්ලුම් පත්‍ර

පහත සඳහන් පරිචයන් සඳහා බලපත්‍ර අලුත් කිරීමේ ඉල්ලුම්පත් ආකෘති පත්‍ර පිළියෙල කර 2018 බලපත්‍ර කාල පරිච්ඡේදය වර්ෂය සහ 2018 හා 2019 කාල පරිච්ඡේදය සඳහා ඔවුන්ගේ බලපත්‍ර අලුත් කිරීමට යොදා ගැනීම සඳහා බලපත්‍ර ලාභීන් අතර බෙදා හරින ලදි.

| අංකය | ඉල්ලුම් පත්‍රයේ නම | ආවරණය වන ප්‍රභවය | ඉල්ලුම්පත්‍ර සංකේත අංකය | අලුත් කිරීමේ කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| 01 | කර්මාන්ත වල දී, පර්යේෂණ වල දී හා අධ්‍යාපනයේ දී අයනීකරණ විකිරණය යොදා ගැනීමට බලපත්‍රයක් අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය | අංශු ත්වරක/ නිව්ට්‍රෝන ජනකය / න්‍යෂ්ටික ආමාන / තෙල් ළිං ගවේෂණ ප්‍රභව / අකුණු නිවාරක උපකරණ | IN-01-A-R ආකෘතිය | වර්ෂ 2 ක් |
| 02 | කර්මාන්තවල දී, පර්යේෂණ වල දී හා අධ්‍යාපනයේ දී අයනීකරණ විකිරණය යොදා ගැනීම සඳහා බලපත්‍රයක් අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය | මුළු සක්‍රියතාවය ගිගා බෙකරෙල් (කියුරි 1 ) 37 ට වැඩි මුද්‍රා සහිත හා මුද්‍රා රහිත ප්‍රභව | IN-01-B-R ආකෘතිය | වර්ෂ 2 ක් |

| | | | | |
|---|---|---|---|---|
| 03 | ජීවානුහරණය, ආහාර කල්තබා ගැනීම, අයනීකරණ විකිරණ යොදා ගන්නා රුධිර ප්‍රවිකිරණය සඳහා බලපත්‍රයක් අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය | වියළි ගබඩාකරණය හෝ තටාක වර්ගයේ ප්‍රවිකිරණ පහසුකම | SI-01-R ආකෘතිය | වර්ෂ 1 ක් |
| 04 | ජීවානුහරණය හා ආහාර කල්තබා ගැනීම, අයනීකරණ විකිරණ යොදා ගන්නා රුධිර ප්‍රවිකිරණය සඳහා බලපත්‍රයක් අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය | ගැමා ප්‍රවිකිරණ කුටිර/ ඉලෙක්ට්‍රෝන බීම් ත්වරක/ X-කිරණ යන්ත්‍ර | SI-02-R ආකෘතිය | වර්ෂ 2 ක් |
| 05 | අයනීකරණ විකිරණය යොදා ගන්නා කර්මාන්ත විකිරණලේඛ සඳහා බලපත්‍රයක් අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය | ගැමා / නිව්ට්‍රෝන / බෙටා විකිරණලේඛ ප්‍රභවයන් සහ X-කිරණ යන්ත්‍ර | IR-01-R ආකෘතිය | වර්ෂ 1 ක් |
| 06 | වෛද්‍ය විකිරණලේඛ පහසුකම් සඳහා බලපත්‍රයක් අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය | සාමාන්‍ය විකිරණලේඛ X-කිරණ යන්ත්‍ර / මැදිහත්වීම් විකිරණ ශීලී X-කිරණ යන්ත්‍ර හා ඇන්ජියෝග්‍රැපි X-කිරණ යන්ත්‍ර / සීටී ස්කැනර් / මැමොග්‍රැපි X-කිරණ යන්ත්‍ර | MR-01-R ආකෘතිය | වර්ෂ 2 ක් |
| 07 | ගුවන් මගින් ප්‍රවාහනය කරනු ලබන විකිරණශීලී ප්‍රභවයන් ගබඩා කිරීම හා පරිහරණය කිරීම සඳහා යොදා ගන්නා පහසුකම් සඳහා බලපත්‍රයක් අලුත් කිරීමේ ඉල්ලුම් පත්‍රය | සියලු ප්‍රභවයන් | SH-01-R ආකෘතිය | වර්ෂ 1 ක් |
| 08 | රෝග චිකිත්සා සඳහා මුද්‍රා රහිත ප්‍රභවයන් යොදා ගන්නා විකිරණ වෛද්‍ය පහසුකම් සඳහා බලපත්‍රයක් අලුත් කිරීමේ ඉල්ලුම් පත්‍රය | සියලු ප්‍රභවයන් | NM-01-R ආකෘතිය | වර්ෂ 1 ක් |
| 09 | ශරීර අභ්‍යන්තරයේ හෝ බාහිර රෝග විනිශ්චය සඳහා මුද්‍රා රහිත ප්‍රභවයන් යොදා ගන්නා විකිරණ වෛද්‍ය පහසුකම් සඳහා බලපත්‍රයක් අලුත් කිරීමේ ඉල්ලුම් පත්‍රය | සියලු ප්‍රභවයන් | NM-02-R ආකෘතිය | වර්ෂ 2 ක් |

| | | | | |
|---|---|---|---|---|
| 10 | විකිරණශීලී ප්‍රභවයන් ප්‍රවාහනය සඳහා බලපත්‍රයක් අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය | සියලු ප්‍රභවයන් | TR-01-R ආකෘතිය | වර්ෂ 1 ක් |
| 11 | අයනීකරණ විකිරණ යොදා ගන්නා විකිරණ චිකිත්සා පහසුකම් සඳහා බලපත්‍රයක් අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය | ටෙලි - ගැමා පහසුකම / ගැමා නයිෆ් පහසුකම / බ්‍රැචි තෙරපි පහසුකම | RT-01-R ආකෘතිය | වර්ෂ 1 ක් |
| 12 | අයනීකරණ විකිරණ යොදා ගන්නා විකිරණ චිකිත්සා පහසුකම් සඳහා බලපත්‍රයක් අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය | රේඛීය ත්වරක පහසුකම / ටොමොතෙරපි පහසුකම / තුලස්ථ x - කිරණ පහසුකම / චිකිත්සා අනුකරණ | RT-02-R ආකෘතිය | වර්ෂ 2 ක් |

බලපත්‍ර අලුත් කිරීමේ අවසාන දිනය වන 2017 සැප්තැම්බර් 30 දිනට පෙර සභාව වෙත ලැබුණු බලපත්‍ර අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර බලපත්‍ර ගාස්තු ගෙවීමෙන් පසු බලපත්‍ර නිකුත් කිරීම සඳහා සලකා බලන ලද අතර මෙම අවසාන දිනයට පසු ලැබුණු ඉල්ලුම් පත්‍ර සඳහා බලපත්‍ර ගාස්තුව හා ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය සඳහා ගාස්තුවක් ද අයකිරීමෙන් පසුව බලපත්‍ර නිකුත් කිරීම සඳහා සලකා බලන ලදි.

2018 වර්ෂය සඳහා බලපත්‍ර අලුත් කිරීමේ ඉල්ලුම් පත්‍ර ක්‍රියාවලිය සමාලෝචනය කිරීමේ දී සභාවේ විකිරණ ආරක්ෂා අවශ්‍යතාවන් සහිත පහසුකමට අනුකූල වීමේ ප්‍රවේශය සඳහා කලින් පරීක්ෂණ කෙරෙහි සභාව සැලකිලිමත් විය. බලපත්‍ර නිකුත් කිරීමට පෙර සියලු නව පහසුකම් පරීක්ෂා කරන ලදි.

සමාලෝචන ක්‍රියාවලියට සමාන්තරව එක් එක් වර්ගයේ බලපත්‍ර වලට අදාළ වන ඉල්ලුම් පත්‍ර ක්‍රියාවලි ගාස්තුව හා බලපත්‍ර ගාස්තුවක් හා අදාළ අධිභාර ගාස්තුව ලබා ගැනීමට වැඩ පිළිවෙලක් සකස් කරන ලදි.

## බලපත්‍ර වෙනස් කිරීම

පරිචයක් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා පනතේ 27(1) වගන්තියේ හඳුනාගන්නා ලද එක් හෝ වැඩි අවස්ථාවක දී බලපත්‍ර වෙනස් කිරීම අවශ්‍ය වේ. ඒ අනුව වෙනස් කිරීම් ඉල්ලුම් කරන ලද පරිචයන් සඳහා පවත්නා බලපත්‍රයන්ට වෙනස් කිරීම් සිදුකරන ලදි.

## අතුරු බලපත්‍රයක් නිකුත් කිරීම

පනතේ 28(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, 2017 සැප්තැම්බර් 30 අවසාන දිනට පසුව ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරන ලද ඉල්ලුම්කරුවන් සඳහා පවත්නා බලපත්‍රය අවසන් වීමට පෙර මෙම ප්‍රමාද ඉල්ලුම් පත්‍ර සඳහා බලපත්‍ර නිකුත් කිරීමට අවශ්‍ය සමාලෝචන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට කාලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් පවත්නා බලපත්‍රයක අළුත්කරගැනීමේ කොන්දේසියට යටත්ව අතුරු බලපත්‍ර නිකුත් කරන ලදි.

### සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව

| බලපත්‍ර වර්ගය | නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|
| පවත්නා පරිචයන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම (නව හා අලුත් කිරීම්) | 369 |
| බලපත්‍ර වෙනස් කිරීම් නිකුත් කිරීම | 21 |
| අතුරු බලපත්‍ර නිකුත් කිරීම් | 70 |
| එකතුව | 460 |

### ප්‍රවිකිරණ කාමර සඳහා අනුමැතිය

කාමර සඳහා සපයන ලද ප්‍රවේශම හා ආරක්ෂක පැති සැලකිලිමත්ව තක්සේරු කිරීමෙන් පසු නව පහසුකම්වල ප්‍රවිකිරණ කාමර සැලසුම් සඳහා අනුමැතිය ලබා දෙන ලදි. පහත සඳහන් පරිචයන් වලදී ප්‍රවිකිරණ කාමර සැලසුම් 118 කට 2017 වර්ෂයේ දී අනුමැතිය ලබාදෙන ලදි.

| පරිචය / ප්‍රභවය | අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද කාමර සැලසුම් සංඛ්‍යාව | අනුමත කරන ලද කාමර සැලසුම් සංඛ්‍යාව |
|---|---|---|
| වෛද්‍ය පහසුකම් (X-කිරණ) | 98 | 94 |
| විකිරණ වෛද්‍ය පහසුකම් | 6 | 6 |
| කර්මාන්ත පහසුකම් (X-කිරණ) | 15 | 14 |
| කර්මාන්ත පහසුකම් (ගැමා) | 7 | 3 |
| රසායනාගාර | 2 | 1 |

### දේශීය වෙළඳපොළට ආනයනය කරන ලද කිරි ආහාර මුදා හැරීම සඳහා සහතිකපත් නිකුත් කිරීම

පරීක්ෂා කරන ලද කිරි ආහාර සාම්පල සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් නිකුත් කරන ලද රසායනාගාර පරීක්ෂණ වාර්තා වල ප්‍රතිඵල පදනම් කර ගෙන දේශීය වෙළඳපොළට ආනයනය කළ කිරි ආහාර මුදා හැරීම සඳහා ආහාර හා ඖෂධ පරීක්ෂකට සහතික නිකුත් කරන ලදි. නිකුත් කරන ලද සහතික පත් සංඛ්‍යාව 967 කි.

### වාර්තා පවත්වා ගැනීම

විකිරණශීලී ප්‍රභවයන් සඳහා ලේඛනයක් හා බලපත්‍ර සඳහා දත්ත පදනමක් පවත්වා යාවත්කාලීන කරන ලදි. බලපත්‍රලාභීන්ගේ නම් හා වෙනත් අදාළ තොරතුරු මහජනයාගේ දැන ගැනීම සඳහා සභාවේ නිල වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කර කාලීනව යාවත්කාලීන කර ඇත.

2016 ජනවාරි මාසයේ දී ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතන උපදේශක දූත කණ්ඩායම ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේ දී සාමාජික රාජ්‍යයන්හි නියාමන තොරතුරු කළමනාකරණය කිරීම සඳහා " නියාමන අධිකාරී තොරතුරු පද්ධතිය " ( Regulatory Authority Information System) ලෙස හඳුන්වන නව මෘදුකාංගයක් ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය විසින් සංවර්ධනය කර ඇති බව අනාවරණය විය. සභාවේ නියාමන තොරතුරු පද්ධතියේ නව සංස්කරණය ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයෙන් ලබාගැනීම සඳහා සභාව විසින් ඉල්ලීමක් කරන ලදි. සභාව විසින් එය ඉල්ලුම් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, නියාමන අධිකාරි තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා මෘදුකාංගයක් හා අවශ්‍ය උපකරණ ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය විසින් එවා තිබුණි. 2018 මාර්තු මාසයේ දී ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතන විශේෂඥ දූත කණ්ඩායම විසින් එය ලබාදීමට එකඟ වීමෙන් පසු එම නියාමන අධිකාරී තොරතුරු පද්ධතිය සවි කිරීම හා එම පද්ධතිය භාවිතා කිරීම සඳහා නිලධාරින් පුහුණු කිරීම 2018 මාර්තු මාසයේ දී සිදු කරනු ඇත.

## ආනයන හා අපනයන පාලනය සඳහා අනුමැතිය

නියෝග වලට අනුකූලවීම සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍ර සමාලෝචනය කිරීමෙන් පසු විකිරණශීලී ද්‍රව්‍ය හා ප්‍රවිකිරණ උපකරණ ආනයනය හා අපනයනය සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදි. ප්‍රභවයන් ප්‍රවාහනයේ දී ප්‍රවේසම හා සුරක්ෂිතතාව සඳහා ඉදිරිපත් කරන ලද ලියකියවිලි පරීක්ෂා කිරීමෙන් පසුව රේගු නිෂ්කාෂණය සඳහා අනුමැතින්ද නිකුත් කරන ලදි.

2017 වර්ෂයේ දී ප්‍රභවයන් ආනයනය හා අපනයනය පාලනය සඳහා නිකුත් කරන ලද අනුමැතින් සංඛ්‍යාව 564 ක් විය.



අපනයන අනුමැතිය සඳහා විකිරණශීලී පැකේජයක් පරීක්ෂා කිරීම

සමහර අවස්ථා වල දී අපනයනය සඳහා බලයදීමේ ආකෘතිවල ලබා දී ඇති තොරතුරු පරික්ෂා කිරීම සඳහා පරික්ෂණයන් සිදුකළ යුතුවූ අතර ප්‍රවාහන පැකේජය ජාත්‍යන්තර ප්‍රවාහන රෙගුලාසි වලට අනුකූලද යන්නද පරික්ෂා කළ යුතු විය. 2017 වර්ෂය තුළ දී එවැනි අපනයනයන්ට අදාළව පරික්ෂණ 9 ක් සිදුකරන ලදි.

විකිරණශීලී ප්‍රභවයන් 1 හෝ 2 වර්ගය ආනයනය කිරීම සඳහා හා එම වර්ගයේම ක්ෂය වූ විකිරණශීලී ප්‍රභවයන් නැවත අපනයනය කිරීම සඳහා අනුමැතින් ලබාදීම ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ විකිරණශීලී ප්‍රභවයන්ගේ ප්‍රවේසම හා සුරක්ෂිතතාව පිළිබඳ චර්යා සංග්‍රහය හා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ ආනයන හා අපනයන මඟ පෙන්වීම් ලියවිල්ල ප්‍රකාරව සිදුකරන ලදි.

## ප්‍රවේසම් පරීක්ෂණ හා බලගැන්වීම

පනතේ 15 වගන්තිය ප්‍රකාරව පත් කරන ලද බලයලත් පරික්ෂකවරුන් විසින් පරීක්ෂණ සිදුකරන ලදි. නිවේදනය කර හෝ නොකරන ලද පරීක්ෂාවන් ලෙස පරීක්ෂණ පැවැත්වීම සඳහා සභාවට බලතල ලැබී ඇත. පරීක්ෂණ වල දී සපයන ලද ප්‍රවේසම් ක්‍රම හා සුරක්ෂිතතා වැඩ පිළිවෙලවල් ඉල්ලුම්පත්‍ර වල ලබාදී ඇති තොරතුරු වලට අනුකූල වන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා පහසුකම් හා ප්‍රභවයන් සඳහා සපයන ලද සුරක්ෂිතතා ක්‍රම හා ප්‍රවේසම් වැඩ පිළිවෙලවල් පරික්ෂකවරුන් විසින් පරීක්ෂා කෙරේ. පරිචයන් සම්බන්ධිත අවදානම මත පදනම්ව බලපත්‍ර පහසුකම් ක්‍රමවත්ව පරීක්ෂා කරන අතර බලපත්‍ර පහසුකම් සඳහා පරීක්ෂණ කාල පරිච්ඡේදයන් වාර්ෂිකව, වර්ෂ දෙකක දී හා වර්ෂ තුනක දී යනුවෙන් පහසුකම් වර්ගය මත පදනම්ව සිදු කෙරේ. නව පහසුකම් සඳහා බලපත්‍ර විකිරණ ආරක්ෂා පරීක්ෂා වලින් පසුව පමණක් නිකුත් කරනු ලැබේ. සිදුකරන ලද පරීක්ෂණ වල තොරතුරු ඇතුළත් දත්ත පදනම පවත්වා ගෙන යන අතර කාලානුරූපව යාවත්කාලීන කරනු ලැබේ.

## කර්මාන්ත යෙදවුම් සඳහා පරීක්ෂණ

විකිරණශීලි ද්‍රව්‍ය සහිත ආනයන බහලුම්, විකිරණ මාන, පර්යේෂණ පහසුකම්, කර්මාන්ත ප්‍රවිකිරණයන් යනාදිය කර්මාන්ත යෙදවුම් යටතේ ප්‍රධාන වශයෙන් පරීක්ෂාවට භාජනය කරනු ලබයි.




කොළඹ වරායේ සවිකරන ලද පෝටල් මොනිටරය මඟින් කලින් විකිරණ කාරක හඳුනාගත් බහාලුමක් සඳහා ශ්‍රීලංපබනි නිලධාරීන් විසින් විකිරණ කාරක පිළිබඳ සත්‍යාපන පරීක්ෂාව

### කර්මාන්ත යොදා ගැනීම් වලදී සිදුකරන ලද පරීක්ෂණ පිළිබඳ තොරතුරු

| කාලය | පරිචය / ප්‍රභවය | පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|---|
| වාර්ෂිකව | - කර්මාන්ත ප්‍රවිකිරණයන් (තටාක ප්‍රවිකිරණයන්)<br>- කර්මාන්ත විකිරණලේඛ පහසුකම් | 05 |

| | | |
|---|---|---|
| වර්ෂ 2 කට වරක් | - ස්ව ආරක්‍ෂිත ගැමා ප්‍රවිකිරණ /X-කිරණ යන්ත්‍ර<br>- න්‍යෂ්ටික ආමාන සහ තෙල් ළිං ගවේෂණ ප්‍රභව<br>- අංශු ත්වරකය<br>- අකුණු නිවාරකය<br>- මුළු සක්‍රියතාව ගිගා බෙකරෙල් 37 (1 කියුරි) කට වැඩි මුද්‍රා සහිත හා මුද්‍රා රහිත ප්‍රභවයන් | 19 |
| වර්ෂ 3 කට වරක් | - විකිරණශීලී ප්‍රභවයන් අඩංගු විශ්ලේෂණ උපකරණ<br>- විශ්ලේෂණ X-කිරණ උපකරණ<br>- කැබිනට් X-කිරණ ඒකක<br>- මුළු සක්‍රියතාව ගිගා බෙකරෙල් 37 (1 කියුරි) කට අඩු මුද්‍රා සහිත හා මුද්‍රා රහිත ප්‍රභවයන් | 27 |

2017 වර්ෂයේ දී කර්මාන්ත යෙදවුම් සඳහා සිදුකරන ලද මුළු පරීක්ෂණ සංඛ්‍යාව 51 කි.

## වෛද්‍ය භාවිතයන් පිළිබඳ පරීක්ෂණ

අයනීකරණ විකිරණ විමෝචනය වන රෝග විනිශ්චය හා චිකිත්සක යන්ත්‍ර පිළිබඳ විකිරණ ආරක්ෂක අවශ්‍යතාවයන්ට අනුකූලවීම පරීක්ෂා කිරීම සඳහා වෛද්‍ය පහසුකම් වල පරීක්ෂණ සිදුකරනු ලැබේ.



රෝග විනිශ්චය සඳහා භාවිතා කරන X-කිරණ යන්ත්‍රයක් පරීක්ෂා කිරීම



පිළිකා ප්‍රතිකාර සඳහා යොදා ගන්නා විකිරණ චිකිත්සා යන්ත්‍රයක් පරීක්ෂා කිරීම

### වෛද්‍ය භාවිතයන්හි දී සිදුකරන ලද පරීක්ෂණ පිළිබඳ තොරතුරු

| කාලය | පරිචය / ප්‍රභවය | පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|---|
| වාර්ෂික | - ටෙලි ගැමා පහසුකම<br>- බ්‍රැචි තෙරපි පහසුකම<br>- න්‍යෂ්ටික වෛද්‍ය පහසුකම් (මුද්‍රා රහිත ප්‍රභවයන් යොදා ගන්නා චිකිත්සාව) | 8 |

| | | |
|---|---|---|
| වර්ෂ 2 කට වරක් | - සීටී ස්කෑනර්<br>- මැමෝග්‍රැපි යන්ත්‍රය<br>- සාමාන්‍ය විකිරණ ලේඛ යන්ත්‍රය<br>- මැදිහත්වීම් විකිරණශීලී X-කිරණ ඒකකය /ඇන්ජියෝග්‍රෑම් ඒකකය<br>- රේඛීය ත්වරක පහසුකම<br>- ටොමෝ තෙරපි පහසුකම<br>- X-කිරණ පහසුකම<br>- චිකිත්සා සඳහා සීටී සිමියුලේටර්<br>- න්‍යෂ්ටික වෛද්‍ය පහසුකම (රෝග නිර්ණය හා රේඩියෝ ඉමියුනෝ ඇසේ (RIA) | 146 |
| වර්ෂ 3 කට වරක් | - දන්ත X-කිරණ යන්ත්‍රය<br>- පශු වෛද්‍ය X-කිරණ යන්ත්‍රය<br>- අස්ථි ඝනත්ව ස්කෑනර් යන්ත්‍රය | 36 |

2017 වර්ෂයේ දී වෛද්‍ය යොදා ගැනීම් පිළිබඳව පවත්වන ලද පරික්ෂණ සංඛ්‍යාව 190 කි.

## න්‍යෂ්ටික හා වෙනත් විකිරණශීලී ද්‍රව්‍ය පිළිබඳ සුරක්ෂිතතාව

විකිරණශීලී ප්‍රභවයන් පිළිබඳව සුරක්ෂිතතා ක්‍රම හා ප්‍රවේසම පිළිබඳ ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ (IAEA) චර්යා පරිපාටි සංග්‍රහය හා විකිරණශීලී ප්‍රභවයන් ආනයනය හා අපනයනය පිළිබඳව මාර්ගෝපදේශ සංග්‍රහය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාව සම්පූර්ණයෙන් බැඳී සිටින බව ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයට ශ්‍රී ලංකාව විසින් සහතිකයක් ලබා දී ඇත.

"විකිරණශීලී ප්‍රභවයන් පිළිබඳව සුරක්ෂිතතා ක්‍රම හා ප්‍රවේසම පිළිබඳ චර්යා පරිපාටි සංග්‍රහය" විකිරණශීලී ප්‍රභවයන්හි සුරක්ෂිතතාව පිළිබඳ කේන්ද්‍ර කර ගත් නිත්‍යානුකූලව නොබැඳුනු ජාත්‍යන්තර ලියවිල්ලකි. එසේම විකිරණශීලී ප්‍රභවයන් ආනයනය හා අපනයනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය ඉහළ ක්‍රියාකාරී විකිරණශීලී ප්‍රභවයන් ප්‍රවාහනයේ දී ප්‍රවේශම හා සුරක්ෂිතතාව සඳහා අවශ්‍යතා සපයන නොබැඳුණු ලියවිල්ලකි.

චර්යා සංග්‍රහයේ අවශ්‍යතාවයන් අනුගමනය කිරීම සඳහා පහත සඳහන් පියවරයන් සභාව විසින් ගෙන ඇත.

- ඉහළ ක්‍රියාකාරී විකිරණශීලී ප්‍රභවයන් යොදා ගන්නා ස්ථාන සඳහා භෞතික ආරක්ෂා වැඩ සටහන් හඳුන්වාදීම.
- පාලනය නොවුණු ප්‍රභවයන් සොයා ගැනීම සඳහා ප්‍රභව සෙවීමේ වැඩ සටහන් පැවැත්වීම හා පාවිච්චි නොකළ හා පාවිච්චි කළ විකිරණශීලී ප්‍රභවයන් එකතු කිරීම.
- විකිරණ ප්‍රභවයන්ගේ සුරක්‍ෂිතතාව පිළිබඳව අදාළ පාර්ශවයන් සඳහා පුහුණු වැඩසටහන් ලබාදීම හා සිද්ධි ප්‍රතිචාර පිළිබඳව විශේෂ කාර්ය බලකා නිලධාරින් පුහුණු කිරීම.

- බලපත්‍ර නිකුත් කිරීම සඳහා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ වර්ග - 1 ප්‍රභවයන් යොදා ගන්නා පහසුකම් සඳහා අවම විකිරණශීලී සුරක්ෂිතතා අවශ්‍යතාවයන් හඳුන්වාදීම.

## භෞතික ආරක්ෂණ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම

ඉහළ ක්‍රියාකාරී ප්‍රභවයන් භාවිතා වන පහසුකම් වලදී හා ප්‍රවාහනයේ දී න්‍යෂ්ටික සුරක්ෂිතතාව ශක්තිමත් කිරීම සඳහා විශේෂඥතාවය හා අරමුදල් ශ්‍රී ලංකාවට නොමැතිවීම හේතුවෙන්, ජාත්‍යන්තර අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමට හා විකිරණ සුරක්ෂිතතාව ශක්තිමත් කිරීම සඳහා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ (IAEA) සහාය හා ගෝලීය බලශක්ති ද්‍රව්‍ය සුරක්ෂිතතාව පිළිබඳ එක්සත් ජනපද බලශක්ති දෙපාර්තමේන්තුවේ (GMS) වැඩ සටහන් සහාය ලබාගන්නා ලදි. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ පහත සඳහන් කාර්යයන් සිදුකරන ලදි.

### ප්‍රවිකිරණ පහසුකම් සඳහා භෞතික සුරක්ෂිතතාව ලබාදීම

ඇමෙරිකා එක්සත් ජනපදයේ GMS වැඩ සටහන සමඟ ඒකාබද්ධව ඉහළ ක්‍රියාකාරී විකිරණ ප්‍රභවයන් යොදා ගන්නා පහත සඳහන් පහසුකම් සඳහා භෞතික ආරක්ෂාව සපයන ලදි.

| පහසුකමේ නම | පහසුකමේ ස්වභාවය | සුරක්ෂිතතාවය සමඟ කාමර සංඛ්‍යාව |
|---|---|---|
| ජාතික පිළිකා ආයතනය, මහරගම | විකිරණ චිකිත්සා කාමර | 04 |
| පිළිකා ඒකකය, ශික්ෂණ රෝහල, මහනුවර | විකිරණ චිකිත්සා කාමර | 02 |
| පිළිකා ඒකකය, ශික්ෂණ රෝහල, ගාල්ල | විකිරණ චිකිත්සා කාමර | 01 |
| පිළිකා ඒකකය, මහ රෝහල, අනුරාධපුරය | විකිරණ චිකිත්සා කාමර | 01 |
| පිළිකා ඒකකය, පළාත් මහ රෝහල, බදුල්ල | විකිරණ චිකිත්සා කාමර | 01 |
| පිළිකා ඒකකය, මූලික රෝහල, තෙලිප්පලෙයි, යාපනය | විකිරණ චිකිත්සා කාමර | 01 |
| ශ්‍රී ලංකා ගැමා ප්‍රවිකිරණ මධ්‍යස්ථානය, බියගම | තටාක ප්‍රවිකිරණ | 01 |
| ඇන්සල් ලංකා ලිමිටඩ්- ප්‍රවිකිරණ 1 බියගම | තටාක ප්‍රවිකිරණ | 01 |
| මානව පටක බැංකුව, කොළඹ 07 | ස්වයං ආවරණ ප්‍රවිකිරණ | 01 |
| ආසිරි සර්ජිකල් රෝහල, නාරාහේන්පිට | රුධිර ප්‍රවිකිරණ ප්‍රභව | 01 |

න්‍යෂ්ටික සුරක්ෂිතතාවය හඳුන්වාදීම සඳහා පහත සඳහන් නව පහසුකම් සඳහා අමෙරිකා එක්සත් ජනපදයේ බලශක්ති දෙපාර්තමේන්තුවේ සුරක්ෂිතතා විශේෂඥයින්ගේ සහභාගීත්වය සහිතව තක්සේරු පරීක්ෂා සිදුකරන ලදි.

- ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ අලුතින් ස්ථාපිත කරන ලද පාවිච්චි කළ විකිරණශීලී ප්‍රභවයන් ගබඩා කිරීමේ පහසුකම

- උද්‍යාන වගා පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ අලුතින් ස්ථාපිත කරන ලද ස්ව ආරක්ෂිත ගැමා ප්‍රවිකිරණ පහසුකම

**ඇමෙරිකා එක්සත් ජනපද බලශක්ති දෙපාර්තමේන්තුවේ ගෝලීය ද්‍රව්‍ය සුරක්ෂිතතා (GMS) වැඩ සටහන යටතේ අදාළ පාර්ශ්වයන් පුහුණු කිරීම**

ඇමෙරිකා එක්සත් ජනපද බලශක්ති දෙපාර්තමේන්තුවේ (USDOE) ගෝලීය ද්‍රව්‍ය සුරක්ෂිතතා වැඩ සටහන (GMS) සමඟ ඒකාබද්ධව පහත සඳහන් පුහුණු පාඨමාලා පවත්වන ලදි.

| පුහුණුව / වැඩ මුළුවේ නම | කාලය | ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| පිරික්සීම හා සුරක්ෂිතතා තිරසාරත්වය වැඩිදියුණු කිරීම, තාත්විකව , යොදා ගැනෙන අන්තර් ක්‍රියාකාරරීත්ව ඉගෙනුම් පද්ධති (RAILS) පුහුණු පාඨමාලාව | 2017 පෙබරවාරි 27 | සිනමන් ලේක් සයිඩ්, කොළඹ, ශ්‍රී ලංකාව | 10 |
| ඇමෙරිකා එක්සත් ජනපද බලශක්ති දෙපාර්තමේන්තුවේ GMS වැඩ සටහන විසින් පරිත්‍යාග කරන ලද සෝදිසි උපකරණ නඩත්තුව, ක්‍රමාංකනය හා භාවිතය | 2017 පෙබරවාරි 28 | සිනමන් ලේක් සයිඩ්, කොළඹ, ශ්‍රී ලංකාව | 9 |
| ORTEC ගැමා වර්ණාවලික්ෂවේදය පද්ධතිය පිළිබඳ මෙහෙයුම් පුහුණුව | 2017 මාර්තු 02 | සිනමන් ලේක් සයිඩ්, කොළඹ, ශ්‍රී ලංකාව | 9 |
| ජාතික විකිරණශීලී තර්ජන ප්‍රතිචාර චර්යා (NRTRP) සංවර්ධන වැඩ මුළුව | 2017 මාර්තු 6 සිට 9 | ගලදාරි හෝටලය, ලෝටස් පාර, කොළඹ 01 | 17 |
| ආරක්ෂණය හා ව්‍යාප්තිය වැළැක්වීම ශක්තිමත් කිරීමේ රජයේ කාර්ය භාරය සම්බන්ධ අතිරේක චර්යා පිළිබඳ ජාත්‍යන්තර ආරක්ෂණ වැඩ මුළුව | 2017 අප්‍රේල් 25 සිට 27 | හිල්ටන් රෙසිඩන්සීස්, කොළඹ, ශ්‍රී ලංකාව | 28 |
| ජාතික විකිරණ ශීලී තර්ජන ප්‍රතිචාර සංග්‍රහය පිළිබඳ (NRTRC) (Table Top Exercise) මේස මත පුහුණුව | 2017 සැප්තැම්බර් 12 සිට 13 | බෙන්තොට , ශ්‍රී ලංකාව | 27 |



ආරක්ෂණ සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා වගකියන නියෝජිතායතන සඳහා පවත්වන ලද ජාත්‍යන්තර ආරක්ෂණ පිළිබඳ වැඩමුළුව



අදාළ පාර්ශ්වයන් සඳහා න්‍යෂ්ටික ආරක්ෂාව පිළිබඳ වැඩමුළුව පැවැත්වීම

### සුරක්ෂිතතාව පිළිබඳ නියාමන පද්ධතිය ශක්තිමත් කිරීම

විකිරණශීලී ප්‍රභවයන් පිළිබඳ සුරක්ෂිතතාවය පිළිබඳව රෙගුලාසි කෙටුම්පත් කිරීම සඳහා සභාව විසින් පියවර ගෙන ඇති අතර මෙම රෙගුලාසි වල පළමු කෙටුම්පත සකස් කර අවසන් කර ඇත. විශේෂ කාර්ය බලකා පුහුණු විද්‍යාලය විසින් පවත්වන ලද පුහුණු වැඩසටහන් විෂය නිර්දේශයට න්‍යෂ්ටික ආරක්ෂාව ඇතුළත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලදි. ස්ථාපිත කරන ලද සුරක්ෂිතතා පද්ධතිවල අනුකූලතාව ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ඇද්දැයි පරීක්ෂා කිරීම සඳහා එම පරීක්ෂා කිරීම් වලදී යොදා ගැනීමට පරීක්ෂණ ලැයිස්තුවක් (Check List ) පිළියෙළ කරන ලදී. ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ 1 - වර්ගය, විකිරණ පහසුකම් සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතීන්වල අවශ්‍යතා සමඟ සුරක්ෂිතතා වැඩ සටහනක් අදාල ආයතනවල පිළියෙල කර ඇද්දැයි බැලීම සඳහා හා ලබාදී ඇති සුරක්ෂිතතාව ප්‍රමාණවත් දැයි පරීක්ෂා කිරීමට සභාවේ විකිරණ ආරක්ෂාව පිළිබඳ නිලධාරීන් පුහුණු කරන ලද අතර ඉහත පරීක්ෂණ ලැයිස්තුව පදනම් කර ගෙන වැඩිදියුණු කිරීම් සඳහා නිර්දේශ ද සිදුකරන ලදි. ඇමෙරිකා එක්සත් ජනපදයේ බලශක්ති දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව සභාව විසින් ජාතික විකිරණශීලී තර්ජන ප්‍රතිචාර සංග්‍රහයක් (National Radiological Theft Response Code) කෙටුම්පත් කරන ලද අතර කෙටුම්පත සමාලෝචනය කිරීමට අදාළ පාර්ශව සමඟ රැස්වීම් 2 ක් පවත්වන ලදි. 2018 වර්ෂයේ පළමු කාර්තු 2 ඇතුළත අවසාන කෙටුම්පත නිම කරනු ඇත. විකිරණශීලී සුරක්ෂිතතා සිද්ධියක දී මෙම ප්‍රතිචාර සැලැස්ම ප්‍රතිචාර පිළිබඳව කාර්යක්ෂම හා කාලීන සම්බන්ධීකරණයට පහසුකම් සලසනු ඇත.

## විකිරණශීලී අප ද්‍රව්‍ය කළමනාකරණය හා විකිරණශීලී ද්‍රව්‍ය ප්‍රවාහනය

### අපද්‍රව්‍ය කළමනාකරණය

විධිමත් සුරක්ෂිතතාවයක් නොමැතිව විවිධ ස්ථානවල ගබඩා කරන ලද විකිරණශීලී තෙත මාන 10 ක් සභාව විසින් එකතු කර සභාවට අයත් මධ්‍යම අපද්‍රව්‍ය ගබඩා කිරීමේ පහසුකමහි ගබඩා කරන ලදි. මෙම ප්‍රභවයන් සභාව විසින් සිදුකරන ලද නියාමන පරීක්ෂණ වල දී සොයා ගන්නා ලදි.

සභාවට අයත් මධ්‍යම අප ද්‍රව්‍ය ගබඩා පහසුකමහි ගබඩා කරන ලද සියලු විකිරණශීලී අපද්‍රව්‍ය සභාව විසින් විවිධ විකිරණ නියුක්ලයිඩ වලට වෙන් කරන ලද අතර දූෂ්‍ය වූ ප්‍රභවයන් හඳුනා ගන්නා ලදි. මෙම දූෂ්‍ය වූ ප්‍රභවයන් පොලිතින් මළුවල අසුරා තවදුරටත් දූෂ්‍ය වීම වැලැක්වීම සඳහා මුද්‍රා තබන ලදි.



ප්‍රභවයන් සහිත බහාලුම් නව ගබඩා පහසුකමට මාරු කිරීම



ප්‍රභවයන් සුරක්ෂිතව නව ගබඩා පහසුකමහි ගබඩා කරන ලදි.

නව කැළණි පාලම ඉදිකිරීම පහසු කරලීම සඳහා සභාවට අයත් පැරණි මධ්‍යම අපද්‍රව්‍ය ගබඩා කිරීමේ පහසුකම කඩා දැමීමට හේතු වූ බැවින් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට අයත් අලුතින් ඉදිකළ පාවිච්චි කළ ප්‍රභව ගබඩා කිරීමේ පහසුකම (Spent Source Storage Facility) සඳහා මාරු කළ යුතු ප්‍රභවයන් ගබඩා කිරීම සඳහා සුදුසු බහාලුම් පිළියෙල කරන ලෙස ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදි.

මධ්‍යම අපද්‍රව්‍ය ගබඩා කිරීමේ පහසුකමහි ගබඩා කර තිබූ සියලුම විකිරණශීලී ප්‍රභවයන් සභාවේ අධීක්ෂණය යටතේ ප්‍රභවයන් පිළිබඳ ප්‍රවේසම තහවුරු කර ගැනීමෙන් පසුව පාවිච්චි කළ ප්‍රභව ගබඩා කිරීමේ පහසුකම සඳහා මාරු කරන ලදි. ප්‍රභවයන් පිළිබඳ ඉන්වෙන්ට්‍රි පිළියෙල කර සභාව යටතේ පැවති සියලු ප්‍රභවයන් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට භාරදීමට කටයුතු කරනු ලැබ ඇත.

## විකිරණශීලී ද්‍රව්‍ය ප්‍රවාහනයේ දී සුරක්ෂිතතාව

විශේෂ කාර්ය බලකාය (STF) හා ශ්‍රී ලංකා පොලිසිය සමඟ ඒකාබද්ධව ප්‍රවාහනයේ දී ඉහළ ක්‍රියාකාරී විකිරණ ප්‍රභවයන්ට (1 ප්‍රභව වර්ගය) සුරක්ෂිතතාව ලබාදීම සඳහා සභාව විසින් සම්බන්ධීකරණය කරන ලදි. පිළිකා සඳහා ප්‍රතිකාර කිරීම සඳහා යොදා ගනු ලබන කොබෝල්ට් - 60 විකිරණ චිකිත්සා ප්‍රභවයන් ප්‍රවාහනය කිරීම සඳහා කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සිට කැළණිය ගබඩා පහසුකම් සඳහා හා ඊළඟට කැළණිය සිට ශික්ෂණ රෝහල කරාපිටිය, ශික්ෂණ රෝහල මහනුවර හා අපේක්ෂා රෝහල මහරගම දක්වා ප්‍රවාහනය කිරීමට විශේෂ කාර්ය බලකාය හා පොලිසිය සමඟ එක්ව අවශ්‍ය කටයුතු කරන ලදි. ඉහත ආයතනවල ඇති යන්ත්‍ර වලින් ඉවත් කරන ලද ක්ෂය වූ ප්‍රභවයන් ඉහත රෝහල් 03 න් කැළණිය ගබඩා පහසුකම් සඳහා ප්‍රවාහනය කර නැවත අපනයනය කිරීම සඳහා කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ වෙත ප්‍රවාහනය කරන ලදි.

විශේෂ කාර්ය බලකාය හා පොලිසියේ සහාය ඇතිව සභාවේ අධීක්ෂණය යටතේ කෝබල්ට් - 60 ප්‍රභවයන් සහිත නැව් බඩු 2 ක් ද කොළඹ වරාය සිට ඇන්සල් ලංකා ලිමිටඩ් ආයතනයට හා බියගම අපනයන සැකසුම් කලාපයේ පිහිටි ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයට ප්‍රවාහනය කරන ලදි.

ඇමෙරිකා එක්සත් ජනපදයේ ජීඑම්එස් වැඩ සටහන යටතේ ඕක්රිජ් නැෂනල් විද්‍යාගාරය විසින් සපයන ලද ට්‍රැකින් උපකරණය (T-Star) මෙම සම්පූර්ණ ප්‍රවාහන කාර්යය සඳහා භාවිතා කරන ලදි. බඩු තොගය ප්‍රවාහනයේදී ප්‍රවාහන බහාලුම පවතින ස්ථානය පිළිබඳ තොරතුරු මෙම උපකරණය මඟින් ලබාගත හැකිය.

මෙම ප්‍රවාහනයන් සඳහා බලපත්‍ර දීමට පෙර මෙම ප්‍රවාහනයන් සඳහා යෙදෙන පුද්ගලයින් පිළිබඳ විශ්වාසවන්තභාවය පිළිබඳ පූර්ව ඇගයීමක් කිරීම සඳහා ඔවුන්ගේ සියලු තොරතුරුද ප්‍රවේශම් හා සුරක්ෂිත ප්‍රවාහනය සඳහා වාහන පිළිබඳ තත්ත්වය තහවුරු කර ගැනීමට වාහන පිළිබඳ තොරතුරු ද සභාව විසින් ලබාගෙන තිබුණි.



ප්‍රවහනය සඳහා බලය දීමට පෙර ප්‍රවාහන බහලුම් ප්‍රවේසම සඳහා පරීක්ෂා කිරීම



විශේෂ කාර්ය බලකා භට කණ්ඩායම සමඟ ඉහළ ක්‍රියාකාරී විකිරණශීලී ද්‍රව්‍ය ප්‍රවාහනය

## හදිසි ප්‍රතිචාර

පනතේ 58 වගන්තිය ප්‍රකාරව, ජාතික මට්ටමින් විය හැකි න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි ආපදාවන් සඳහා ප්‍රතිචාර දැක්වීමට ජාතික න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි ආපදා කළමනාකරණ සැලැස්මක් සංවර්ධනය කිරීමට හා හදිසි ආපදා කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට උපදෙස් දීමට සභාව වගකිව යුතු වේ. සභාව න්‍යෂ්ටික අනතුරු පූර්ව දැනුම්දීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය ප්‍රකාරව ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සියේ ජාතික අනතුරු දැන්වීම් උපදේශාත්මක ඒකකය ලෙස (National Warning Point ) හා එම ක්‍රියාකාරකම් සඳහා ජාතික නිසි බලධාරී ආයතනය ලෙස ද නම් කර ඇත.

න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි පෙර සූදානම්වීම හා සභාවේ හා අදාළ පාර්ශවයන්ගේ ප්‍රතිචාර හැකියාවන් සංවර්ධනය කිරීම සඳහා පහත සඳහන් කාර්යයන් සිදුකරන ලදි.

## හදිසි ආපදා පෙර සුදානම්වීම හා ප්‍රතිචාර සඳහා අදාළ පුහුණුව

න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි ආපදා පෙර සුදානම්වීම හා ප්‍රතිචාර පිළිබඳ පහත සඳහන් දැනුවත් කිරීමේ වැඩසටහන් සභාව විසින් පවත්වන ලදි.

- ශ්‍රී ලංකා යුධ හමුදාවේ රසායනික, ජීව විද්‍යාත්මක විකිරණශීලී හා න්‍යෂ්ටික කණ්ඩායම් සඳහා

| ස්ථානය | දිනයන් |
|---|---|
| යාපනය | 2017 ජනවාරි 12 |
| වවුනියා | 2017 මාර්තු 13 |
| මින්නේරිය | 2017 මාර්තු 27 |
| මත්තේගොඩ | 2017 මාර්තු 24 |
| ඇඹිලිපිටිය | 2017 දෙසැම්බර් 19 |



ශ්‍රී ලංකා යුධ හමුදාවේ CBRN කණ්ඩායම සඳහා විකිරණශීලී ආපදාවන්හි දී ප්‍රතිචාර දැක්වීම පිළිබඳ හදිසි ආපදා අභ්‍යාසයක් පැවැත්වීම

- ශ්‍රී ලංකා නාවික හමුදාවේ රසායනික, ජීව විද්‍යාත්මක හා විකිරණශීලී හා න්‍යෂ්ටික කණ්ඩායම් සඳහා

| ස්ථානය | දිනයන් |
|---|---|
| වැලිසර | 2017 නොවැම්බර් 21 |
| ත්‍රිකුණාමලය | 2017 නොවැම්බර් 29 සිට 30 |



විකිරණශීලී හදිසි ආපදා කළමනාකරණය පිළිබඳ ශ්‍රී ලංකා නාවික හමුදාවේ CBRN කණ්ඩායම ත්‍රිකුණාමලයේ දී පුහුණු කිරීම



විකිරණ නියුක්ලයිඩ විශ්ලේෂණය යොදා ගනිමින් විකිරණ නියුක්ලයිඩ හඳුනා ගැනීම

## ජාතික න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි ආපදා කළමනාකරණ සැලැස්ම කෙටුම්පත් කිරීම

න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි ආපදා සැලැස්මක් ( හදිසි ආපදා කළමනාකරණ සැලැස්ම) කෙටුම්පත් කිරීම සඳහා තොරතුරු ලබා ගැනීමට අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා පවත්වන ලද අතර මූලික කෙටුම්පත ආපදා කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ තාක්ෂණ ලියකියවිලි වලට අනුකූලව පිළියෙල කරන ලදි. කෙටුම්පත් කරන ලද ආපදා කළමනාකරණ සැලැස්ම සභාව විසින් පත් කරන ලද කමිටුවක් විසින් සමාලෝචනය කරන ලද අතර අවසාන කෙටුම්පත පිළියෙල කරන ලදි. එක් එක් අදාළ පාර්ශ්වයන්ගේ වගකීම් තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා පාර්ශවයන්ගේ අදහස් ලබාගැනීමට 2018 වර්ෂයේ පළමු කාර්තුවේ දී අදාළ පාර්ශවයන් සමඟ මෙම හදිසි ආපදා කළමනාකරණ සැලැස්ම සාකච්ඡාවට භාජනය කිරීමට කටයුතු යොදනු ඇත.

## ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය සමඟ හදිසි ආපදා අභ්‍යාස සිදුකිරීම

ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ Convex-3 ජාත්‍යන්තර හදිසි ආපදා ප්‍රතිචාර අභ්‍යාසය සඳහා සහභාගී විය.

විශාල න්‍යෂ්ටික හෝ විකිරණශීලී ආපදාවක දී ප්‍රතිචාර ඇගයීම් කිරීම සඳහා විශේෂයෙන් හදිසි ප්‍රතිචාර ආපදා සැලසුම් හා හැකියාවන් පිළිබඳ ශක්තිමත් හා දුර්වල ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම Convex-3 අභ්‍යාස වල අරමුණ වේ. න්‍යෂ්ටික ප්‍රවේශම හා න්‍යෂ්ටික ආරක්ෂා බලධාරීන් අතර සමීප සම්බන්ධතාවයක් අවශ්‍ය වන සිද්ධි වලදී ජාතික හා / හෝ ජාත්‍යන්තර හදිසි ප්‍රතිචාර පද්ධතිවල වැඩිදියුණු කිරීම් ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම සඳහා අවස්ථාවක් Convex-3 (2017) විසින් සපයයි. ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ ජාත්‍යන්තර හදිසි ආපදා මධ්‍යස්ථානයේ (IAEA-IEC) වෙබ් අඩවිය මඟින් 2017 ජූනි 21 සිට 22 දක්වා මෙම අභ්‍යාසය සිදුකරන ලද අතර අනතුරු අනුකරණය කිරීම සඳහා හන්ගේරි න්‍යෂ්ටික විදුලි බල පිරියත යොදා ගන්නා ලදි.

මෙම අභ්‍යාසයේ සමස්ත අරමුණු වන්නේ -

- විශාල න්‍යෂ්ටික හදිසි ආපදාවකදී ඉක්මන් ප්‍රතිචාර දැක්වීම ඇගයීම් කිරීම සඳහා රාජ්‍යයන්ට හා අදාල ජාත්‍යන්තර සංවිධානයන්ට ඉඩ සලසාදීම.

- ජාත්‍යන්තර හදිසි ආපදා කළමනාකරණ පද්ධතිය ඇඟයීම් කිරීම
උදාහරණ :- සිද්ධිය සඳහා මෙහෙයුම් මාර්ගෝපදේශ සංග්‍රහය හා හදිසි ආපදා සන්නිවේදනය (IEComm), ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ ප්‍රතිචාර හා සහායදීමේ ජාලය (Response and Assistance Network ) හා ජාත්‍යන්තර සංවිධානයන්හි ක්‍රියාමාර්ග පිළිබඳ ඒකාබද්ධ විකිරණ හදිසි ආපදා කළමනාකරණ සැලැස්ම (Joint Radiation Emergency Management Palan )

- රාජ්‍යයන් අතර සෘජු ද්වි පාර්ශ්වික / බහු පාර්ශවික සන්නිවේදන පරික්ෂා කිරීම සඳහා හා
- යහපත් පරිචයන් හඳුනා ගැනීම මෙන්ම ජාතික අභ්‍යාසයන්හි දී හඳුනාගත නොහැකි වැඩිදියුණු කිරීම් අවශ්‍ය ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම

න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි ආපදාවකදී ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ (IAEA - IEC WEB) ස්ථාපිත කරන ලද වෙබ් අඩවිය මඟින් ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ සන්නිවේදන පද්ධතිය තේරුම් ගැනීම සඳහා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය හා වෙනත් රටවල් සමඟ සන්නිවේදන ක්‍රමය දැන ගැනීම සඳහා මෙම අභ්‍යාසය සභාවට ඉතා ප්‍රයෝජනවත් විය.

## මානව සම්පත් සංවර්ධනය

නියාමන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා බලපත්‍ර පහසුකම්වල හා නියාමන අධිකාරියේ පුහුණු හා නිපුණ පුද්ගලයන් සිටීම අත්‍යවශ්‍ය කාරණයකි. ඕනෑම ආයතනයක සාර්ථකත්වය එම ආයතනයේ කටයුතු කෙරෙහි සේවකයන්ගේ විශේෂඥ ඥානය ඇතුළත්වීම මත රඳා පවතී. ඉහත කාරණා පෙරදැරි කරගෙන බලපත්‍ර පහසුකම් වල විකිරණ ශ්‍රමිකයන් සඳහා හා විකිරණ ආරක්ෂාව පිළිබඳ ප්‍රතිචාර බලකායන්හි නිලධාරින්ගේ දැනුම වැඩිකිරීම සඳහා සභාව විසින් පුහුණු වැඩසටහන් පවත්වන ලද අතර විදේශීය හා දේශීය පුහුණු වැඩ සටහන් වලට සහභාගීවීම සඳහා කාර්ය මණ්ඩලයට අවස්ථාවන් ද ලබාදෙන ලදි.

### 2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා විකිරණ ශ්‍රමිකයන් හා අදාළ ප්‍රතිචාර බලකායන්හි නිලධාරින් සඳහා සභාව විසින් පවත්වන ලද විකිරණ ආරක්ෂාව හා විකිරණශීලී හදිසි ආපදා කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩ සටහන් හා දැනුවත් කිරීමේ වැඩ සටහන්

| අංකය | මාතෘකාව | ස්ථානය | දිනය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | කර්මාන්ත හා පර්යේෂණ වල දී විකිරණ ප්‍රභවයන් ප්‍රවේසම් හා සුරක්ෂිතව යොදා ගැනීම පිළිබඳ ජාතික පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව | 2017.06.13<br>2017.06.16 | 37 |
| 02 | පුද්ගලික රෝහල්වල විකිරණ වෛදීන් (Radiographer ) සඳහා රෝග විනිශ්චය හා විකිරණ මැදිහත්වීම් (Interventional Radiology ) වල දී විකිරණ ආරක්ෂණ හා තත්ත්ව සහතික පිළිබඳ පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව | 2017.10.24<br>2017.10.27 | 37 |
| 03 | විකිරණශීලී ආපදා කළමනාකරණය පදනම් වූ විකිරණ ප්‍රවේසම, විකිරණශීලී ද්‍රව්‍ය පිළිබඳ සුරක්ෂිතාව හා ඉතා වැදගත් පුද්ගලයන්ට අදාළ සුරක්ෂිතතාව | පොලිස් සේවාස්ථ පුහුණු පාසැල, දකුණු පළාත , ගාල්ල | 2017.01.20 | 58 |
| 04 | විකිරණශීලී ආපදා කළමනාකරණය පදනම් වූ විකිරණ ප්‍රවේසම, විකිරණශීලී ද්‍රව්‍ය පිළිබඳ සුරක්ෂිතතාව හා ඉතා වැදගත් පුද්ගලයන්ට අදාලව සුරක්ෂිතතාව | විශේෂ කාර්ය බලකා පුහුණු පාසැල , කටුකුරුන්ද , කළුතර | 2017.03.23 | 30 |
| 05 | විකිරණශීලී ආපදා කළමනාකරණය පදනම් වූ විකිරණ ප්‍රවේසම, විකිරණශීලී ද්‍රව්‍ය පිළිබඳ සුරක්ෂිතතාව හා ඉතා වැදගත් පුද්ගලයන්ට අදාලව සුරක්ෂිතතාව | විශේෂ කාර්ය බලකා පුහුණු පාසැල , කටුකුරුන්ද , කළුතර | 2017.06.15 | 36 |
| 06 | විකිරණශීලී හදිසි අනතුරු පදනම්වූ විකිරණ ප්‍රවේසම, විකිරණශීලී ද්‍රව්‍ය පිළිබඳ සුරක්ෂිතතාවය හා ඉතා වැදගත් පුද්ගලයන්ට අදාළව සුරක්ෂිතතාව | අමාත්‍යාංශ ආරක්ෂක අංශය, කොළඹ | 2017.06.20 | 39 |

| | | | | |
|---|---|---|---|---|
| 07 | විකිරණශීලී ආපදා කළමනාකරණය පදනම් වූ විකිරණ ප්‍රවේසම, විකිරණශීලී ද්‍රව්‍ය පිළිබඳ සුරක්ෂිතතාව හා ඉතා වැදගත් පුද්ගලයන්ට අදාලව සුරක්ෂිතතාව | පොලිස් සේවාස්ථ පුහුණු පාසැල, දකුණු පළාත , ගාල්ල | 2017.08.25 | 34 |
| 08 | විකිරණශීලී ආපදා කළමනාකරණය පදනම් වූ විකිරණ ප්‍රවේසම, විකිරණශීලී ද්‍රව්‍ය පිළිබඳ සුරක්ෂිතතාව හා ඉතා වැදගත් පුද්ගලයන්ට අදාලව සුරක්ෂිතතාව | පොලිස් සේවාස්ථ පුහුණු පාසැල, දකුණු පළාත , ගාල්ල | 2017.10.06 | 34 |
| 09 | විකිරණශීලී අනතුරු පදනම් වූ විකිරණ ප්‍රවේසම, විකිරණශීලී ද්‍රව්‍ය පිළිබඳ සුරක්ෂිතතාව හා ඉතා වැදගත් පුද්ගලයන්ට අදාලව සුක්ෂිතාව | අමාත්‍යාංශ ආරක්ෂක අංශය, කොළඹ | 2017.10.12 | 40 |
| 10 | විකිරණශීලී ආපදා කළමනාකරණය පදනම් වූ විකිරණ ප්‍රවේසම, විකිරණශීලී ද්‍රව්‍ය පිළිබඳ සුරක්ෂිතතාව හා ඉතා වැදගත් පුද්ගලයන්ට අදාලව සුක්ෂිතාව | අමාත්‍යාංශ ආරක්ෂක අංශය, කොළඹ | 2017.12.05 | 21 |

## 2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා දේශීය හා විදේශීය සම්මන්ත්‍රණ පුහුණු වැඩ සටහන් / වැඩ මුළු / රැස්වීම් සඳහා සහභාගී වූ සභාවේ නිලධාරීන්

### (අ) සහභාගීවූ විදේශ සම්මන්ත්‍රණ / පුහුණු වැඩ සටහන්/ වැඩ මුළු / රැස්වීම් / සම්මන්ත්‍රණ



| නිලධාරියාගේ නම හා තනතුර | වැඩ සටහනේ නම | කාල පරිච්ඡේදය | අනුග්‍රාහක | රට |
|---|---|---|---|---|
| වෛද්‍ය සමන් හේවමාන සභාපති | ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ (IAEA) පොදු සම්මන්ත්‍රණය 61 වන සැසිය | 2017.09.18 සිට 2017.09.22 | ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය | ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය, ඔස්ට්‍රියා |
| | ආසියා - පැසිපික් ආරක්ෂාකාරී ජාල පිළිබඳ 8 වෙනි වාර්ෂික රැස්වීම (ASPN) | 2017.10.30 සිට 2017.11.02 | ඇ.එ.ජනපදයේ බල ශක්ති දෙපාර්තමේන්තුව | කොරියා ජනරජය |
| ජේ.එම්.සී.මාලනී ජයවර්ධන මිය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ආසියා - පැසිපික් ආරක්ෂාකාරී ජාල පිළිබඳ 8 වැනි වාර්ෂික රැස්වීම (ASPN) | 2017.10.30 සිට 2017.11.02 | ඇ.එ. ජනපදයේ බල ශක්ති දෙපාර්තමේන්තුව | කොරියා ජනරජය |
| එච්.එල්.අනිල් රංජිත් මයා අධ්‍යක්ෂ ජනරාල් | න්‍යෂ්ටික ප්‍රවේසම පිළිබඳ ප්‍රඥප්තිය සඳහා ගිවිසුම්ගත වූ පාර්ශවයන් පිළිබඳ 7 වෙනි සමාලෝචනය | 2017.03.27 සිට 2017.03.31 | ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය | වියනා, ඔස්ට්‍රියා |

| | | | | |
|---|---|---|---|---|
| | විකිරණ ප්‍රවේසම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (RASIMS) පිළිබඳ සම්බන්ධිකාරකවරන්ගේ රැස්වීම | 2017.05.15 සිට 2017.05.19 | ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය | වියනා, ඔස්ට්‍රියා |
| | ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ (IAEA) 61 වෙනි සැසිය | 2017.09.18 සිට 2017.09.22 | ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය | වියනා, ඔස්ට්‍රියා |
| | ඒකාබද්ධ විකිරණ සුරක්ෂිතතා සහාය සැලසුම් සඳහා සන්නිවේදන ඒකක පිළිබඳ තාක්ෂණික රැස්වීම | 2017.10.10 සිට 2017.10.13 | ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය | වියනා, ඔස්ට්‍රියා |
| ටී.එච්.එස්.ශාන්ත මයා අධ්‍යක්ෂ *(බලයදීම)* | උසස් ප්‍රතිපත්ති හුවමාරු වැඩ සටහන | 2017.05.15 සිට 2017.05.19 | ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය | ඇ.එ. ජනපදය |
| | Convex – 3 (2017 අභ්‍යාසය ඇගයීම සඳහා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ තාක්ෂණික රැස්වීම) | 2017-12-18 සිට 2017.12.19 | ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය | වියනා, ඔස්ට්‍රියා |
| යූ.ඩබ්.කේ.එච්. ද සිල්වා මයා නියෝජ්‍ය අධ්‍යක්ෂ *(බලයදීම - කර්මාන්ත යෙදවුම්, ආනයන හා අපනයන)* | ජංගම උණුසුම් කුටි (Mobile hot Cell ) යොදා ගත් ඉහළ ක්‍රියාකාරී සාකච්ඡා කළ මුද්‍රා සහිත විකිරණශීලී ප්‍රභවයන් (1-2 වර්ගය ) තත්ත්වාරෝපණය පිළිබඳ ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ අන්තර් කලාප පුහුණු පාඨමාලාව | 2017.05.22 සිට 2017.05.26 | ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය | ටයිඋවාන් , චීනය |
| | වෘත්තීය විකිරණ ආරක්ෂාව සඳහා වන කලාපිය වැඩමුළුව | 2017.10.02 සිට 2017.10.06 | ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය | ජපානය |
| කේ.එන්.ආර්. ප්‍රනාන්දු මයා නියෝජ්‍ය අධ්‍යක්ෂ *(පරීක්ෂණ - වෛද්‍ය යෙදවුම්)* | විකිරණශීලී ප්‍රභව සුරක්ෂිතතාව පිළිබඳ ජාත්‍යන්තර පුහුණු පාඨමාලාව | 2017.07.03 සිට 2017.07.07 | ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය | වියනා, ඔස්ට්‍රියා |
| කේ.එස්.එස්.කුමාර මයා නියෝජ්‍ය අධ්‍යක්ෂ *(බලයදීම - වෛද්‍ය යෙදවුම්)* | න්‍යෂ්ටික සුරක්ෂිතාව සඳහා නියෝග සහ සම්බන්ධිත පරිපාලන ක්‍රියාමාර්ග පිළිබඳ ජාත්‍යන්තර පුහුණු පාඨමාලාව | 2017.07.17 සිට 2017.07.20 | ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය | වියනා, ඔස්ට්‍රියා |
| කේ.කේ.පී.අයි.කේ. කඩදුන්න මයා නියෝජ්‍ය අධ්‍යක්ෂ | න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි ආපදාවකදී දැන්වීම, වාර්තා කිරීම සහාය ඉල්ලීම පිළිබඳ වැඩ මුළුව | 2017.06.27 සිට 2017.06.30 | ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය | වියනා, ඔස්ට්‍රියා |

| | | | | |
|---|---|---|---|---|
| (පරික්ෂණ - කර්මාන්ත යෙදවුම්, බලගැන්වීම) | විකිරණ හදිසි ආපදාවක දී සූදානම්වීම හා ප්‍රතිචාර පිළිබඳ ජොෂ්ඨ ශික්ෂකයින් සඳහා කලාප පුහුණු පාඨමාලාව ( පුහුණුකරුවන් පුහුණු කිරීම) | 2017.07.17 සිට 2017.07.21 | ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය | වියනා, ඔස්ට්‍රියා |
| | විකිරණ හදිසි ආපදා සූදානම්වීම හා ප්‍රතිචාර පිළිබඳ කලාප පාසල | 2017.08.28 සිට 2017.09.15 | ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය | මිහාරු, ජපානය |
| විද්‍යාත්මක නිලධාරි කේ.පී.කේ.යූ.ගමගේ මයා | ප්‍රවේසම් හා සුරක්ෂිතා ආකාරයෙන් වර්ග 3-5 ප්‍රභවයන් කළමනාකරණය සඳහා සහායවීම සඳහා DSRS පිළිබඳ කලාප පුහුණු පාඨමාලාව (hands- on) | 2017.08.07 සිට 2017.08.11 | ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය | කජන්ග් - මැලේසියාව |
| | න්‍යෂ්ටික බලශක්ති වැඩ සටහන් සහිතව සාමාජික රටවල් සඳහා න්‍යෂ්ටික සුරක්ෂිතතා පාලන ක්‍රමයක් සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු පාඨමාලාව | 2017.09.25 සිට 2017.09.29 | ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය | සෙන්ට් පීටර්ස්බර්ග්, රුසියාව |
| එච්.ජේ.ප්‍රේම කුමාර මයා විද්‍යාත්මක නිලධාරි | විකිරණ ආරක්ෂාව හා විකිරණ ප්‍රභවයන් පිළිබඳ ප්‍රවේසම පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යාපනික පාඨමාලාව | 2017.05.08 සිට 2017.11.03 | ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය | කජන්ග්, මැලේසියා |
| එන්.පී.එන්.කරුණාරත්න මෙය විද්‍යාත්මක නිලධාරි | විකිරණ පිරියත ප්‍රවේසම පිළිබඳ පාඨමාලාව සඳහා විකිරණ තාක්ෂණික සම්මන්ත්‍රණය JFY 2017 | 2017.09.19 සිට 2017.10.13 | MEXT | ජපානය |
| ඊ.ආර්.ඩී. ප්‍රභානි මෙය නීති නිලධාරි | විකිරණ නීති ආයතනය | 2017.10.02 සිට 2017.10.13 | ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය | වියනා, ඔස්ට්‍රියා |
| | න්‍යෂ්ටික ද්‍රව්‍යයන් පාලනය සඳහා ගිණුම් තැබීම පිළිබඳ රාජ්‍ය පද්ධතිය පිළිබඳ කලාප පුහුණු පාඨමාලාව | 2017.11.27 සිට 2017.12.08 | ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය | ටොකායි, ජපානය |



## (ආ) පැවැත්වූ දේශීය පුහුණු

| නිලධාරියාගේ නම හා තනතුර | වැඩ සටහනේ නම | කාල පරිච්ඡේදය | අනුග්‍රාහක | ස්ථානය |
|---|---|---|---|---|
| එච්.එල්. අනිල් රංජිත් මයා අධ්‍යක්ෂ ජනරාල් | ගවේෂණය කිරීම හා සුරක්ෂිත තිරසාරත්වය වැඩිදියුණු කිරීම - තාත්විකව යොදා ගන්නා අන්තර් ක්‍රියාකාරී ඉගෙනුම් පද්ධති පිළිබඳ පුහුණු පාඨමාලාව (RAILS) | 2017-02-27 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |

| | | | | |
|---|---|---|---|---|
| | ජාතික විකිරණශීලී තර්ජන ප්‍රතිචාර චර්යා (NRTRP) සංවර්ධනය පිළිබඳ වැඩමුළුව | 2017.03.06 සිට 2017.03.09 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |
| | ආරක්ෂණය ශක්තිමත් කිරීම හා වැඩිනොවීමේ පාලන ක්‍රම ශක්තිමත් කිරීමේ දී අතිරේක චර්යා පිළිබඳ රාජ්‍ය කාර්ය භාරය පිළිබඳ ජාත්‍යන්තර ආරක්ෂණ වැඩමුළුව | 2017.04.25 සිට 2017.04.27 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |
| | ජාතික විකිරණශීලී තර්ජන ප්‍රතිචාර සම්මුතිය (NRTRC) පිළිබඳ "Table Top Exercise (TIX)" | 2017.09.12 සිට 2017.09.13 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |
| වී.එච්.එස්.ශාන්ත අධ්‍යක්ෂ ( බලයදීම) | එක්සත් ජනපද ශක්ති දෙපාර්තමේන්තුවේ වැඩ සටහන විසින් ප්‍රදනය කරන ලද භාවිතය පිරික්සුම් උපකරණ නඩත්තු කිරීම, ක්‍රමාංකනය හා භාවිතය | 2017.02.28 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |
| | ජාතික විකිරණශීලී තර්ජන ප්‍රතිචාර චර්යා (NRTRP) සංවර්ධනය පිළිබඳ වැඩ මුළුව | 2017.03.06 2017.03.09 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |
| | ආරක්ෂණ හා වැඩි නොවීමේ පාලන ක්‍රමයක් ශක්තිමත් කිරීමේ දී අතිරේක චර්ය පිළිබඳ රාජ්‍ය කාර්ය භාරය පිළිබඳ ජාත්‍යන්තර ආරක්ෂණ වැඩමුළුව | 2017.04.25 2017.04.27 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |
| | ජාතික විකිරණශීලී තර්ජන ප්‍රතිචාර සම්මුතිය පිළිබඳ (NRTRC) "Table Top Exereise (TTX) " | 2017.09.12 2017.09.13 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |
| යු.ඩබ්ලිව්.කේ.එච්.ද සිල්වා මයා නියෝජ්‍ය අධ්‍යක්ෂ ( බලයදීම - කර්මාන්ත යෙදවුම් ආනයන හා අපනයනය | අපනයන පාලන දෙපාර්තමේන්තුව හා අදාළ ආරක්ෂණ (EXBS) වැඩ සටහන් විසින් පවත්වන ලද පැතිරීම් වැළැක්වීමේ විධායක සම්මන්ත්‍රණය | 2017.11.15 2017.11.16 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |
| | USDOE වැඩ සටහන විසින් පරිත්‍යාග කරන ලද පිරික්සුම් උපකරණ නඩත්තුව, ක්‍රමාංකනය හා භාවිතය | 2017.02.28 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |
| | "ORTEC Gamma Spectroscopy System" පිළිබඳ මෙහෙයුම් පුහුණුව | 2017.03.02 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |
| | ජාතික විකිරණශීලී තර්ජන ප්‍රතිචාර චර්යා (NRTRP) සංවර්ධන වැඩ මුළුව | 2017.03.06 2017.03.09 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |
| | ආරක්ෂණ හා පැතිරීම වැළැක්වීමේ පාලනයන් ශක්තිමත් කිරීමේදී අතිරේක චර්යා පිළිබඳ රාජ්‍ය කාර්ය භාරය පිළිබඳ ජාත්‍යන්තර ආරක්ෂණ වැඩ මුළුව | 2017.04.25 2017.04.27 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |

| | | | | |
|---|---|---|---|---|
| | ජාතික විකිරණශීලී තර්ජන ප්‍රතිචාර පද්ධතිය (NRTRC) පිළිබඳ "Table Top Exercise (TTX) " | 2017.09.12<br>2017.09.13 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ,<br>ශ්‍රී ලංකාව |
| කේ.එන්.ආර්.ප්‍රනාන්දු මයා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>*(බලයදීම- වෛද්‍ය යෙදවුම්)* | USDOE වැඩ සටහන විසින් පරිත්‍යාග කරන ලද පිරික්සුම් උපකරණ නඩත්තුව ක්‍රමාංකනය හා භාවිතය | 2017.02.28 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ,<br>ශ්‍රී ලංකාව |
| | "ORTEC Gamma Spectroscopy System" පිළිබඳ මෙහෙයුම් පුහුණුව | 2017.03.02 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ,<br>ශ්‍රී ලංකාව |
| | ජාතික විකිරණශීලී තර්ජන ප්‍රතිචාර චර්යා (NRTRP) සංවර්ධන වැඩ මුළුව | 2017.03.06<br>2017.03.09 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ,<br>ශ්‍රී ලංකාව |
| | ආරක්ෂණ හා පැතිරීම වැලැක්වීමේ පාලන ක්‍රමය ශක්තිමත් කිරීමේදී අතිරේක චර්යා රාජ්‍ය කාර්ය භාරය පිළිබඳ ජාත්‍යන්තර වැඩ මුළුව | 2017.04.25<br>2017.04.27 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ,<br>ශ්‍රී ලංකාව |
| | ජාතික විකිරණශීලී තර්ජන ප්‍රතිචාර පරිපාටි (NRTRC) පිළිබඳ "Table Top Exercise (TTX) " | 2017.09.12<br>2017.09.13 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ,<br>ශ්‍රී ලංකාව |
| කේ.කේ.පී.අයි.කේ.කඩදුන්න මයා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>*(පරීක්ෂණ - කර්මාන්ත යෙදවුම්, බලගැන්වීම)* | පිරික්සුම් හා සුරක්ෂිත තිරසාරත්වය වැඩිදියුණු කිරීම - තාත්විකව යොදා ගත හැකි අන්තර් ක්‍රියාකාරී ඉගෙනුම් පද්ධති (RAILS) පිළිබඳ පුහුණු පාඨමාලාව | 2017.02.27 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ,<br>ශ්‍රී ලංකාව |
| | USDOE වැඩ සටහන විසින් පරිත්‍යාග කරන ලද පිරික්සුම් උපකරණ නඩත්තුව, ක්‍රමාංකනය හා භාවිතය | 2017.02.28 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ,<br>ශ්‍රී ලංකාව |
| | "ORTEC Gamma Spectroscopy System " පිළිබඳ මෙහෙයුම් පුහුණුව | 2017.03.02 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ,<br>ශ්‍රී ලංකාව |
| | ජාතික විකිරණශීලී තර්ජන ප්‍රතිචාර චර්යා (NRTRP) සංවර්ධන වැඩ මුළුව | 2017.03.06<br>2017.03.09 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ,<br>ශ්‍රී ලංකාව |
| | ආරක්ෂණ පැතිරීම වැලැක්වීමේ පාලන ක්‍රමය ශක්තිමත් කිරීමේදී අතිරේක චර්යා පිළිබඳ රාජ්‍ය කාර්ය භාරය පිළිබඳ ජාත්‍යන්තර ආරක්ෂණ වැඩ මුළුව | 2017.04.25<br>2017.04.27 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ,<br>ශ්‍රී ලංකාව |
| කේ.එස්.එස්.කුමාර<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>*(බලයදීම - වෛද්‍ය යෙදවුම්)* | පිරික්සුම් හා සුරක්ෂිත තිරසාරත්වය වැඩිදියුණු කිරීම - තාත්විකව යොදා ගත හැකි අන්තර් ක්‍රියාකාරී ඉගෙනුම් පද්ධති (RAILS) පිළිබඳ පුහුණු පාඨමාලාව | 2017.02.27 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ,<br>ශ්‍රී ලංකාව |
| | USDOE වැඩ සටහන විසින් පරිත්‍යාග කරන ලද පිරික්සුම් උපකරණ නඩත්තුව, ක්‍රමාංකනය හා භාවිතය | 2017.02.28 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ,<br>ශ්‍රී ලංකාව |

| | | | | |
|---|---|---|---|---|
| | "ORTEC Gamma Spectroscopy System" පිළිබඳ මෙහෙයුම් පුහුණුව | 2017.03.02 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |
| | ජාතික විකිරණශීලී තර්ජන ප්‍රතිචාර චර්යා (NRTRP) සංවර්ධන වැඩ මුළුව | 2017.03.06<br>2017.03.09 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |
| | ආරක්ෂණ හා පැතිරීම වැලැක්වීමේ පාලන ක්‍රමය ශක්තිමත් කිරීමේදී අතිරේක චර්යා පිළිබඳ රාජ්‍ය කාර්ය භාරය පිළිබඳ ජාත්‍යන්තර වැඩ මුළුව | 2017.04.25<br>2017.04.27 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |
| | ජාතික විකිරණශීලී තර්ජන ප්‍රතිචාර පරිපාටි (NRTRC) පිළිබඳ "Table Top Exercise (TTX)" | 2017.09.12<br>2017.09.13 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |
| සී.එස්.හේරත් මිය<br>විද්‍යාත්මක නිලධාරි | "ORTEC Gamma Spectroscopy System" පිළිබඳ මෙහෙයුම් පුහුණුව | 2017.03.02 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |
| කේ.ජී.කේ.යූ.ගමගේ මිය<br>විද්‍යාත්මක නිලධාරි | USDOE වැඩ සටහන විසින් පරිත්‍යාග කරන ලද පිරික්සුම් උපකරණ නඩත්තුව ක්‍රමාංකනය හා භාවිතය | 2017.02.28 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |
| එච්.ජේ.ප්‍රේමකුමාර මයා<br>විද්‍යාත්මක නිලධාරි | USDOE වැඩ සටහන විසින් පරිත්‍යාග කරන ලද පිරික්සුම් උපකරණ නඩත්තුව ක්‍රමාංකනය හා භාවිතය | 2017.02.28 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |
| එන්.පී.එන්.කරුණාරත්න මෙය<br>විද්‍යාත්මක නිලධාරි | අපනයන පාලන කාර්යාලය හා අදාළ ආරක්ෂණ වැඩ සටහන (EXBS) පවත්වන ලද පැතිරිම වැලැක්වීමේ විධායක සම්මන්ත්‍රණය | 2017.11.15<br>2017.11.16 | එක්සත් ජනපද තානාපති කාර්යාලය | කොළඹ, ශ්‍රී ලංකාව |
| | ORTEC Gamma Spectroscopy System පිළිබඳ මෙහෙයුම් පුහුණුව | 2017.03.02 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |
| ඩබ්.එම්.ආර්.එල්. මෙදිස් මයා<br>විද්‍යාත්මක නිලධාරි | USDOE වැඩ සටහන විසින් පරිත්‍යාග කරන ලද පිරික්සුම් උපකරණ නඩත්තුව, ක්‍රමාංකනය හා භාවිතය | 2017.02.28 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |
| එන්.පී.ඩබ්.ඩී.ඩී.රොඩ්රිගෝ මයා<br>විද්‍යාත්මක නිලධාරි | USDOE වැඩ සටහන විසින් පරිත්‍යාග කරන ලද පිරික්සුම් උපකරණ නඩත්තුව, ක්‍රමාංකනය හා භාවිතය | 2017.02.28 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |
| | පිරවීම් පද්ධතිය (Filling System ) | 2017.08.30 | ශ්‍රීලංපබනිස | කොළඹ, ශ්‍රී ලංකාව |
| එච්.ඩී.එම්.පියරත්න මයා<br>විද්‍යාත්මක නිලධාරි | පිරික්සුම් හා සුරක්ෂිත තිරසාරත්වය වැඩිදියුණු කිරීම - තාත්වික යොදා ගත හැකි අන්තර් ක්‍රියාකාරී ඉගෙනුම පද්ධති (RAILS) පිළිබඳ පුහුණු පාඨමාලාව | 2017.02.27 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |
| | "ORTEC Gamma Spectroscopy System" පිළිබඳ මෙහෙයුම් පුහුණුව | 2017.03.02 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ, ශ්‍රී ලංකාව |

| | | | | |
|---|---|---|---|---|
| ඒ.පී. මධුසංක මයා<br>විද්‍යාත්මක නිලධාරි | "ORTEC Gamma Spectroscopy System" පිළිබඳ මෙහෙයුම් පුහුණුව | 2017.03.02 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ,<br>ශ්‍රී ලංකාව |
| ජයන්ත කුමාර මයා<br>විද්‍යාත්මක නිලධාරි | "ORTEC Gamma Spectroscopy System" පිළිබඳ මෙහෙයුම් පුහුණුව | 2017.03.02 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ,<br>ශ්‍රී ලංකාව |
| ඊ.ඩී.ආර්.ප්‍රභානි මෙය<br>නීති නිලධාරී | ආරක්ෂණ හා පැතිරීම වැළැක්වීමේ පාලන තන්ත්‍රය ශක්තිමත් කිරීමේදී අතිරේක චර්යා රාජ්‍ය කාර්ය භාරය පිළිබඳ ජාත්‍යන්තර ආරක්ෂණ වැඩ මුළුව | 2017.04.25<br>2017.04.27 | එක්සත් ජනපද බල ශක්ති දෙපාර්තමේන්තුව | කොළඹ,<br>ශ්‍රී ලංකාව |
| | අපනයන පාලන කාර්යාලය හා අදාළ ආරක්ෂණ වැඩ සටහන (EXBS) පවත්වන ලද පැතිරීම වැලැක්වීමේ විධායක සම්මන්ත්‍රණය | 2017.11.15<br>2017.11.16 | එක්සත් ජනපද තානාපති කාර්යාලය | කොළඹ,<br>ශ්‍රී ලංකාව |
| | කර්මාන්ත නීතියේ පැතිකඩ පිළිබඳ සම්මන්ත්‍රණය | 2017.02.27 | නියාමන සභාව | ශ්‍රී ලංකා සංගමය නීතිඥ |
| | වලදායීතා වැඩිදියුණු කිරීම සඳහා කාර්යාල කළමනාකරණය | 2017.08.01<br>2017.08.03 | නියාමන සභාව | ශ්‍රම අධ්‍යයන පිළිබඳ ජාතික ආයතනය |
| එන්.එන්.බදුගේ මිය<br>මූල්‍ය සහ සැපයුම් නිලධාරි | ප්‍රසම්පාදන පරිපාටිය (රජය) | 2017.09.07<br>2017.09.14<br>2017.09.21 | ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව | ශ්‍රම අධ්‍යයන පිළිබඳ ජාතික ආයතනය |
| | ගිණුම්කරණය හා පරිචයන් පිළිබඳ කාර්ය භාර්ය | 2017.07.28<br>2017.07.29 | ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව | ශ්‍රම අධ්‍යයන පිළිබඳ ජාතික ආයතනය |
| අශෝක ඉන්ද්‍රානි දුනුසිංහ මිය<br>පරිපාලන නිලධාරී | ගබඩා කළමනාකරණය | 2017.09.11 | ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව | ශ්‍රම අධ්‍යයන පිළිබඳ ජාතික ආයතනය |
| ඊ.ආර්.ප්‍රේමසිරි<br>කළමනාකරණ විධායක | පරිපාලන - වාහන හා යන්ත්‍රෝපකරණය | 2017.09.11<br>2017.09.12 | ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව | ශ්‍රම අධ්‍යයන පිළිබඳ ජාතික ආයතනය |
| ඒ.ඒ.ඩී.අයි.පී.අබේරත්න<br>රියදුරු | රියදුරු කුසලතා සංවර්ධනය | 2017.08.28<br>2017.08.29 | ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව | ශ්‍රම අධ්‍යයන පිළිබඳ ජාතික ආයතනය |

# ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ මූල්‍ය ප්‍රකාශන - 2017

## ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව (සභාව)
## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
## 2017 දෙසැම්බර් 31 දිනට
*(සියලු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින්)*

| | සටහන් | 2017 | | 2016 | |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 3 | 6,262,079 | | 3,583,208 | |
| ලැබිය යුතු මුදල් | 4 | 2,183,064 | | 1,790,099 | |
| ඉන්වෙන්ට්‍රි | 5 | 376,816 | | 450,204 | |
| පූර්ව ගෙවීම් | 6 | 270,961 | | 321,339 | |
| වෙනත් ජංගම වත්කම් | 7 | | | 1,352,398 | |
| | | | 9,092,920 | | 7,497,248 |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| කෙරීගෙන යන වැඩ | 8 | 684,000 | | 304,000 | |
| දේපල , පිරියත හා උපකරණ | 9 | 65,676,439 | | 39,282,709 | |
| | | | 66,360,439 | | 39,586,709 |
| **මුළු වත්කම්** | | | **75,453,359** | | **47,083,957** |
| **වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| ගෙවිය යුතු වෙළඳ ශේෂය | 10 | (9,799,345) | | (8,151,950) | |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | 11 | (8,993,415) | | (7,085,745) | |
| **මුළු වගකීම්** | | | **(18,792,760)** | | **(15,237,695)** |
| **මුළු ශුද්ධ වත්කම්** | | | **56,660,599** | | **31,846,262** |
| **ශුද්ධ වත්කම් / හිමිකම්** | | | | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | | | |
| රජයේ ප්‍රදාන ප්‍රාග්ධනය | 12 | 33,413,877 | | 26,190,526 | |
| ප්‍රාග්ධන වාසිය | 13 | | | 105,973 | |
| ප්‍රත්‍යාගණන සංචිත | 14 | 2,585,841 | | 2,917,740 | |
| සමුච්චිත අරමුදල (පරමාණුක බලශක්ති අධිකාරියෙන් ලැබුණු වත්කම් හා වගකීම් වලට අදාල) | 15 | 278,251 | | 2,901,677 | |
| සමුච්චිත අරමුදල (සභාව) | 16 | 27,733,359 | | 4,084,932 | |
| ඌනතාවය | 17 | (7,350,729) | | (4,354,586) | |
| **මුළු ශුද්ධ වත්කම් / හිමිකම්** | | | **56,660,599** | | **31,846,262** |

මෙම මූල්‍ය ප්‍රකාශන හා මූල්‍ය ප්‍රකාශන වලට පූර්ණ කොටසක් වශයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරන අතර ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදි.

| සභාපති | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | අධ්‍යක්ෂ ජනරාල් | ගණකාධිකාරි |
|---|---|---|---|

## ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව
## මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය
## 2017 දෙසැම්බර් 31 දිනට
*(සියලු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින්)*

| | සටහන් | 2017 | 2016 |
|---|---|---|---|
| ආදායම | **18** | 53,846,343 | 44,329,930 |
| වෙනත් ආදායම | **19** | 288,761 | 64,747 |
| **මුළු ආදායම** | | 54,135,104 | 44,394,677 |
| වේතන වැටුප් හා සේවක ප්‍රතිලාභ | **20** | (26,237,449) | (19,878,949) |
| සැපයුම් හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | **21** | (1,364,340) | (1,317,364) |
| වත්කම් ක්ෂය කිරීම | **22** | (12,897,435) | (10,635,013) |
| දේපල , පිරියත හා උපකරණ හානිකරණය | **23** | (1,881,943) | (1,456,940) |
| වෙනත් පුනරාවර්තන වියදම | **24** | (14,856,054) | (12,080,310) |
| මූල්‍ය පිරිවැය | **25** | | (94) |
| **මුළු වියදම** | | (57,237,222) | (45,368,671) |
| **වර්ෂය සඳහා ඌනතාවය** | | **(3,102,117)** | **(973,993)** |

| සභාපති | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | අධ්‍යක්ෂ ජනරාල් | ගණකාධිකාරි |
|---|---|---|---|

## ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව
## ශුද්ධ වත්කම්/ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය
## 2017 දෙසැම්බර් 31 දිනට
*(සියලු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින්)*

| | ප්‍රාග්ධන ප්‍රදාන | ප්‍රාග්ධන වාසිය | සංචිත | පරමාණුක බලශක්ති අධිකාරියෙන් මාරු කරන ලද වත්කම් හා වගකීම් වලට අදාළ සමුච්චිත අරමුදල | සභාවේ සමුච්චිත අරමුදල | සමුච්චිත ඌනතාවය | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **29,567,501** | | **3,942,740** | **4,947,082** | **5,484,932** | **(3,479,000)** | **40,463,253** |
| වර්ෂය සඳහා ලැබීම් | 1,222,000 | 105,973 | | 3,598,912 | | | 4,926,885 |
| ප්‍රවර්ථන වර්ෂය සඳහා ගැලපීම් | (4,598,975) | | (1,025,000) | (5,644,317) | (1,400,000) | 98,409 | (12,569,883) |
| වර්ෂය සඳහා ඌනතාවය | | | | | | (973,993) | (973,993) |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 26,190,526 | 105,973 | 2,917,740 | 2,901,677 | 4,084,932 | (4,354,584) | **31,846,264** |
| ආරම්භක ශේෂය ගැලපීම | | (105,973) | | | | 105,973 | |
| වර්ෂය සඳහා ලැබීම් | 12,241,000 | | 785,800 | 429 | 27,786,659 | | 40,813,888 |
| ප්‍රවර්ථන වර්ෂය සඳහා ගැලපීම් | (5,017,649) | | (1,117,699) | (2,623,855) | (4,138,232) | | (12,897,435) |
| වර්ෂය සඳහා ඌනතාවය | | | | | | (3,102,117) | (3,102,117) |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **33,413,877** | | **2,585,841** | **278,251** | **27,733,359** | **(7,350,728)** | **56,660,599** |

සභාපති

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

අධ්‍යක්ෂ ජනරාල්

ගණකාධිකාරී

## ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව

## 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

*(සියලු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින්)*

| | 2017 | 2016 |
|---|---:|---:|
| **<u>මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහ</u>** | | |
| ***<u>ලැබීම්</u>*** | | |
| භාණ්ඩ හා සේවා විකුණුම් | 14,715,392 | 13,533,550 |
| පුනරාවර්තන ප්‍රදාන ලැබීම් | 29,000,000 | 25,000,000 |
| වෙනත් ආදායම | 210,608 | 23,446 |
| ප්‍රාග්ධන වාසිය | | 105,973 |
| ණය පොලි ලැබීම් | 78,153 | 60,747 |
| ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ ලැබුණු මුදල් | | 4,159,340 |
| | | |
| ***<u>ගෙවීම්</u>*** | | |
| සේවක පිරිවැය | (23,707,173) | (17,895,643) |
| සැපයුම්කරුවන් | (1,277,283) | (1,185,388) |
| වෙනත් ගෙවීම් | (16,884,984) | (17,380,297) |
| ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ අරමුදල් උපයෝජනය | | (4,159,340) |
| **මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **2,134,712** | **2,262,388** |
| | | |
| **<u>ආයෝජන කටයුතු වලින් මුදල් ප්‍රවාහය</u>** | | |
| ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම | 12,241,000 | 1,222,000 |
| දේපල පිරියත හා උපකරණ | (10,718,157) | (12,014,715) |
| කෙරී ගෙන යන වැඩ (ගිණුම්කරණ පැකේජය) | (380,000) | (304,000) |
| **ආයෝජන කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **1,142,843** | **(11,096,715)** |
| | | |
| **<u>මූල්‍ය කටයුතු වලින් මුදල් ප්‍රවාහය</u>** | | |
| ණය අයකර ගැනීම | 781,331 | 739,586 |
| ණය ගෙවීම (උපලේඛන - 5 බලන්න ) | (1,380,000) | (959,400) |
| **මූල්‍ය කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(598,669)** | **(219,814)** |
| | | |
| **මුදල් හා මුදල් සමාන ශේෂයේ ශුද්ධ වැඩිවීම/ අඩුවීම** | **2,678,886** | **(9,054,141)** |
| | | |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන ශේෂය** | | |
| බැංකුවේ මුදල් | 3,569,223 | 12,623,363 |
| මුද්දර තොගය | 13,985 | 10,685 |
| | | |
| **වර්ෂය අවසානයට මුදල් හා මුදල් සමාන ශේෂය** | | |
| බැංකුවේ මුදල් | 6,248,109 | 3,569,222 |
| මුද්දර තොගය | 13,969 | 13,985 |

| සභාපති | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | අධ්‍යක්ෂ ජනරාල් | ගණකාධිකාරි |
|---|---|---|---|

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව
ගිණුම් වලට සටහන්

## 1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.1 සාමාන්‍ය

### 1.1.1 පිළියෙල කිරීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය හා ශුද්ධ වත්කම්/ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අයවැයගත සංඛ්‍යා හා තථ්‍ය මුදල් ප්‍රමාණයන් සැසඳීමේ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට සටහන් වලින් මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට (SLPSAS) හා උපචිත පදනම මත ගිණුම්කරණය සඳහා අභ්‍යන්තරිකව පිළිගත් ප්‍රතිපත්ති වලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදි. වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා මිනුම්කරණ පදනම ඓතිහාසික පිරිවැය ගැලපීමයි. අඛණ්ඩ පැවැත්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති අතර කාල පරිච්ඡේදය තුළ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගමනය කර ඇත.

### 1.1.2 ක්‍රියාත්මක වන හා ඉදිරිපත් කරන මුදල් වර්ගය

සභාවේ ක්‍රියාත්මක වන හා ඉදිරිපත් කරන මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. සියලු ක්‍රියාත්මක වන තොරතුරු ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර දක්වා නොමැති අවස්ථාවක හැර ආසන්න දහස් සංඛ්‍යා වලට දක්වා ඇත.

### 1.1.3 සංසන්දනාත්මක තොරතුරු

පෙර වර්ෂයේ සංඛ්‍යා සඳහා යොදාගත් ගිණුම් පරිචයන් සභාව විසින් යොදා ගෙන ඇති අතර ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය වූ අවස්ථා වල නැවත පිළියෙල කර ඇත.

### 1.1.4 ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම

පෙර මූල්‍ය වර්ෂයේ අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති ඒකාකාරීව යොදා ගෙන ඇත.

### 1.1.5 ශේෂ පත්‍ර දිනයට පසු සිදුවූ සිදුවීම්

ශේෂ පත්‍ර දිනයට පසු සියලු ප්‍රමාණාත්මක සිද්ධි සලකා බලා ඇති අතර අවශ්‍ය අවස්ථා වල අදාළ ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල කර ඇත.

### 1.1.6 බදු

සභාව වැට් සඳහා ලියාපදිංචි වී නොමැති බැවින් 2017 වර්ෂය සඳහා එහි ගණුදෙනු කරුවන්ගෙන් වැට් අයකර නැත. උපයන විට ගෙවීම් බදු, මුද්දර බදු හා ආදායම් බදු සභාවට වෙන් කරන ලද ටින් (TIN) අංකය යටතේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවා ඇත.

## 1.2 වත්කම් සහ එහි වටිනාකම් අගය කිරීමේ පදනම

ශේෂ පත්‍ර දිනයට මුදල් හා ශේෂ පත්‍ර දිනයේ සිට වර්ෂයක් ඇතුළත සභාවේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ මුදල් වලින් උපලබ්ධි වීමට අපේක්ෂිතදෑ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරන ලද වත්කම් වේ.
ශේෂ පත්‍ර දිනයෙන් වර්ෂයක් ඉක්ම වූ කාලපරිච්ඡේදයක් සඳහා තබා ගැනීමට සභාව අදහස් කරන වත්කම් ජංගම වත්කම් නොවන වත්කම් වේ. ( ජංගම නොවන වත්කම්)

### 1.2.1 පිරියත හා උපකරණ

පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය අඩුකළ පිරිවැය ප්‍රත්‍යාගණනයට වාර්තා කරනු ලැබේ. ස්පෘශ්‍ය දේපල , පිරියත හා උපකරණ පිරිවැය අත්කර ගැනීම් පිරිවැයට හෝ ඉදිකිරීම් පිරිවැයට එම දේපල භාවිතා කිරීමේ තත්ත්වයට ගෙන ඒමේදී දරන ලද යම් ආනුෂංගික වියදම ද සහිතව දක්වනු ලැබේ. සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද උපකරණ අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් පත්කරන ලද අභ්‍යන්තර කමිටුවක් මඟින් ප්‍රත්‍යාගණනය කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. මෙම උපකරණ පරමාණුක ශක්ති අධිකාරියෙන් ලැබී ඇත. ප්‍රධාන වශයෙන් ජංගම නොවන වත්කම් සපයා ගැනීම සඳහා අරමුදල් ලබා දෙන්නේ මහා භාණ්ඩාගාරය විසිනි.

### 1.2.2 ක්ෂය කිරීම

සියළු දේපල පිරිවැය මත හෝ ප්‍රත්‍යාගණනය මත සරල මාර්ග ක්‍රමය අනුගමනය කරමින් එම වත්කම් වල ඇස්තමේන්තුගත ජීව කාලය තුළ එම පිරිවැය ලියාහැරීම මත ක්ෂය ප්‍රතිපාදනය ගණනය කරනු ලැබේ .

සරල මාර්ග ක්‍රමය අනුගමනය කරමින් ක්ෂය කිරීම් අනුපාතය පහත පරිදි වේ .

| | | |
|---|---|---|
| කාර්යාල උපකරණ, ලී බඩු හා සවිකිරීම් | වර්ෂ 10 ට වැඩි | 10 % |
| ඉලෙක්ට්‍රොනික් උපකරණ | වර්ෂ 04 ට වැඩි | 25 % |
| පරිගණක, මෘදුකාංග හා උපාංග | වර්ෂ 03 ට වැඩි | 33.33% |
| මෝටර් වාහන | වර්ෂ 04 ට වැඩි | 25 % |
| විද්‍යාත්මක උපකරණ | වර්ෂ 10 ට වැඩි | 10 % |
| පුස්තකාල පොත් | වර්ෂ 10 ට වැඩි | 10 % |

### 1.2.3 ඉන්වෙන්ට්‍රි - අගය කිරීමේ පදනම

එක් එක් වර්ගයේ ඉන්වෙන්ට්‍රි පිරිවැය පහත සඳහන් පදනම මත තීරණය කරනු ලැබේ.
පරිභෝජ්‍ය ද්‍රව්‍ය තොගය - මුලින් පිවිසි මුලින් නිකුතු (FIFO)

### 1.2.4 වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ

බොල් ණය ප්‍රතිපාදන සඳහා ප්‍රතිපත්ති පිළියෙල කිරීම තෙක් වෙළඳ ණයගැතියන් ඉන්වොයිසි වටිනාකමට දක්වා ඇත .

### 1.2.5 මුදල් හා මුදල් සමාන ශේෂ

ඍජු ක්‍රමය යොදා ගනිමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කරන ලදි. පහසුවෙන් මුදල් ලෙස පරිවර්තනය කළ හැකි බැංකුවේ මුදල් ශේෂය සහ මුද්දර තොගය මුදල් හා මුදල් සමාන දෑ ලෙස දක්වා ඇත.

### 1.3 වගකීම් හා ප්‍රතිපාදන

### 1.3.1 සේවකයන්ට විශ්‍රාම ප්‍රතිලාභ

(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

පනත ප්‍රකාරව සේවක අර්ථ සාධක අරමුදලට 15% ක් හා සේවක භාරකාර අරමුදලට 3% ක් වශයෙන් දායකවීම සභාවේ ප්‍රතිපත්තිය වේ. 1983 අංක 12 දරන පාරිතෝෂික පනතට අනුව පාරිතෝෂික ප්‍රතිපාදන සිදුකර ඇත. සේවකයකුගේ වර්ෂ 5 ක් අඛණ්ඩ සේවා කාලයකින් පසුව පමණක් සේවකයකුට පාරිතෝෂික ගෙවීමේ බැරකම ඇති වේ. පාරිතෝෂික බැරකම බාහිර වශයෙන් මුල්‍යායනය නොකරන අතර මෙම බැරකම ගෙවීම සඳහා වර්ෂ 1 කට වැඩි කාලයක් සේවය සපුරන සියළු සේවකයන්ගේ මාස ½ ක වැටුප සහ පසු ගිය මාසයේ ජීවනාධාර දීමනා පදනම්ව ශේෂ පත්‍රයේ ප්‍රතිපාදනයක් ඉදිරියට ගෙන එනු ලැබේ. මුළු බැරකම ගණනය කරනු ලබන්නේ එක් එක් සේවකයාගේ මාස ½ ක මූලික වැටුප + දෙසැම්බර් 31 දිනට මාසික ජීවනාධාර දීමනා වෙන් ½ ක් පදනම් කර ගනිමිනි.

### 1.3.2 වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල්

වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂ ඔවුන්ගේ පිරිවැයට හා අදාළ බදු වලට දක්වා ඇත.

### 1.3.3 ප්‍රාග්ධන බැඳීම හා අසම්භාව්‍ය බැරකම්

සභාවේ සියළු ප්‍රමාණාත්මක ප්‍රාග්ධන වගකීම්, ගිණුම්වල අදාළ සටහන් වල හෙළිදරව් කර ඇත .

### 1.3.4 ප්‍රතිපාදන

ප්‍රතිපාදන සභාවේ වර්තමාන වගකීමක් ලෙස හඳුනාගනු ලැබේ.

### 1.4 විලම්බිත ආදායම

### 1.4.1 ප්‍රදාන හා පරිත්‍යාග

පුනරාවර්තන ප්‍රදාන හා පරිත්‍යාග ක්‍රමවත් පදනමකින් පුරණය කිරීම සඳහා අදහස් කරන ආශ්‍රිත පිරිවැය සමඟ ගැලපීම සඳහා අවශ්‍ය කාල පරිච්ඡේදයන්හි ආදායම් ප්‍රකාශනයට බැර කරනු ලැබේ. සාධාරණ වටිනාකමට මුදල් නොවන ප්‍රදාන ඇතුළත් දේපල, පිරියත හා උපකරණ වලට අදාළ ප්‍රදාන ශේෂ පත්‍රයේ විලම්බනය වන අතර අදාළ වත්කම් වල ප්‍රයෝජනවත් ජීව කාලය තුළ ආදායම් ගිණුමට බැර කරනු ලැබේ.

#### රජයේ ප්‍රදාන

පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන වෙනම හඳුනා ගන්නා ලදි. ප්‍රධාන ආදායම් ප්‍රභවය වන පුනරාවර්තන ප්‍රදාන ආදායම් හා වියදම් ප්‍රකාශනයට බැර කෙරේ. මූලධන වියදම් සඳහා ප්‍රදාන ස්ථාවර වත්කම් වල ක්ෂය සංරචකය සඳහා කළ යුතු ගැලපීම සමඟ සමුච්චිත අරමුදලට ගනු ලැබේ. වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන ජංගම නොවන බැරකම් යටතේ විලම්බිත ආදායම ලෙස දක්වනු ලැබේ.

## 1.5 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

ආදායම් හා වියදම් ගිණුම් උපචිත පදනම මත පිළියෙල කරනු ලැබේ.

### 1.5.1 ආදායම හා වියදම හඳුනා ගැනීම

ප්‍රධාන ආදායම් ප්‍රභවය වන්නේ 2014 අංක 40 පනතේ දක්වා ඇති සේවාවන්ගෙන් අභ්‍යන්තරිකව ජනනය වන ආදායමයි.

#### 1.5.1.1 ආදායම

මෙහෙයුම් කටයුතු වලින් ලැබුණු ආදායම නියාමන සේවා කාමර සැලසුම් හා අනුමැතිය පිළිබඳ ශුද්ධ ආදායම, ආනයන හා අපනයන අනුමැතිය, විවිධ ආදායම, බලපත්‍ර ඉල්ලුම්පත් ක්‍රියාවලිය, බලපත්‍ර ගාස්තු, ප්‍රවාහන හා පරික්ෂණ ගාස්තු සහ උපචිත සංකල්පය මත පදනම් වූ වෙනත් ලැබීම් වලින් සමන්විත වේ.

#### 1.5.1.2 වියදම

දරන ලද පිරිවැය හා අදාළ පරිදි නිශ්චිත විෂයයන් පිළිබඳ ආදායම අතර සෘජු සම්බන්ධය පදනම්ව ආදායම් ප්‍රකාශනයේ වියදම් හඳුනාගනී. සභාව ක්‍රියාත්මක කිරීමේ දී දරන ලද සියළු වියදම් සහ දේපල , පිරියත හා උපකරණ සඳහා ක්ෂය වියදමට වැඩි ආදායම ලැබීමේ දී ආදායමට අයකරනු ලැබේ.

## 2 ආයතනික තොරතුරු

2014 අංක 40 දරණ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පණත මඟින් සභාව පිහිටවනු ලැබීය. සභාව අංක 977/18, නුවර පාර, බුළුගහ හන්දිය, කැලණිය හි පිහිටුවා ඇත.

## ගිණුම් වලට සටහන්
## 2017 දෙසැම්බර් 31 දිනට
*(සියලු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින්)*

| | | 2017 | 2016 |
2017 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 41 ක් හා තථ්‍ය සේවක සංඛ්‍යාව 29 ක් වීමෙන් ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික ශ්‍රේණිවල එක් පුරප්පාඩුවක් ද, තෘතීය මට්ටමේ පුරප්පාඩු 02 ක්ද, ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 09 ක්ද වශයෙන් සභාවේ පුරප්පාඩු 12 ක් පැවතුණි. මෙසේ ද්විතීයික මට්ටමේ තනතුරු පුරප්පාඩු වී තිබීම, අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර ආයතනය වැරදි අවම කිරීම සඳහා බාධාවක් වී තිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 10 ක සත්‍ය වියදම් අයවැයගත ප්‍රමාණයට වඩා සියයට 11 සිට සියයට 100 දක්වා ප්‍රමාණයකින් අඩු වී තිබුණ අතර එක් වැය විෂයයක සත්‍ය වියදම් අයවැයගත ප්‍රමාණයට වඩා සියයට 11.53 කින් වැඩි වී තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

2006 - රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් වසර 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත්ව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු නමුත් නියාමන සභාව විසින් 2017 වර්ෂයට පමණක් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සභාවේ සභාපති වෙත වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) වත්කම් ගිණුම්කරණය | දේපල, පිරියත හා උපකරණ නිසි පරිදි ප්‍රත්‍යාගණනය නොකිරීම. |
| (ආ) ලැබිය යුතු ශේෂ | ලැබිය යුතු මුදල් අප්‍රමාදව එකතු කර නොගැනීම. |

| | | |
|---|---|---|
| (ඇ) | මානව සම්පත් කළමනාකරණය | මානව සම්පත ආයතනයේ අරමුණු ලඟා වන පරිදි නිසි අයුරින් කළමනාකරණය නොකිරීම. |
| (ඈ) | අයවැය ලේඛනමය පාලනය | අයවැය ලේඛනය තාත්විකව සකස් කර පාලන කාරකයක් ලෙස යොදා නොගැනීම. |
| (ඉ) | නීති, රීති රෙගුලාසි හා චක්‍රලේඛ | නීති, රීති රෙගුලාසි, චක්‍රලේඛ ආදියට අනුකූලව කටයුතු නොකිරීම. |

එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

SLAERC/IA/10/Vol-ii POE/B/SLAERC/FA/2017

2018.04.19

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
රජයේ විගණන අංශය,
ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය,
60/460, බේස්ලයින් පාර, ඕරුගොඩවත්ත,
වැල්ලම්පිටිය.

මහත්මයාණනි,

**ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වර්තාව**

ඉහත කරුණට අදාළව ඔබ විසින් එවා ඇති 2018.04.06 දිනැති ලිපිය හා බැදේ.එම ලිපියෙන් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව විගණනය කර අප ආයතනයට ලිපියක් මගින් අදාළ කරුණු හා නිරීක්ෂණ පෙන්වා දීම සම්බන්ධව මුලින්ම ස්තූතිය පල කර සිටිමි.

ඒ අනුව ඔබගේ විගණන නිරීක්ෂණ වෙනුවෙන් අපගේ පැහැදිලි කිරීම් හා දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි ඉදිරිපත් කරනු ලබන බව කරුණාවෙන් දැනුම් දෙමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**
---------------------------------------------------

**2.2.1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රීලංරාගිප්‍ර)**

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත - I "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම".**

ඉහත කරුණට අදාළව ඔබගේ විගණන විමසීම් අංක POE/B/AC/AERC/2017/32/AQ/08 අනුව අපගේ 2018.03.26 දිනැති මේ සමඟ අමුණා ඇති අංක 01 ලිපියේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත යටතේ අංක 01,(ආ) යටතේ අදහස් දැක්වීමෙන් කරුණු ඔබ වෙත ඉදිරිපත් කර ඇති බව කරුණාවෙන් දන්වමි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත -3 "ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි "**

මෙම කරුණු යටතේ ද අපගේ අදහස් දැක්වීමට අදාළව ඔබ වෙත ඒවා ඇති 2018.03.26 දිනැති මේ සමඟ අමුණා ඇති අංක 01 ලිපියේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත යටතේ අංක 01 හි (ඇ) ) යටතේ අදහස් දැක්වීම සඳහා ඔබ වෙත කරුණු ඉදිරිපත් කර ඇති බව කරුණාවෙන් දන්වමි. තවද එම කරුණට අදාළ වූ සිදුවී ඇති වරද ඉදිරියේ දී සිදු නොවීමට කටයුතු කරනු බව දන්වනු කැමැත්තෙමි.

(ඇ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත - 7 "දේපල, පිරියත හා උපකරණ"**

ඉහත කරුණට අදාළව අප විසින් ඔබ වෙත එවා ඇති විගණන අදහස් දැක්වීම යටතේ 2018.03.26 දිනැති මේ සමඟ අමුණා ඇති අංක 01 ලිපියේ අංක 01 , (අ) යටතේ පැහැදිලි කිරීම් ඉදිරිපත් කර ඇත.තව ද එම පෙන්වාදීම් සම්බන්ධව 2018 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන වල සටහනක් යොදා හෙලිදරව් කිරීමට කටයුතු යොදා ඇත.
එමෙන්ම ඔබගේ නිරීක්ෂණ වල ඇතුලත් අයිතම සමඟ අදාළ වර්ෂය තුළ ප්‍රත්‍යාගණනය නොවූ අයිතමයන් 2018 වර්ෂයේ දී ප්‍රත්‍යාගණනය කර ගිණුම් පොත් වලට ගැනීමට ද කටයුතු යෙදා ඇත.

**2.2.2. හඳුනා නොගත් බැර**

ඉහත කරුණට අදාළව ද අප විසින් ඔබ වෙත එවා ඇති විගණන අදහස් දැක්වීම යටතේ 2018.03.26 දිනැතිව පහත පරිදි පැහැදිලි කිරීම් ඔබ වෙත ඉදිරිපත් කර ඇත.

පහත සඳහන් තැන්පතු, ආයතන විසින් බලපත්‍ර අයදුම්පත් ලබා ගැනීමට සහ අලුත් කිරීමේ කාර්යය සඳහා සෘජුවම බැංකුව වෙත ප්‍රේෂණය කර ඇති මුදල් වේ. බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව ඒවායේ කාල සීමාව මාස 01 සහ මාස 06 ක් අතර වේ. මෙම තැන්පතු පිලිබඳ විස්තර ඇතුලත් මුදල් තැන්පතු පත්‍රිකා හෝ එම තොරතුරු ඇතුලත් වෙනත් ලියවිල්ලක් අදාල ආයතන විසින් සභාව වෙත දැනුම් දී නැත. බැංකුවෙන් විමසීම් කලද බැංකුව පැවසුවේ තැන්පත් කරුවන් සොයා දීමට අපහසු බවයි. එම නිසා මෙම හඳුනා නොගත් තැන්පත් මුදල් "හඳුනා නොගත් තැන්පතු" ලෙස ආදායමට බැරකිරීමට කටයුතු කරනු ඇත.

| | | |
|---|---|---|
| 07.06.2017 - මුදල් තැන්පතු | | 12,550.00 |
| 01.08.2017 - මුදල් තැන්පතු | | 12,550.00 |
| 22.08.2017 - මුදල් තැන්පතු | 882213730V | 2,000.00 |
| 29.11.2017 - මුදල් තැන්පතු | | 2,000.00 |
| | | 29,100.00 |

**2.2.3. ලැබිය යුතු ගිණුම්**

ඉහත කරුණ යටතේද ඔබගේ නිරීක්ෂණයන් වෙනුවෙන් අප විසින් ඔබ වෙත එවා ඇති විගණන අදහස් දැක්වීම යටතේ 2018.03.26 දිනැති ඇමුණුම් අංක 01 ලිපියේ අංක 02 යටතේ පහත පරිදි පැහැදිලි කිරීම් කර ඇත.

ඉහත කරුණු යටතේ ණයගැති ශේෂය රු. 122,289.00 (2017.12.31 දිනට) වූ මුදලෙන් එක් ආයතනයක් හැර අනෙකුත් සියලුම ආයතන රජයේ රෝහල් හා එවැනි ආයතනයන් වේ.ණයගැති මුදල් අයකර ගැනීමට සියලු ප්‍රයත්නයන් දැරූ අතර ඉහත මුදල ලබා ගැනීමට හැකියාවක් නැත. හිඟ ණය මුදල් කපා හැරීම සම්බන්ධව අවශ්‍ය උපදෙස් ලබාගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය, විදුලි බල අමාත්‍යාංශයේ ලේකම්තුමාගෙන් විමසීම් කරන ලෙස දැනුම් දී ඇත. ඒ අනුව ඔහුගේ උපදෙස් පරිදි ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

---

**(අ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

**i. මුදල් රෙගුලාසි 104(I) (අ)**

මෙම කරුණට අදාළව ද අප විසින් ඔබ වෙත එවා ඇති විගණන අදහස් දැක්වීම යටතේ 2018.03.28 දිනැති මේ සමඟ අමුණා ඇති අංක 02 ලිපියේ අංක 02 හි i යටතේ කරුණු පැහැදිලි කිරීම් ඔබ වෙත ඉදිරිපත් කර ඇති බව කරුණාවෙන් දැනුම් දෙමි.තව ද මෙම අතපසු වීම් සිදු නොවී මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීමට ප්‍රවාහන භාර නිලධාරි වෙත ලිපියකින් 2018.04.03 දිනැතිව උපදෙස් දී ඇත.

ii. **මුදල් රෙගුලාසි 110(I)**

මෙවැනි උපලේඛණයක් දැනට පවත්වාගෙන යනු නොලැබුණු බැවින් 2018 ජනවාරි මස සිට මෙම හානිපූර්ණ ලේඛණය පවත්වාගෙන යාමට ප්‍රවාහන භාර නිලධාරි වෙත උපදෙස් දී ඇති අතර දැනටමත් එය ක්‍රියාත්මක කර ලේඛණය නිසි පරිදි පවත්වාගෙන යනු ලැබේ.

iii. **මුදල් රෙගුලාසි 135**

ඉහත කරුණ යටතේ ඔබගේ 2018.02.21 අංක POE/B/AC/AERC/2017/21/AQ/05 මගින් පෙන්වා ඇති කරුණු සම්බන්ධව අප විසින් මේ සමඟ ඔබ වෙත එවා ඇති ඇමුණුම් අංක 03 ලිපියෙහි අංක 1 හි (ආ) යටතේ 2018.03.26 දින අදාළ පැහැදිලි කිරීම් ඉදිරිපත් කර ඇති බව කරුණාවෙන් දැනුම් දෙමි.ඊට අදාළව මුදල් රෙගුලාසි 135 ට අනුව මුදල් සම්බන්ධ අධිකාරිය පවරා දීම සිදුකර ඇති අතර ඊට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ද ලබා දී ඇත.

iv. **මුදල් රෙගුලාසි 156(5)**

මෙම කරුණ යටතේ ටිපෙක්ස් භාවිතය සම්පූර්ණයෙන් නවතා දැමීමටත් එම අයිතම මිලදී නොගැනීමටත් උපදෙස් දී ඇත. එබැවින් නිවැරදි කිරීමට අනුගමනය කල යුතු නිවැරදි ක්‍රම වේදය අනුව කටයුතු කිරීමට සැලසුම් කර අවශ්‍ය කටයුතු කර ඇත.

v. **මුදල් රෙගුලාසි 1645**

මෙම කරුණ යටතේ අප විසින් ඔබ වෙත එවා ඇති 2018.03.28 දිනැති මේ සමඟ අමුණා ඇති අංක 02 ලිපියේ 01 යටතේ පැහැදිලි කිරීම් i, ii, iii, iv හි සඳහන් කර ඔබ වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව අදාළ ලේඛණ නිසි පරිදි පවත්වාගෙන යාමට ප්‍රවාහන විෂය භාර නිලධාරි වෙත උපදෙස් දී ඇත.ඒ සම්බන්ධව දැනටමත් විධිමත්ව අදාළ කටයුතු සිදු කෙරේ.ඒ බව වැඩ බලන අධ්‍යක්ෂවරයාද තහවුරු කර ඇත.

**(ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය**

i. **3.1 ඡේදය**

මෙම කරුණ යටතේ අප විසින් ඔබ වෙත එවා ඇති 2018.03.28 දිනැති මේ සමඟ අමුණා ඇති අංක 02 ලිපියේ 4 (i) යටතේ පැහැදිලි කිරීම මගින් කරුණු ඔබ වෙත ඉදිරිපත් කර ඇත. මේ අනුව නැවත ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවට 2018.05.03 දින සිට මෝටර් රථ සියල්ල ඉන්ධන දහනය පරීක්ෂාවට ලක්කිරීමට කටයුතු යොදනු ලැබේ.

ii. **3.3ඡේදය**

ඉහත කරුණ යටතේ චක්‍ර ලේඛයේ අමුණා ඇති ආකෘතිය පරිදි වාහන සම්බන්ධ සටහනක් පවත්වාගෙන යාමට 2018.04.03 දිනැතිව ප්‍රවාහන විෂය භාර නිලධාරි වෙත උපදෙස් දී ඇත.ඒ අනුව එම කටයුතු කිරිමට දැනටමත් ආරම්භ කර ඇත.

iii. **4.3ඡේදය**

මෙම කරුණ යටතේ විගණන විමසීම් වෙනුවෙන් අපගේ අදහස් දැක්වීම 2018.03.28 දිනැති මේ සමඟ අමුණා ඇති අංක 02 ලිපියේ 03 යටතේ ඔබ වෙත ඉදිරිපත් කර ඇති බව කරුණාවෙන් දැනුම් දෙමි.ඒ අනුව රජයේ පිළිගත් යාන්ත්‍රික ඉන්ජිනේරුවකුගේ වාර්තාවක් ලබා ගැනීමට දැනටමත් කටයුතු කර ඇත.

iv. 5.4 **ඡේදය**

මෙම කරුණ යටතේ විගණන විමසීම් වෙනුවෙන් අපගේ අදහස් දැක්වීම 2018.03.28 දිනැති ඇමුණුම් අංක 02 ලිපියේ 1 හි ii යටතේ කරුණු ඔබ වෙත ඉදිරිපත් කර ඇති බව කරුණාවෙන් දැනුම් දෙමි.ඒ අනුව ලොග් සටහන් පොත්වල හා ධාවන සටහන් පොත්වල අදාල තොරතුරු එදිනෙදා ඇතුලත් කිරීමට දනටමත් ආරම්භ කර ඇත.

**(ඇ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය**

**2 ඡේදය**

මෙම කරුණට අදාළ අපගේ අදහස් දැක්වීම යටතේ 2018.03.26 දිනැති ඔබ වෙත ඉදිරිපත් කර ඇති ඇමුණුම් අංක 03 ලිපියෙහි 02 යටතේ කරුණු ඉදිරිපත් කර ඇති බව කරුණාවෙන් දැනුම් දෙමි.ඒ සඳහා අවධානය යොමු කරන ලෙසත් කරුණාවෙන් ඉල්ලමි.මේ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයට කරුණු ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා ද අවධානය යොමු කර ඇත.

3. **මූල්‍ය සමාලෝචනය**

----------------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ නියාමන සභාවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 3,102,117/= ක ඌනතාවයක් පෙන්නුම් කරයි. එම ඌනතාවය පසුගිය වසරට වඩා රු. 2,128,124/= ක වැඩිවීමකි.

පසුගිය වසරට වඩා නියාමන සභාවේ ආදායම රු. 9,740,427/= කින් වැඩි වුවද නව බඳවා ගැනීම් සහ සාමාන්‍ය මෙහෙයුම් කටයුතු ද වැඩි වීම සභාවේ වියදම් වැඩිවීමට බලපා ඇත.

ආයතනයේ ක්‍රියාකාරීත්වය තුලින් ලද ආදායම රු. 11,948,908/= වූ අතර එය මුළු ආදායමින් සියයට 22 පමණ වේ. මෙම ආයතනය නියාමන කටයුතු කරන ආයතනයක් වන බැවින් ලැබෙන ආදායම වාර්ෂිකව නිකුත් කරනු ලබන බලපත්‍ර ප්‍රමාණය, ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන විකිරණශීලී ද්‍රව්‍ය ප්‍රමාණය හා අනුමත කරනු ලබන සැලසුම් ප්‍රමාණය මත තීරණය වේ.

තවද බලපත්‍ර නිකුත් කිරීම කාලපරිච්ඡේද 03 කට සිදු කරනු ලැබේ. එනම් වර්ෂ 01 කට වරක් වර්ෂ 02 කට වරක් හා වර්ෂ 03 කට වරක් වන බැවින්ද එයද අවුරුදු පතා ආදායම අඩු වැඩි වීමට හේතු වී ඇත.

එබැවින් නියාමන සභාවේ ආදායම ඉහල නංවා ගැනීම සඳහා 2018 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව කළමණාකාරීත්වය විසින් නියාමන සභාවේ සේවා සඳහා අයකරන ගාස්තු වැඩි කිරීම 2018 අප්‍රේල් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව ඉදිරියේදී ආදායම වැඩිකර ගැනීමට නියාමන සභාවට හැකියාවක් ලැබෙනු ඇත.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

### 4.1 කාර්යසාධනය

(අ) නියාමන සභාව විසින් පනතේ II (ඇ) මගින් පෙන්වා දී ඇති විධිවිධාන බලාත්මක කිරීම සඳහා බලපත්‍ර ලබා දීමේ ක්‍රියාවලිය හා සෝදිසි පරීක්ෂා සිදු කරනු ලබන අතර පනතේ විධි විධාන හා බලපත්‍ර කොන්දේසි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහත සඳහන් ක්‍රියාවලියන් ද බලගැන්වීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.

i. විකිරණ සේවකයන්ගේ සුදුසුකම් ස්ථාපිත කිරීම සඳහා රීතියක් දැනටමත් කෙටුම්පත් කිරීම අවසන් අදියරේ පවතින අතර එය 2018 දෙසැම්බර් මාසයේදී බලාත්මක කිරීමට අවශ්‍ය පියවරයන් ගෙන ඇත.

ii. දැනට ක්‍රියාත්මක සෝදිසි පරීක්ෂා කිරීම් වලට අමතරව බලපත්‍ර නොමැතිව විකිරණ ද්‍රව්‍ය/ X කිරණ යන්ත්‍ර භාවිතා කරන ස්ථාන ඇතොත් එම ස්ථාන නියාමන පාලනයට යටත් කර ගැනීමට නොදන්වා සිදු කරනු ලබන සෝදිසි පරීක්ෂා (Unannounced Inspections)වැඩ පිළිවෙලක් 2018 වර්ෂය සඳහා සකස් කර ක්‍රියාත්මක කර ඇත. එම වැඩ පිළිවෙලෙහි පිටපතක් ඇමුණුම් අංක 05 සමග අමුණා ඇත.

iii. දැනට නියාමන කටයුතු ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය වන විකිරණ ප්‍රවේශම හා සුරක්ෂිතතාවයට අදාල රෙගුලාසි දෙකක් කෙටුම්පත් කරමින් පවතින අතර එම රෙගුලාසි 2018 දෙසැම්බර් මාසයේ දී නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත භාෂා ත්‍රිත්වයෙන් ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත.

(ආ) ජාතික න්‍යෂ්ටික හා විකිරණශීලී හදිසි අවස්ථා කළමනාකරණ සැලැස්ම සඳහා දළ කෙටුම්පත සකස් කර අවසන් කර ඒ සඳහා වගකිව යුතු පාර්ශවයන් දැනුවත් කර ඔවුන්ගේ අවසන් යෝජනා ලබා ගැනීමට කටයුතු කර ඇත. මෙම යෝජනා ඇතුළත් අවසන් සැලැස්ම සමාලෝචනය සඳහා 2018 ජුලි මාසයේදී ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යොමු කිරීමට කටයුතු සූදානම් කර ඇත.

### 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

ඔබගේ 2018.03.12 දිනැති විගණන විමසීමට අනුව අප විසින් 2018.03.26 දිනැති මේ සමඟ අමුණා ඇති අංක 04 ලිපියෙහි 1 යටතේ අදහස් ඉදිරිපත් කර ඇත.විගණනය කරන අවස්ථාවේ දී සවිස්තරාත්මකව සකසන ලද ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කිරීමට නොහැකි වූ බැවින් එය ද මේ සමඟ ඇමුණුම් අංක 06 යටතේ ඉදිරිපත් කරමි.

**4.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

මේ සඳහා ඉහත කරුණට අදහස් දැක්වීම යටතේ 2018.03.26 දිනැති අංක 04 ලිපියෙහි 02 යටතේ කරුණු ඉදිරිපත් කර ඇත. ඒ අනුව ලිපි මඟින් මිල ගණන් කැඳවීමේ දී ඒවා ලියාපදිංචි තැපැලෙන් මිල කැඳවීම් ලිපි යැවීමට කටයුතු කර ඇත.ඒ අනුව අදාළ ප්‍රසම්පාදන කටයුතු භාර නිලධාරිට ලිපියකින් 2018.04.19 වන දින දැනුම් දෙන ලදී.

**4.4 අනාර්ථික ගනුදෙනු**

මෙම පරිගණක 06 ක් 2017 වර්ෂය අවසානයේදී අත්‍යාවශ්‍යයෙන්ම මිලදී ගැනීමට සැලසුම් කරනු ලැබුවේ අලුතින් බඳවා ගනු ලබන කළමනාකරණ සහායකවරු 08 සඳහා වේ. එහෙත් පළාත් පාලන මැතිවරණය 2018 ජනවාරි පැවැත්වීම හේතුවෙන් බඳවා ගැනීම් අනපේක්ෂිතව 2018 මාර්තු වන තෙක් නව බඳවා ගැනීම් කල් දැමීමට සිදුවිය. 2017 වසරේදී ප්‍රතිපාදන තුලින් මෙම මිළදී ගැනීම් කිරීමට සැලසුම් කර තිබුණ ද බඳවා ගැනීම් ප්‍රමාද වීම හේතුවෙන් මෙම MS පරිගණක මෘදුකාංග,මධ්‍යම සැකසුම් ඒකක, අඛණ්ඩ බල සැපයුම් ඒකක ආදිය මිළදී ගැනීම 2018 තෙක් ප්‍රමාද කරන ලදී.එබැවින් 2018 දී මෙම කොටස් මිළදී ගෙන දැනටමත් පරිගණක භාවිතයට ගන්නා ලදී.

**4.5 මතභේදයට තුඩු දෙන ගණුදෙනු**

**(අ) වෙළඳ නිවාඩු නොවන රජයේ ප්‍රසිද්ධ නිවාඩු**

2014 අංක 40 දරණ නව පනතින් ස්ථාපිත වූ නියාමන සභාව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත 2015/11/02 සිට රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනයක් යොදා ගැනීමට කටයුතු කරන ලදී. මේ සඳහා ප්‍රධාන ලෙස පහත කරුණු කෙරේ අවධානය යොමුකර විමර්ශනයෙන් පසු ක්‍රියාත්මක කිරීමට තීරණය ගෙන ඇත.අදාල අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පිටපත මේ සමඟ ඇමුණුම් 07 හි අමුණා ඇත.

1. නියාමන සභාවේ කටයුතු රජයේ බාහිර ආයතනයක් සමඟ නිතර සම්බන්ධතා පවත්වන ආයතනයකි.

2. එබැවින් රජයේ නිවාඩු දින සේවයේ යෙදීමෙන් රෝහල්, අනෙකුත් ආයතනයන් වසා ඇති බැවින් එම සියලු කාර්ය කිරීමට නොහැකි වීම.
3. ආයතනයේ අනෙකුත් කටයුතුසඳහා බැංකු හා අනෙකුත් මූල්‍යමය කටයුතු කිරීමට නොහැකි වීම.

4. තවද විදුලිය, ජලය වායුසමනය හා අනෙකුත් කටයුතු සඳහා අතිරේක ලෙස වියදම් දැරීමට සිදුවීම.

5. එමඟින් එම වියදම් මුදල් ඉතිරි වීමක් තුළින් රජයට මුදල් ඉතිරි වීමක් මෙන්ම බලශක්ති සංරක්ෂණයට ද හේතු වනු ඇත.

6. තවද සාප්පු හා කාර්යාල සේවක පනත අනුව රජයේ වෙළඳ නිවාඩු සති අන්තයේ හෝ පෝය වැනි වෙනත් දිනයක යෙදීම වෙනුවෙන් සේවකයින්ට ඒ සඳහා වෙනත් දිනයක් වෙළඳ නිවාඩුව ලබා ගත හැකි වේ.එහෙත් රජයේ නිවාඩු ක්‍රමයට නිවාඩු ලබා ගැනීම ක්‍රියාත්මක කළ දිනයේ සිට වෙළඳ නිවාඩු සති අන්ත හෝ නිවාඩු දිනයක යෙදීම තුලින් ඊට හිලව් නිවාඩුක් ලබා දීමද නතර කර එක් ක්‍රමයක් පමණක් ක්‍රියාත්මක කරන ලදී. ඉන් රජයට අවාසි සහගත නොවන ලෙසත් ඵලදායි ක්‍රියාකාරිත්වයන් මෙමගින් කළමණාකරණය කරන ලදී.

7. ඉහත කරුණ අනුව කටයුතු කිරීම තුළින් රටටත්, ආයතනයටත්, සේවකයින්ටත් වන පහසුව හා වාසිය ද සැලකිල්ලට ගෙන ඇත. කෙසේ වෙතත් විගණනයේදී පෙන්වා දී ඇති පරිදි සාප්පු හා කාර්යාල පනතට අනුව වෙළඳ නිවාඩු භාවිතා කිරීමට තීරණ ගැනීම සඳහා 2018 මැයි මස 25 දින පවත්වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බව කාරුණිකව දැනුම් දෙමි.

**(ආ) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංඛ්‍යාව සම්පූර්ණ නොවීම**

මේ සඳහා සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කීපයක දී මෙන්ම විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් වලදීද මෙම අධ්‍යක්ෂ මණ්ඩල පුරප්පාඩු පිරවීමට සාකච්චා වූ අතර ඒ සඳහා අවස්ථා කිහිපයක්දි ලිපි මඟින් ලේකම්, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය වෙත මෙම තත්වය දැනුම් දෙන ලදී.අදාල පරිදි අමාත්‍යාංශය වෙත 2016.01.27, 2016.07.01, 2016.08.23 හා 2016.11.30 දිනැති ලිපි මගින් ඉල්ලීම් ලේකම් තුමා වෙත යොමු කරන ලදී.එහි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

එහෙත් අමාත්‍යාංශය විසින් මෙතෙක් ඒම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොමැත.ඒබැවින් , නැවත මෙම පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය වෙත 2017.11.21 දිනැති ලිපි මඟින් දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

**4.6 මානව සම්පත් කළමණාකරණය**

i.

* නියාමන සභාවේ සේවක මණ්ඩල පුරප්පාඩු පිළිබඳ පෙන්වා දී ඇති කරුණු පරීක්ෂණ කරන ලද අතර 2017.12.31 දිනට පුරප්පාඩු 12 පැවතිය.ඉන් 08 ඒ අවස්ථාව වන විට පිරවීමට අනුමැතිය දී තිබිණි. 2018 ජනවාරි පළාත් පාලන මැතිවරණය පැවතීම හේතුවෙන් පුරප්පාඩු පිරවීම මාර්තු දක්වා කල් දැමීමට සිදු විය.ඉන් පසු පුරප්පාඩු පුරවා අවසන් වු අතර ඉතිරි වී ඇති පුරප්පාඩු 04 ඉදිරියේදී පිරවීමට කටයුතු කරනු ලැබේ. දැනටමත් කාර්යාල ඉඩ ප්‍රමාණය ප්‍රමාණයත් නොමැති බැවින් කාර්යාල ඉඩ ප්‍රමාණය වැඩි කර ගැනීමෙන් පසු මෙම පුරප්පාඩු 04 පිරවීමට කටයුතු කරනු ලැබේ.

* තවද සේවක සංඛ්‍යාව පිළිබඳ කාලීන සමාලෝචනයක් කර ඇති අතර එය අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර තව විද්‍යාත්මක නිළධාරි තනතුරු 04 ක් ඇති කිරීමටත් අලුතින් පරිපාලන හා මුදල් අධ්‍යක්ෂ තනතුරක් ඇති කිරීමටත් අනුමැතිය ලබා ගෙන එය අමාත්‍යාංශ හා භාණ්ඩාගාර අනුමැතියට ඉදිරිපත් කර ඇත.

* කාර්යාල ඉඩකඩ ප්‍රමාණය වැඩි කර ගැනීමට අමාත්‍යාංශය වෙතින් ලිපි මඟින් ඉල්ලුම් කර ඇත.

ii. දැනට බඳවා ගන්නා ලද නව කාර්ය මණ්ඩලය මගින් රාජකාරී සම්බන්ධ පරීක්ෂණ ක්‍රම වේදයක් ඇතිකිරීමට රාජකාරී විෂය පැවරීම් කටයුතු කර ඇත.

**5. අයවැය පාලනය**

---

නියාමන සභාවේ සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 10 ක තත්‍ය වියදම අයවැය ගත ප්‍රමාණයට වඩා සියයට 11 සිට 100 දක්වා ප්‍රමාණයකින් අඩුවීම හා එක් වැය විෂයක තත්‍ය වියදම අයවැය ගත ප්‍රමාණයට වඩා සියයට 11.53 කින් වැඩි වී ඇත.
ඊට බලපෑ හේතු වී ඇත්තේ ගමන් වියදම්, අනෙකුත් සේවා හා අලුත්වැඩියා හා නඩත්තු වියදම් වල අයවැයෙන් වෙන් කළ ප්‍රමාණයට වඩා තත්‍ය වියදම වෙළඳපළ මිල උච්චාවචනයට ලක් වීමයි.

ඉදිරියේදී මේ සම්බන්ධ අවධානය යොමුකර අයවැය ලේඛන ඵලදායි ලෙස යොදා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීමට සැලසුම් කර ඇත.

## 6. පද්ධති පාලනය

-----------------------------

මෙම කරුණු කෙරෙහි අවධානය යොමු කර ඇති අතර ඒ සම්බන්ධව ඉදිරි වර්ෂයේ දී නිසි පරිදි කළමණාකරණය කිරීමට සැලසුම් යොදනු ලැබේ.

**ස්තූතියි.**

මෙයට,
විශ්වාසි,



වෛද්‍ය සමන් හේවාමාන,
සභාපති,
<u>ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති  නියාමන සභාව</u>

ඇමුණුම (01)

SLAERC/IA/10 2018.03.26

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
රජයේ විගණන අංශය,
ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය,
60/460,
බේස්ලයින් පාර,
ඔරුගොඩවත්ත,
වැල්ලම්පිටිය.

මහත්මයාණෙනි,

<u>**මූල්‍ය ප්‍රකාශන පරීක්ෂාව - 2017**</u>

**විගණන විමසීම අංක POE/B/AC/AERC/2017/32/AQ/08**

ඉහත කරුණට අදාලව 2018.03.12 දින ඔබ විසින් එවන ලද විගණන විමසීම් හා බැදේ.. එම ලිපියේ දක්වා ඇති කරුණු හා සම්බන්ධව විගණනය කර අප ආයතනයට ලිපියක් මගින් අදාල කරුණු පෙන්වා දීම සම්බන්ධව මුලින්ම ස්තුතිය මෙයින් පලකර සිටිමි. ඒ අනුව අදාල විගණන නිරීක්ෂණ සඳහා පැහැදිලි කිරීම් හා පිළිතුරු පහත පරිදි ඔබ වෙත අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කරමි.

1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 07 - දේපල පිරියත හා උපකරණ

- ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව ඉහත ප්‍රමිතියේ 11 වන ඡේදයට අනුව භාවිතා කල මිනුම් කරන පදනම, ක්ෂය කිරීමේ ක්‍රමය, මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් ගිණුම් සටහන් වලට අනුව ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ සහ දේපල පිරියත උපකරණ සටහන් අංක 09 යටතේ හෙළිදරව් කර ඇත. මේ සම්බන්ධ නිරීක්ෂණ වලට අදාල විස්තර සහ පැහැදිලි කිරීමක් පහත සඳහන් වේ.
- සියලු වත්කම් පිරිවැය මත හෝ ප්‍රත්‍යාගණනය මත සරල මාර්ග ක්‍රමය අනුගමනය කරමින් එම වත්කම් වල ඇස්තමේන්තුගත ජීව කාලය තුල එම පිරිවැය ලියා හැරීම මත ක්ෂය ප්‍රතිපාදනය කරනු ලැබේ. (ඇමුණුම 01)
- සරල මාර්ග ක්‍රමය අනුගමනය කරමින් ක්ෂය කිරීමේ අනුපාතය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| **කාර්යාල උපකරණ, ලී බඩු හා සවිකිරීම්** | 10% | (වර්ෂ 10ට වැඩි) |
| **ඉලෙක්ට්‍රොනික් උපකරණ** | 25% | (වර්ෂ 04ට වැඩි) |
| **පරිගණක උපාංග හා මෘදුකාංග** | 33.33% | (වර්ෂ 03ට වැඩි) |
| **මෝටර් වාහන** | 25% | (වර්ෂ 04ට වැඩි) |
| **විද්‍යාත්මක උපකරණ** | 10% | (වර්ෂ 10ට වැඩි) |
| **පුස්තකාල පොත්** | 10% | (වර්ෂ 10ට වැඩි) |

- දේපල පිරියත හා උපකරණ මිලදී ගත් දින සිට ඉවත් කරන දින දක්වා ක්ෂය කිරීම සභාවේ ප්‍රතිපත්තිය වේ. මේ සම්බන්ධයෙන් සටහනක් යොදා නැති අතර ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි 2018 වසරේදී සටහනක් යොදා හෙළිදරව් කිරීමට කටයුතු කරනු ඇත.

- ඔබගේ නිරීක්ෂණය අනුව 2016 වසරට අදාල ඓතිහාසික පිරිවැය රු. 4,323,837.00 ක් වූ අයිතම 63 න් පිරිවැය රු. 114,314.00 ක් වූ අයිතම 08 ක් සභාව විසින් ප්‍රත්‍යාගණනය කර නැත.

  එම අයිතමයන් 2018 වසරේදී ප්‍රත්‍යාගණනය කර ගිණුම් පොත් වලට ගැනීමට කටයුතු කරනු ඇත. (ඇමුණුම 02)

  ගිණුම් කාලපරිච්ඡේදයේ (2017 වසර) ඓතිහාසික පිරිවැය රු. 9,655,840 ක් වූ අයිතම 16 ක් ප්‍රත්‍යාගණනය කිරීමෙන් තොරව භාවිතා කර බව ඔබගේ නිරීක්ෂණයයි. මේ සම්බන්ධ පැහැදිලි කිරීම පහත සඳහන් වේ.

  ඉහත සඳහන් ඓතිහාසික පිරිවැය රු. 9,655,840 වන අයිතම 16 ක් වසරට අදාලව ක්ෂය කල පසු පොත් වල අගය 2017.12.31 දිනට ශුන්‍ය වී ඇත. එම නිසා 2018 වසරේදී ප්‍රත්‍යාගණනය කර ගිණුම් පොත් වලට ගැනීමට කටයුතු කරනු ඇත. (ඇමුණුම 03)

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව 2017 ගිණුම් කාලපරිච්ඡේදයේ දී ඉදිරියට ලැබුණු ආදායම රු. 8,133,725 ක් (2018 / 2019 සහ 2020) ජංගම වගකීම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සටහන් කර ඇත.

ඔබගේ පහත නිරීක්ෂණයට අනුව 2017.12.31 දිනෙන් පසුව වසරකට ඉදිරියට ලැබුණු ආදායම ජංගම වගකීම් ලෙසත්, වසරකට වඩා ඉදිරියට ලැබුණු ආදායම් ජංගම වගකීම් නොවන වගකීම් ලෙසත් සටහන් කල යුතු බවයි.

| <u>කාල පරිච්ඡේදය</u> | <u>වටිනාකම (රු.)</u> |
|---|---|
| වසර 1ට වැඩි - 2ට අඩු | 3,514,633 |
| වසර 2 වැඩි -3 දක්වා | 7,700 |
| එකතුව | 3,522,333 |

ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි ජංගම වගකීම් හා ජංගම නොවන වගකීම් ලෙස 2018 වසරේදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ඇත.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 03 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස් වීම් හා වැරදි

ඔබ විසින් පෙන්වා ඇති පරිදි ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව පූර්ව කාල පරිච්ඡේදයේ වැරදි නිවැරදි කර නැවත ප්‍රකාශ කිරීමේදී ප්‍රාග්ධන වාසි ලෙස ගිණුම් ගත කර තිබූ රු. 105,973.00 ක මුදල මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වෙනත් ආදායම් ලෙස සටහන් කර නැත. සටහන් කර ඇත්තේ හිඟය (Deficit) ගිණුමේය.

ඉහත මුදල ප්‍රාග්ධන වාසි ගිණුම හර කර රු. 105,973.00 කින් හිඟය ගිණුම (Deficit Account) බැර කර ඇත. එය පහත සඳහන් ආකාරයට ගිණුම් ගත කර ඇත.

මෙය මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම් සටහන් 13 සහ 17 න් ද පෙන්වා ඇත.

**ගිණුම් සටහන 13**

**ප්‍රාග්ධන වාසි ගිණුම**

| | |
|---|---|
| 2017.01.01 ආරම්භක ශේෂය | 105,973 |
| ❖ අවුරුද්දේ ආරම්භක ශේෂයට ගැලපීම | (105,973) |
| | - |

**ගිණුම් සටහන් 17**

**හිඟය ගිණුම**

| | |
|---|---|
| 2017.01.01 ආරම්භක ශේෂය | (4,354,585) |
| ❖ අවුරුද්දේ ආරම්භක ශේෂයට ගැලපීම | (105,973) |

❖ මෙම ගැලපීම් සටහන් යොදන විට **පෙර වර්ෂයට ගැලපීම** ලෙස ප්‍රකාශ කිරීම වෙනුවට **ආරම්භක ශේෂයට ගැලපීම** යන්න ප්‍රකාශ කර ඇත. ඒ අනුව ආරම්භක ශේෂයට ගැලපීම ලෙස ප්‍රකාශ කිරීමේදී සිදු වී ඇති වරද සිදු නොවීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වනු කැමැත්තෙමි.

2. ලැබිය යුතු ගිණුම්

ඉහත කරුණු යටතේ ණයගැති ශේෂය රු. 122,289.00 (2017.12.31 දිනට) වූ මුදලෙන් එක් ආයතනයක් හැර අනෙකුත් සියලුම ආයතන රජයේ රෝහල් හා එවැනි ආයතනයන් වේ.ණයගැති මුදල් අයකර ගැනීමට සියලු ප්‍රයත්නයන් දැරූ අතර ඉහත මුදල ලබා ගැනීමට හැකියාවක් නැත. හිඟ ණය මුදල් කපා හැරීම සම්බන්ධව අවශ්‍ය උපදෙස් ලබාගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය, විදුලි බල අමාත්‍යාංශයේ ලේකම්තුමාගෙන් විමසීම් කරන ලෙස දැනුම් දී ඇත. ඒ අනුව ඔහුගේ උපදෙස් පරිදි ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

3. හඳුනා නොගත් තැන්පතු

පහත සඳහන් තැන්පතු, ආයතන විසින් බලපත්‍ර අයදුම්පත් ලබා ගැනීමට සහ අලුත් කිරීමේ කාර්යය සඳහා සෘජුවම බැංකුව වෙත ප්‍රේෂණය කර ඇති මුදල් වේ. බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව ඒවායේ කාල සීමාව මාස 01 සහ මාස 06 ක් අතර වේ. මෙම තැන්පතු පිළිබඳ විස්තර ඇතුලත් මුදල් තැන්පතු පත්‍රිකා හෝ එම තොරතුරු ඇතුලත් වෙනත් ලියවිල්ලක් අදාල ආයතන විසින් සභාව වෙත දැනුම් දී නැත. බැංකුවෙන් විමසීම් කලද බැංකුව පැවසුවේ තැන්පත් කරුවන් සොයා දීමට අපහසු බවයි. එම නිසා මෙම හඳුනා නොගත් තැන්පත් මුදල් “හඳුනා නොගත් තැන්පතු“ ලෙස ආදායමට බැරකිරීමට කටයුතු කරනු ඇත.

| | |
|---|---|
| 07.06.2017 - මුදල් තැන්පතු | 12,550.00 |
| 01.08.2017 - මුදල් තැන්පතු | 12,550.00 |
| 22.08.2017 - මුදල් තැන්පතු - 882213730V | 2,000.00 |
| 29.11.2017 - මුදල් තැන්පතු | 2,000.00 |
| | 29,100.00 |

ස්තුතියි,
මෙයට විශ්වාසී,



වෛද්‍ය සමන් හේවාමාන
**සභාපති**
**ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව**

ඇමුණුම (02)

**SLAERC/IA/10**

28.03.2018

විගණන අධිකාරී,
රජයේ විගණන අංශය,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය,
ඔරුගොඩවත්ත.

මහත්මයාණනි,

**වාහන පාලනය සඳහා විගණන විමසීම් වෙනුවෙන් අදහස් දැක්වීම**
**------------------------------------------------------------------------**

**වාහන පාලනය**

ඉහත විෂය පථයට අදාල තොරතුරු පරීක්ෂා කර ආයතනයේ කටයුතු යහපත්ව පවත්වාගෙන යාම සඳහා අප වෙත ලබා දුන් නිරීක්ෂණයන්ට සහ විමසීම් වෙනුවෙන් ස්තුතිවන්ත වෙමි. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව සතුව නිල වාහන 02ක් හා සංචිත වාහන 03ක් පමණක් ඇති බව කරුණාවෙන් දැනුම් දෙමි. සංචිත වාහන 04 ලෙස ඔබගේ වාර්තාවේ දක්වා තිබීම 03ක් ලෙස නිවැරදි විය යුතුය.

1. <u>වාහන සම්බන්ධයෙන් පොත් පත්, ලේඛන, වාර්තා, ධාවන සටහන් පවත්වාගෙන නොයාම</u>

   මෙම අඩුපාඩු පෙන්වා දීම සම්බන්ධව ඔබ වෙත කෘතඥතාව පළ කරමි. මෙම වාහන සඳහා Maintainers Register නමින් ලේඛන නියාමන සභාවේ පවත්වා ගෙන යයි. වාහන පිළිබඳ සියළු තොරතුරු මෙහි අඩංගු වේ. එහෙත් ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි මුදල් රෙගුලාසි අනුව නියමිත ලේඛන වල සටහන් වී නැත.එබැවින් එය නිවැරදි කිරීමට පෙන්වා දුන් කරුණු සම්බන්ධව පහත පරිදි කටයුතු යොදන ලදී.

   i. මුදල් රෙගුලාසි 110 (1) හානි පිළිබඳ ලේඛනයක් දැනට පවත්වාගෙන ගොස් නොමැත. ඒ අනුව 01/01/2018 සිට මෙම ලේඛනය පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. 2018 ජනවාරි මස සිට චක්‍රලේඛ අනුව ලොග් පොත් වල සටහන් යෙදීමට ප්‍රවාහන භාර නිලධාරී වෙත උපදෙස් දෙන ලදී.

   ii. අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දින නිකුත් කරන ලද චක්‍රලේඛයට ප්‍රකාරව වාහන වල ඉන්ධන ප්‍රමාණය හා ධාවනය කරන දුර ප්‍රමාණය පිළිබඳ ලොග් සටහන් පොතට මාසිකව ඇතුලත් කිරීමට නොහැකි විය. ඔබගේ නිරීක්ෂණ අනුව පෙන්වා දී ඇති සටහන් දිනපතා ඇතුළත් කරනුයේ පොදු 268 ධාවන සටහන් වාර්තාවේ සියළු තොරතුරු ඇතුලත් කර ඇත.ඒ අනුව ඉදිරියේ දී චක්‍රලේඛ පරිදි අදාල සටහන් ලොග් පොතෙහි යෙදීමට ප්‍රවාහන භාර නිලධාරී වෙත උපදෙස් දී ඇත.

iii. මෙම චක්‍රලේඛයේ 3.3 වගන්තියට අනුව වාහන සම්බන්ධ සටහනක් ආකෘතිය අනුව මාසිකව සැකසීමට නොහැකි විය. තවද 2017, 03 කාර්තුවේ අභ්‍යන්තර විගණන වාර්තාව අනුවද 2018 ජනවාරි සිට චක්‍රලේඛයේ පරිදි මාසික වාර්තා සකසා එවීමට කටයුතු කිරීමට සැලසුම් කර ඇත.

iv. PA -3473 වාහනයේ ලොග් පොතෙහි පමණක් ප්‍රමාද දෝෂයකින් නියමිත දිනට සටහන් යොදා නොමැති බැවින් මෙම වසරේ සිට අදාල අළුත්වැඩියාවන් නිසි දින සමඟ ලොග් පොතට ඇතුලත් කිරීමට කටයුතු යොදා ඇත. එසේම මෙම අළුත්වැඩියාවන් දින පිළිවෙලින් ඇතුලත් කිරීමට ද කටයුතු යොදා ඇත.

2. <u>වාහන නීති රීති සම්බන්ධයෙන් රජයේ නීති රීති රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකිරීම</u>

65-4530 දරණ රථය 2017.04.03 දින සිදුවූ අනතුරට අදාලව ඔබගේ නිරීක්ෂණ සම්බන්ධව අදහස් හා පිළිතුරු පහත සඳහන් පරිදි ඉදිරිපත් කරමි.

i. 2017 අප්‍රේල් 03 වන දින සිදු වූ 65-4530 දරණ වාහනයේ රිය අනතුර පිළිබඳ පහත සඳහන් ක්‍රියා පිළිවෙත් කරන ලදි. මේ අනතුර පිළිබඳ සියළු වගකීම් තෙවන පාර්ශවයේ රියදුරු බාරගත් බැවින් ද පොලිස් පරීක්ෂණ වලින් අප රියදුරු මහතා නිවැරදි වූ බැවින් ද, මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු නොකරන ලදි. මේ පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්තුමා ද දැනුවත් කර ඇත.ඉදිරියේදී මෙවැනි අතපසුවීම් සිදු නොවී නිසි පරිදි මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීමට ප්‍රවාහන භාර නිලධාරී වෙත උපදෙස් දී ඇත.

ii. ඉහත පරිදි පරීක්ෂණයක් නොකල බැවින් අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් නොකරන ලදී. අදාල අනතුර අලාභය රක්ෂණය මගින් අළුත්වැඩියා කර ගත් අතර නියාමන සභාව විසින් කිසිදු මුදලක් මේ සඳහා වැය නොවීය. තවද ඉදිරියේදී අදාල කටයුතු වෙනුවෙන් පරීක්ෂණ පවත්වා වාර්තා කිරීමට ද ප්‍රවාහන භාර නිලධාරී වෙත උපදෙස් දී ඇත.

iii. ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි අංක 65-4530 දරණ රථයෙහි ලොග් පොතෙහි සටහන් යෙදීමට නොහැකි වී ඇත.එබැවින් ඔබගේ නිරීක්ෂණ අනුව එම සටහන් ලොග් පොතට ඇතුලත් කිරීමට කටයුතු කරන ලද අතර ඉදිරියේදී පෙන්වා දී ඇති පරිදි ලොග් පොතට ඇතුලත් කිරීමට උපදෙස් දී ඇත.

**3.** රු.649,147.00 ක වියදමින් කරන ලද අළුත්වැඩියාවන් සඳහා අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අනුමැතිය මත එම වාහනයේ **"නියෝජිත ආයතනය"** වන **Micro**වෙතින් අදාල අළුත්වැඩියාවන් කර ඇති බැවින් මෝටර් රථ ඉංජිනේරුවරයෙකුගේ වාර්තා ලබා ගෙන නොමැත. එහෙත් එම ආයතනයේ මෝටර් රථ ඉංජිනේරුතුමාගේ වගකීම් පිළිබඳ නිර්දේශයන් ලබා දී ඇත. ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය සඳහා අතිරේක අංක 28 දරණ 2014.07.04 දින නිකුත් කරන ලද මාර්ගෝපදේශ යොමුව 2.14.1 අනුව අමාත්‍යාංශ ලේකම් තුමාගේ අනුමැතියට යටත්ව මෙම අළුත්වැඩියාව සිදු කරනු ලැබීය. මේ සඳහා ඉදිරියේදී මෝටර් රථ ඉංජිනේරුවරයෙකුගේ නිර්දේශ වාහන අළුත්වැඩියාවන් වෙනුවෙන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීමට ප්‍රවාහන භාර නිලධාරී වෙත උපදෙස් දෙන ලදී.

4. <u>වාහන පිළිබඳ අභ්‍යන්තර පාලනයේ දුර්වලතා</u>

i. ඉන්ධන දහනය පරීක්ෂාව මාස 06කට වරක් කරනු ලබන ඉන්ධන තුලන වාර්තාවේ ලබා ගත් දත්ත අනුව පොත් තුලනයක් සිදු කළ ද බොහෝ අවස්ථාවල දී ආයතනයේ දුර ගමන් සේවා සිදු කිරීම නිසා ඉන්ධන ඉතුරු වීමේ ප්‍රවනතාවයක් දැකිය හැක. එසේ වුව ද එම වැඩි වු ඉතිරි ඉන්ධන පිළිබඳ සටහන් තබා ධාවනය සඳහාම යොදා ගනී. මේ පිළිබඳ වෙනස් කළ යුතු යම් දෙයක් ඇතොත් වැඩිපුර උපදෙස් ලබා දෙන මෙන් ඉල්ලමි. එසේම දැනට ඉන්ධන පරීක්ෂාව කරනු ලබන්නේ කොළඹ අවට බැවින් මෙම ඉන්ධන පරීක්ෂාවේ දී දැවීම අධික වන බැවින් ඉදිරියේදී මේ සඳහා කොළඹින් බැහැර ප්‍රදේශ තුලද ධාවනය කර අදාල ඉන්ධන තුලනය කිරීමට කටයුතු යොදා ඇත.

ii. අභ්‍යන්තර චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු නොකිරීම.

අප සභාව මඟින් අංක D/01/2016 හා 2016 අගෝස්තු 04 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛ මඟින් සියළුම රියදුරන් දැනුවත් කර ඇත. මෙම චක්‍රලේඛය අනුව වසර පුරා මෙය ක්‍රියාත්මක කිරීමට අවස්ථාවක් නොවුණි.එබැවින් ඉදිරියේ දී මෙම වාර්තාවට අනුව කටයුතු කිරීමට ප්‍රවාහන භාර නිලධාරී වෙත උපදෙස් දෙන ලදී.

ස්තූතියි !

මෙයට විශ්වාසී,



වෛද්‍ය සමන් හේවාමාන,
සභාපති,
<u>ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව</u>

<u>පිටපත</u>

01. අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව)
02. ප්‍රවාහන භාර නිලධාරී (ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව)

ඇමුණුම (03)

SLAERC/IA/10 2018.03.26

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
රජයේ විගණන අංශය,
ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය,
60/460,
බේස්ලයින් පාර,
ඔරුගොඩවත්ත,
වැල්ලම්පිටිය.

මහත්මයාණෙනි,

## මූල්‍ය ප්‍රකාශන පරීක්ෂාව - 2017

**විගණන විමසීම අංක POE/B/AC/AERC/2017/21/AQ/05**

ඉහත කරුණට අදාලව 2018.02.21 දින ඔබ විසින් එවන ලද විගණන විමසීම් හා බැදේ.

එම ලිපියේ දක්වා ඇති කරුණු හා සම්බන්ධව විගණනය කර අප ආයතනයට ලිපියක් මගින් අදාල කරුණු පෙන්වා දීම සම්බන්ධව මුලින්ම ස්තූතිය මෙයින් පලකර සිටිමි. ඒ අනුව අදාල විගණන නිරීක්ෂණ සඳහා පැහැදිලි කිරීම් හා පිලිතුරු පහත පරිදි ඔබ වෙත අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කරමි.

1. මුදල් සම්බන්ධ අධිකාරිය පවරා දීම

(අ) ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට අනුව මූල්‍ය කටයුතු පාලනය සඳහා අධිකාරිය පවරා දී ඇති නිලධාරීන්, බලය දීම, අනුමැතිය දීම, සහතික කිරීම සහ ගෙවීමේ කාර්යයන් මුදල් රෙගුලාසි 135ට අනුව සිදු කර අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ඇමුණුම් අංක 01 දක්වා ඇත. මේ සම්බන්ධ නිරීක්ෂණ වලට අදාල විස්තර ඇතුලත් ලේඛනයන් හා පැහැදිලි කිරීමක් පහත සඳහන් වේ.

| CB අංක | නම | කාරණය | මුදල | බලය දීම | ගෙවීමට අනුමැතිය | සහතික කිරීම | වවුචර් වලට මුදල් ගෙවීම |
|---|---|---|---|---|---|---|---|
| CB 99 | එච්.එල්.අනිල් රංජිත් මයා (අධ්‍යක්ෂ ජනරාල්) | Traveling convention on Nuclear safety | 566,318.39<br>(නිවැරදි මුදල) | 2017.01.13 දින අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක BP 2017-01-05 හි තීරණ මත. අධ්‍යක්ෂක මණ්ඩලය | සභාපතිතුමන්ගේ 2017.03.23 දිනැති අනුමත ලිපිය මත. සභාපති | ගණකාධිකාරි | 01.ගණකාධිකාරි<br>02.අධ්‍යක්ෂ ජනරාල් |
| CB 119 | GNPS එන්ටප්‍රයිසස් | සහතික පත් මුද්‍රණය | 43,925.00 | අධ්‍යක්ෂ ජනරාල් | අධ්‍යක්ෂ ජනරාල් | ගණකාධිකාරි | 01.ගණකාධිකාරි<br>02.අධ්‍යක්ෂ ජනරාල් |
| CB 70 | මෙගා ඉන්ටනෙට් කැෆේ | වාර්ෂික වාර්තා මුද්‍රණය | 208,125.00 | අධ්‍යක්ෂ ජනරාල් | අධ්‍යක්ෂ ජනරාල් | ගණකාධිකාරි | 01.ගණකාධිකාරි<br>02.අධ්‍යක්ෂ ජනරාල් |
| CB 69 | එම්.පී.අයි.එම් .රශ්මි මයා | පරිවර්තන ගාස්තු | 30,452.00 | අධ්‍යක්ෂ ජනරාල් | අධ්‍යක්ෂ ජනරාල් | ගණකාධිකාරි | 01.ගණකාධිකාරි<br>02.අධ්‍යක්ෂ ජනරාල් |

අධ්‍යක්ෂ ජනරාල් එච්.එල්.අනිල් රංජිත් මයාට විදේශ ගමන් සඳහා ගෙවූ මුදල විගණන විමසුමේ රු.56,631,839.00 ලෙස සටහන් වී ඇති නමුත් එම මුදල රු.566,318.39 ලෙස නිවැරදි විය යුතුයි. මූල්‍ය පාලනය සම්බන්ධ අධිකාරිය පවරා දීම පුලුල් කිරීම සඳහා අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරනු ඇත. විගණන විමසීම් කල ඉහත සඳහන් ගනුදෙනු සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලත් පත්‍රිකාව ඇමුණුම් අංක 02 යටතේ ඉදිරිපත් කරමි.

(ආ) <u>මුදල් රෙගුලාසි (231) 2 ට ප්‍රකාරව වවුචර් වල මතුපිට කුවිතාන්සි ලියවිලි අමුණා ඇති බව සඳහන් නොකිරීම.</u>

1. <u>එච්.එල්.අනිල් රංජිත් මයා (අධ්‍යක්ෂ ජනරාල්) - විදේශ ගමන් රු. 56,631,839.00</u>

   මෙම ගනුදෙනුවට අදාල වවුචරයේ අමුණා ඇති ලියවිලි එකින් එක සඳහන් කර නොමැති අතර අයදුම හා අනුමැතිය අමුණා ඇති බවට සටහනක් යොදා ඇති බව දැනුම් දෙමි.

   එහෙත් ඔබගේ නිරීක්ෂණ අනුව ඉදිරියේදී අදාල වවුචර් වල ඇමුණුම් එකින් එක අමුණා ඇති බවට සඳහන් කිරීමටද උපදෙස් දෙන ලදී. විගණන විමසුමේ දක්වා ඇති ඉහත මුදල රු. 566,318.39 ලෙස නිවැරදි විය යුතුවේ.

2. <u>සහතික පත් මුද්‍රණය - රු.43,925.00</u>

   මෙම වවුචරයේ මතුපිට සියලුම ලේඛන ඇතුලත් කර ඇති බවට සටහනක් යොදා ඇති බව දැනුම් දෙමි. තවද එම වවුචර් වල ඇමුණුම් එකින් එක සඳහන් කිරීමටත් උපදෙස් දෙන ලදී.

3. <u>වාර්ෂික වාර්තාව - රු.208,125.00</u>

   මෙම වවුචරයේද මතුපිට සියලුම ලේඛන ඇතුලත් බවට සටහනක් යොදා ඇති බව දැනුම් දෙමි. එහෙත් ඔබගේ නිරීක්ෂණ අනුව අමුණා ඇති ලේඛන එකින් එක වවුචරයේ සඳහන් කිරීමට උපදෙස් දෙන ලදී.

4. <u>පරිවර්තන ගාස්තු - එම්.පී.අයි.එම්. රශ්මි මයා - රු.30,452.00</u>

   මෙම ගනුදෙනුවට අදාල වවුචරයේ මතුපිට අයදුම හා අනුමැතිය ඇති බවට සටහනක් යොදා ඇති බව දැනුම් දෙමි. ඉදිරියේදී මෙම ඇමුණුම් එකින් එක වවුචරයේ සටහන් කිරීමට කටයුතු යොදා ඇත.

2. <u>1994 ජූනි 14 දින අංක 95 චක්‍රලේඛ ප්‍රකාරව ගෙවීම් කටයුතු කිරීම</u>

විකිරණ පරීක්ෂණ කටයුතු වල යෙදෙන පරීක්ෂකවරුන්ට රු, 2000.00 බැගින් නවාතැන් ගාස්තු ගෙවීම අංක 95 දරණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයට අනුව ගෙවීම් ප්‍රතිලාභ හිමි නැති බව 2016 වසරේ විගණන වාර්තාවේ වාර්තා කර ඇත. එහෙත් පරීක්ෂකවරුන්ට ගෙවීම සම්බන්ධ විමසීම් ලිපියක් ලේකම්, විදුලි බල අමාත්‍යංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට 2018.01.04 දින ලිඛිතව යොමු කර ඇත. බලපත්‍ර අලුත් කිරීමෙන් පසු යම් දිනක පරීක්ෂණ පැවැත්වීම අනිවාර්ය කාර්යයක් බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය හා පණතේ විධි විධාන වලට අනුව සියලු කටයුතු ගැන අවධානය යොමු කර තව දුරටත් පරීක්ෂකවරුන්ට නවාතැන් ගාස්තු ලෙස රු. 2000.00 දක්වා උපරිම මුදල ගෙවීමට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව තීරණය කර ඇත.

තවද 2018.02.23 දින අමාත්‍යාංශයේ දී පැවති විගණන හා කළමනාකරණ රැස්වීමේදී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල අතර අමාත්‍යාංශයේ ලේකම් තුමා විසින් මෙම දීමනාව සඳහා මුදල් අදාල ආයතනවලින් ලබා ගන්නා බැවින් ද රජයේ මුදල් භාවිතා කිරීමක් නොකරන හෙයින් ද මෙම ගෙවීම නැවැත්විය නොහැකි බව ප්‍රකාශ කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පිටපතද අමුණා ඇත.

තවද මෙම ගෙවීම් කිරීමට ප්‍රධාන වශයෙන් පහත කරුණු කෙරේ අවධානය යොමු කරන ලද අතර ඒ අනුව තීරණ ගැනීමට සිදු විය.

1. මෙම මුදල ඇතුලත්ව පරීක්ෂණ සේවා ගාස්තු තීරණයේදී අදාල ආයතනයෙන් මුදල් අය කරනු ලැබීම.
2. රජය සතු වැඩි වටිනාකමක් ඇති විද්‍යාත්මක උපකරණ මේ සඳහා යොදා ගන්නා බැවින් ඒ සඳහා විශේෂ ආරක්ෂාවක් ලබා දීම හා ස්ථානගතකිරීම ආයතනය සතු වගකීමක් වීම.
3. ආයතනය විසින් අදාල නියාමන කටයුතු කිරීමේදී නිසි පරිදි අදාල කාර්යය පවත්වාගෙන යාමට ඇති අවශ්‍යතාවය.
4. කොළඹින් බැහැර යෑමේදී දෛනිකව පරීක්ෂණ සඳහා යාම නිසා ප්‍රවාහන වියදම් අධික වීම අවම කිරීමට හැකිවීම.
5. බාහිර රෝහල් හා පරීක්ෂණ ස්ථාන වල හදිසි සෝදිසි වලට යාමට සිදු වීම.

3. <u>තොග කළමනාකරණය</u>

(අ) ගබඩා සැපයුම් සඳහා ගෙවීම් සිදු කිරීම

විගණන විමසුමට අදාල Box file 100 ප්‍රමාණය 2015 ඔක්තෝම්බර් 07 වන දින ගබඩාවට ලැබී ඇති අතර එදිනම භාණ්ඩ ලැබීම් පත් නිකුත් කර ඇත. තවද තොග ලෙජරයෙහිද (2015.10.07) එදිනම ඇතුලත් කර ඇත. ඒ අනුව 2015.12.18 වන දිනෙන් පසු දිනෙක සටහන් වී තිබීම යන්න නිවැරදි නොවන බව කරුණාවෙන් දැනුම් දෙමි. මෙහි තොග ලේඛනයේ පිටපත ඇමුණුම් 04 යටතේ ඇත.

(ආ) අරපිරිමැස්මෙන් තොරව භාණ්ඩ මිලදී ගැනීම

1. අවම තොගය ලෙස NF binder පොත් 02ක් තබා ගත යුතුව ඇත. එබැවින් වැඩිපුර පොත් 02ක් ඇති අතර ඉදිරි සැපයුම් කිරීමේදි අරපිරිමැස්මෙන් කටයුතු කිරීමට සැලසුම් කරගන්නා ලදී.

2. එදිනෙදා අවශ්‍යතාවයන් සඳහා "5S" වැඩ සටහන මත Box file මිලදී ගෙන ඇති අතර අදාල ප්‍රමාණය විද්‍යාත්මක අංශය වෙත 2015.12.18 නිකුත් කර ඇත. නමුත් එම Box file විද්‍යාත්මක අංශයේ තබා ගැනීමට ස්ථානයක් නොමැති නිසා ගබඩාවේ තාවකාලිකව තබා ඇත. එය දැනට ගබඩාවෙන් අදාල අංශය වෙත භාරදෙන ලදී. දැනට නව ස්ථාන සඳහා මෙම Box file යොදා ගෙන ලිපි ගොනු සෑදීම කරගෙන යනු ලැබේ.

(ඇ) මුදල් රෙගුලාසි 156 (5) ප්‍රකාරව තොග ලේඛන නිවැරදිව සිදු නොකිරීම

තොග ලෙජරයේ සටහන් ලිවීම් කිරීමේදී ලිවීමේ දෝෂ සිදුවී ඇත. එය සිදුවිය නොහැකි දෙයක් බැවින් ඉදිරියේදී නිවැරදි ක්‍රමවේදය අනුගමනය කිරීමට කටයුතු කරන අතර නැවත ටිපෙක්ස් භාවිතා නොකිරීමට සටහන් කරගන්නා ලදී. ඒ සඳහා උපදෙස් ද ලබා දී ඇත.

ස්තූතියි,
මෙයට විශ්වාසී,



වෛද්‍ය සමන් හේවාමාන
**සභාපති**
**ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව**

පිටපත : 1. අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව

2. ගණකාධිකාරී
ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව

ඇමුණුම (04)

රජයේ විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
රජයේ විගණන අංශය, ශ්‍රී ලංකා පරමාණුක බල ශක්ති මණ්ඩලය,
60/460, බේස්ලයින් පාර,
ඔරුගොඩවත්ත

මහත්මයාණෙනි,

**<u>ප්‍රසම්පාදන විගණනය - 2017</u>**

**<u>විගණන විමසීම් අංකය : POE/B/A/AERC/2017/12/AQ(07)</u>**

ඉහතකරුණට අදාලව 2018-03-12 වන දින ඔබගේ අංක POE/B/A/AERC/2017/12/AQ(07) දරණ ලිපිය හා බැදේ.

එම ලිපියේ දක්වා ඇති කරුණු හා සම්බන්ධව විගණනය කර අප ආයතනයට ලිපියක් මගින් අදාල කරුණු හා නිරීක්ෂණ පෙන්වා දීම සම්බන්ධව මුලින්ම ස්තුතිය මෙයින් පලකර සිටිමි.

ඒ අනුව අදාල විගණන නිරීක්ෂණයක් සඳහා පැහැදිලි කිරීම් හා පිළිතුරු පහත පරිදි ඔබ වෙත අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කරමි.

1. <u>ප්‍රසම්පාදන සැලැස්ම</u>

   රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව නියාමන සභාවේ ද ප්‍රසම්පාදන කටයුතු කරනු ලැබේ. ඒ අනුව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකසා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. ඔබ විසින් දක්වා ඇති පරිදි හය මාසික (06) විස්තරාත්මකව ප්‍රසම්පාදන සැලැස්මක් සකසා නොමැත. එබැවින් ඉදිරි වසරේ සිට ඔබගේ නිරීක්ෂණයන්ට අනුව මාස 06 කට වරක් විස්තරාත්මක සැලැස්මක් සකසා මිළදී ගන්නා නව මිළදී ගැනීම් යාවත්කාලින කිරීමට කටයුතු කරනු ලබන බව කරුණාවෙන් දැනුම් දෙමි.

2. <u>රු. 1,411,230 ක් වටිනා භාණ්ඩ වර්ග 12ක් සඳහා අවස්ථා 16 කදී මිලට ගෙන තිබුණි. මේ සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ලංසුකරුවන් ලංසු කැඳවීම් ලිපි සාමාන්‍ය තැපැලෙන් යවා තිබූ නිසා සත්‍ය වශයෙන්ම ලංසුකරුවන් සඳහා මෙම ලංසු කැඳවුම් නිකුත් කළාද, යන්න විගණනයට තහවුරු නොවීම.</u>

   ආයතනයේ ප්‍රදානතම අයිතමයන් මිළදී ගැනීමේදී ඒවා ලියාපදිංචි තැපෑලෙන් මිළ කැඳවුම්පත් යවනු ලැබේ. එහෙත් ඔබ විසින් පෙන්වා ඇති පරිදි සුළු අයිතමයන් මිළදී ගැනීමේදී එය සාමාන්‍ය තැපැලෙන් මිළ ගණන් ලබා ගැනීම සිදු කර ඇත.

එබැවින්, ඔබ විසින් පෙන්වා ඇති පරිදි මින් ඉදිරියේදී සියලුම මිළ කැඳවීම් ලියාපදිංචි තැපැල මගින් මිළ ගණන් ලබා ගැනීමට කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී.

3. <u>Portable Air Sampler මිළට ගැනීම</u>

ඉහත කරුණට අදාළව භාණ්ඩ සැපයීමට 2017 ඔක්තෝම්බර් 06 වන දින ගැණුම් ඇණවුම් අංක 0308 (Purchase Order No. 0308) මගින් අදාල ආයතනයට පිරිනමා ඇත. ***(ඇමුණුම - 01 මගින් පිටපත අමුණා ඇත)*** නමුත් 2017 දෙසැම්බර් 20 දින ආයතනයට අදාල භාණ්ඩය ලැබුණි. එහිදී අදාල භාණ්ඩය නිසි පරිදි අපගේ පිරිවිතරයන්ට අදාලව ඇද්දැයි පරික්ෂා කිරීමට තාක්ෂණ ඇගයීමේ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. ඒ අනුව එහිදී ඔවුන්ගේ වාර්තාව අනුව භාණ්ඩයේ පිරිවිතර කීපයක් නොගැලපීම නිසා නැවත අදාල භාණ්ඩය 2017 දෙසැම්බර් 26 වන දින ආපසු අදාල සැපයුම්කරු වෙත භාරදෙන ලදී. ***(ඇමුණුම - 02 මගින් ලිපියේ පිටපත අමුණා ඇත)***

පසුව අදාල සැපයුම්කරු වෙත කිහිපවරක්ම වාචිකව අදාල භාණ්ඩය නොලැබීමට හේතුව විමසන ලදී. එහිදී ඔවුන් දන්වා සිටියේ මෙම අයිතමය නිෂ්පාදනය කරනු ලබන විදේශීය නිෂ්පාදිත ආයතනයෙන් සිදුවී ඇති ප්‍රමාදයක් බැවින් එය ගෙන්වා ගැනීමට හා ප්‍රවාහනය කිරීම නොවැළැක්විය හැකි කාලයක් ගත වන බව සැපයුම්කරු වාචිකව දැනුම් දෙන ලදී. ඒ සම්බන්ධව දැනටමත් කඩිනමින් ගෙන්වා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලද බව සැපයුම්කරු දන්වන ලදී.

ඒ අනුව 2018 මාර්තු 16 වන දින අදාල සැපයුම්කරු වෙත මෙම භාණ්ඩ ලැබීම ප්‍රමාදය නිසා ප්‍රමාද ගාස්තු ලෙස අයකර ගන්නා 10%ක උපරිම මුදල මුළු වටිනාකමින් අඩු කරගන්නා බව දන්වා ලිපියක් ලියාපදිංචි තැපැලෙන් සැපයුම්කරුට දන්වා යවන ලදී. ***(ඇමුණුම - 03 මගින් ලිපියේ පිටපත අමුණා ඇත)***

4. <u>Supply, Installation, Commissioning of a Gamma Spectroscopy System (GSS) with Software and Provision of Training for Staff</u>
<u>මුල් පිටපත ඉදිරිපත් නොකරන ලද ලංසුකරු සඳහා ප්‍රසම්පාදනය පිරිනැමීම</u>

ඉහත කරුණට අදාලව ලංසු විවෘත කරන අවස්ථාවේ දී සියළුම ලංසුකරුවන් මුල් පිටපත හා අනු පිටපත වෙන වෙනම ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව අනු පිටපත් කට්ටල සහිත ලිපි කවරය විවෘත නොකර එය නැවත අවශ්‍ය වුවහොත් විවෘත කිරීම වෙනුවෙන් අභ්‍යන්තර විගණක භාරයේ තබා ඇත. ප්‍රසම්පාදනය පිරිනැමූ ලංසුකරුගේ අනු පිටපතද අභ්‍යන්තර විගණක භාරයේ තබා ඇත.

මෙහිදී සිදුවී ඇත්තේ ලංසුකරු විසින් අප දෙන ලද ලංසු අයදුම්කිරීමේ ලියකියවිලිවලට ඡායා පිටපතක් ලබාගෙන එය පුරවා ඔවුන්ගේ නිල අත්සන සහ නිල මුද්‍රාව තබා ඉදිරිපත් කිරීම පමණි. මේ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි භාණ්ඩාගාරය නියෝජනය කල ගණකාධිකාරීවරයාගෙන් විමසු විට ඔහු පැවසුවේ මුල් අත්සන (original sign) තබා ඇති බැවින් එය පිළිගත හැකි බවයි.

ඒ අනුව මුල් පිටපත්වල අත්සන් හා මුද්‍රා ඇති ලංසුකරුට ඇගයීම් වලින් පසු නිසි පරිදි ප්‍රසම්පාදන පිරිනමා ඇත. අනු පිටපත් කට්ටලය සහිත පාර්සලය පරීක්ෂා කිරීම සඳහා ඔබ වෙත අවශ්‍ය වන්නේ නම් ඒ අයුරින්ම ඉදිරිපත් කිරීමට හැකි බවත් කරුණාවෙන් දැනුම් දෙමි.

5. <u>පරිගනක උපාංග මිලට ගැනීම</u>

i. ඔබගේ නිරීක්ෂණ අනුව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ වූ දිනය සැප්තැම්බර් 04 බව පෙන්වා දී තිබුනි. එහෙත් එය නිවැරදි නොවන අතර එය ආරම්භ වූයේ පහත පරිදි වේ.

අදාල පරිගනක අයිතම ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් මූලික වශයෙන් ආරම්භ කරනු ලැබුවේ ලිපිගොනුවෙහි සටහන් අනුව 2017 අප්‍රේල් මස 07 වන දිනදීය. ඉන් අනතුරුව තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා ලැබීමෙන් අනතුරුව අදාල පරිදි අනෙක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුවිය.

ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇති දිනය 2017 නොවැම්බර් 16 වන දින නිවැරදි වන අතර ප්‍රසම්පාදන සැලැස්ම අනුව පමාවට හේතු වී ඇත්තේ TEC සහ ප්‍රසම්පාදන කමිටුවල පරික්ෂණයන්ට ලක් වී වාර්තා ලැබීමට කාලයක් ගත වීම නිසාය.

ii. මෙම විගණන විමසීම යටතේ පහත තොරතුරු ඉදිරිපත් කරමි.
අදාල පරිසනක අයිතම ඉල්ලුම් කරන කාලයේ දී තිබූ වෙළඳපොල වටිනාකම මිල ගණන් කැඳවන අවස්ථාවේ දී වෙළඳපොල අගය වෙනස් වී තිබීම හේතුවෙන් සියළුම අංග මිළදී ගැනීමට වෙන්කරන ලද මුදල් ප්‍රමාණවත් නොවිණි.

iii. මෙම පරිසනක 06 මිලදී ගැනීමට කටයුතු කරනු ලැබුවේ නව බඳවා ගැනීම් යටතේ කළමනාකරණ සහකාර තනතුරු සඳහාය. එම බඳවා ගැනීම 2018 ජනවාරි මස අවසන් කිරිමට තීරණය කර තිබූ අතර ඔවුන් වෙත රාජකාරි පැවරීම සඳහා මෙම පරිගනක යන්ත්‍ර මිලදී ගැනීම අත්‍යවශ්‍ය විය. 2018 වසරේ පළාත් පාලන ආයතන මැතිවරණය පැවැත්වීම හේතුවෙන් කළමනාකරණ සහායක වරුන් බඳවා ගැනීම 2018 මාර්තු 05 දින දක්වා කල්ගත කිරීමට සිදුවිය. තවද 2017 ප්‍රතිපාදන තුළින් මෙම මිළදී ගැනීම් කිරීමට ද සැලසුම් කර තිබිණ.

6. <u>ප්‍රසම්පාදන සැලැස්මේ පිරිවිතරයන්ට අනුකූල නොවීම</u>

ඉහත කරුණ යටතේ අදාල නිරීක්ෂණ හා අදහස් පහත පරිදි වේ.

<u>I -03 Gamma Spectroscopy System</u>

ඉහත භාණ්ඩයේ ඇස්තමේන්තු ගත මුදල ලක්ෂ 15,000,000/= වුවද මිළ ගණන් කැඳවීමේදී ගිවිසගත් මුදල රු. 8,857,000/- ක් දක්වා අඩු වී ඇත.

ඒ සම්බන්ධ අදාල සැපයුම්කරුගෙන් පිරිවිතර සම්බන්ධව විමසීමේ දී ඊට අදාල කරුණු දැක්වූ අතර එහිදී සැපයුම්කරු පවසන ලද්දේ මෙම භාණ්ඩයෙහි වටිනාකම ඉතා අධික බවත් නිෂ්පාදිත රට සමග සැපයුම්කරු විශාල ගණුදෙනු කරන ආයතනයක් බැවින් වැඩි වට්ටමක් ලැබී ඇති බව පවසන ලදී. තවද දෙවන අඩුම සැපයුම්කරුගේ මිළ ගණන රු. 13,300,000/- ට ඉදිරිපත් කර ඇත.

ඉහත අඩු වීම මෙම දෙවන සැපයුම්කරුගේ වටිනාකමින් ද තහවුරු වේ. එබැවින් ඇස්තමේන්තු පිරිවැය හා සත්‍ය පිරිවැය අතර වෙනස දක්නට ඇත්තේ ඉහත කරුණු පදනම්වය. තවද මෙම මණ්ඩලය සඳහා වැට් අගය නිදහස් කර ඇත.

G-01 Computer

ඔබගේ විගණන නිරීක්ෂණය අනුව ඉහත පරිගණක මිලදී ගැනීමේදී ඇස්තමේන්තුගත මුදල රු. 630,000/- වන අතර ගිවිසගත් නිවැරදි මුදල වන්නේ රු. 645,000/- පමණක් බවත් කරුණාවෙන් දන්වා සිටිමි. (PO No. 0316 හා 0317). ඒ අනුව ඔබ විසින් සඳහන් කල රු. 843,102/- ක මුදල නිවැරදි නොවේ.

එයට හේතුව වන්නේ DPC (Minor) අනුමැතිය මත MS Office Software Package සහ Ani-Virus Software සඳහා වන රු. 227,817.30 (වැට් සහිතව) මුදල, ප්‍රතිපාදන නොමැති බැවින් ඉහත අයිතම දෙක මිළදී ගැනීමක් සිදු නොවිණි. ඒ අනුව වැය වූ මුදල රු. 645,500/- පමණි.

ස්තුතියි.

මෙයට,



වෛද්‍ය සමන් හේවමාන
සභාපති
**ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව**

ඇමුණුම (05)

| Unannounced Inspection Plan -2018 | | | | |
|---|---|---|---|---|
| **Month** | **File Number** | **Name of the Institute** | **District** | **Last Inspection date** |
| May | NE/07/A/MR-01 | New CRN Channeling Center,Haton | Nuwara Eliya | 24-Jan-2017 |
| | NE/06/A/MR-01 | District Base Hospital,Rikillagaskada | Nuwara Eliya | 26-Jan-2017 |
| | KY/05/A/MR-01 | Kandy Nursing Homes (Pvt.) Ltd,Kandy | Kandy | 13-Mar-2014 |
| | KY/26/A/MR-01 | Channel Consultation Center (Pvt.) Ltd,Kandy | Kandy | 26-Apr-2016 |
| | CO/73/A/MR-1 & MR-02-A | Pannipitiya Nursing Home, Pannipitiya | Colombo | 29-Dec-2010 |
| | CO/65/A/MR-01 & MR-02-A | Blue Cross Medical Center (Pvt.) Ltd,Rajagiriya | Colombo | 28-Jun-2012 |
| June | CO/121/A/MR-01 | Park Hospital (Pvt.) Ltd,Colombo 05 | Colombo | 22-Oct-2013 |
| | CO/64/A/MR-01 & MR-02-A | Royal Hospital (Pvt.) Ltd,Comobo 06 | Colombo | 29-Dec-2010 |
| | CO/48/A/MR-01/ & MR-02- A | Police Hospital, Colombo 05 | Colombo | 07-May-2013 |
| July | JF/18/A/MR-01 | Green Memorial Hospital,Manipay | Jaffna | 03-Jan-2017 |
| | JF/17/A/MR-01 | Ruhbins Hospital, Jaffna | Jaffna | 03-Jan-2017 |
| August | MG/05/A/MR-01 | Uva (Pvt.) Hospital,Wellawaya | Monaragala | 07-Mar-2017 |
| | MG/07/A/MR-01 | Base Hospital,Wellawaya | Monaragala | 22-Jul-2016 |
| | BD/02/A/MR-01 | Central Hospital, Badulla | Badulla | 17-Nov-2017 |
| | CO/81/A/MR-01 & MR-02-A | Santa Dora (Pvt.) Ltd, Battaramulla | Colombo | 22-Oct-2013 |
| September | RT/15/A/MR-01 | Rathnapura Hospital & Laboratories (Pvt.) Ltd, Rathnapura | Rathnapura | 18-Mar-2016 |
| | KG/03/A/MR-01 | Fonseka Dispensary,Warakapola | Kegalle | 23-Feb-2017 |
| | CO/79/A/MR-01 | Channelway Medical Center,Homagama | Colombo | 23-Sep-2002 |
| October | KL/14/A/MR-01 | Wadduwa Clinic, Wadduwa | Kaluthara | 18-May-2016 |
| | KL/16/A/MR-01 | Medi Health,Mathugama | Kaluthara | 18-May-2016 |
| | CO/66/A/MR-01 & MR-02-A | Piliyandala Health Services (Pvt.) Ltd, Piliyandala | Colombo | 21-Jan-2013 |
| November | GL/12/A/MR-01 | Base Hospital,Udugama | Galle | 19-May-2016 |
| December | MT/14/A/MR-01 | Matara District Co-op Hospital, Matara | Matara | 13-Oct-2017 |
| | CO/28/A/MR-01 & MR-02-A | Wickramaarachchi, Medical Center,Wellampitiya | Colombo | 29-Jan-2013 |
| | CO/69/A/MR-01 | Medi House (Pvt.) Ltd,Colombo 10 | Colombo | 28-July 2009 |
| | CO/68/A/MR-01 | Medilab Lanka (Pvt.) Ltd, Colombo 10 | Colombo | 21-Apr 2009 |